ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,151- 2019 නොවැම්බර් මස 22 වැනි සිකුරාදා - 2019.11.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව
තනතුරු- ඇබෑර්තු	—
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—
බඩුබාහිරාදිය විකිණීම්	—
පළාත් පාලන නිවේදන	2936
අතුරු ව්‍යවස්ථා	—
පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ..	—
ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන	2945
අයවැය ලේඛන	—
දේපළ විකිණීම්	—
විවිධ දැන්වීම්	2948

සැ. යු. - (i) ශ්‍රී ලංකා මනෝවිද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2019 නොවැම්බර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) (සංශෝධන) පනත් කෙටුම්පත 2019 නොවැම්බර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 දෙසැම්බර් මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 නොවැම්බර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2935 - B 81581 — 5,403 (201911)

පළාත් පාලන නිවේදන

මහනුවර මහා නගර සභාව

වාර්ෂික වරිපනම් බදු පැනවීම

252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 230 වගන්තිය ප්‍රකාර, මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියලුම දේපල සඳහා වාර්ෂික වටිනාකම මත පහත සඳහන් ප්‍රතිශතයට අනුව වරිපනම් බදු 2020 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. ගෘහස්ත දේපල සඳහා වාර්ෂික වටිනාකමින් 11%
2. ගෘහස්ත නොවන දේපල සඳහා වාර්ෂික වටිනාකමින් 17%
   (වාණිජ දේපල, ඉඩම්, පුරන් වූ කුඹුරු, තනාගෙන යන ගොඩනැගිලි)
3. අස්වද්දන ලද කුඹුරු වරිපනම් බදුවලින් නිදහස් කර ඇත.

2020 වර්ෂය නියමිත මුළු වරිපනම් බදු මුදල 2020.01.31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවන්නේ නම් 10% ක වට්ටමක් ද, කාර්තුවට අදාළ බදු මුදල් එකී කාර්තුවේ මුල් මාසය තුළ ගෙවන්නේ නම් 5% ක වට්ටමක්ද දෙනු ලැබේ.

තවද 2020 වර්ෂයේ වරිපනම් බදු මුදල කාර්තු 04 (හතර) සඳහා සමාන වාරික හතරකින් (04) පිළිවෙලන් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනයන්හි දී හෝ ඊට පෙර ගෙවිය යුතු අතර, එසේ නියමිත දිනට වරිපනම් බදු මුදල් නොගෙවන සියලුම දේපල සඳහා මහා නගර සභා ආඥාපනතේ 252 අධිකාරය ප්‍රකාර ගෘහස්ත දේපලක් සඳහා 15% ක වරෙන්තු ගාස්තුවක් ද, ගෘහස්ත නොවන දේපලක් සඳහා 20% වරෙන්තු ගාස්තුවක් ද අය කරනු ලබන බව වැඩිදුරටත්නිවේදනය කරනු ලැබේ.

(කේසර ඩී. සේනානායක,
නගරාධිපති,
මහනුවර මහා නගර සභාව.

2019 නොවැම්බර් මස 01 වැනි දින,
මහනුවර නාගරික කාර්යාලයේ දීය.

11-1349/1

මහනුවර මහා නගර සභාව

2020 වර්ෂයේ තක්සේරු ලේඛන

2020 වර්ෂය සඳහා වූ තක්සේරු ලේඛන දැනට සූදානම්ව ඇති බවත් ලේඛන කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයේ දී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත් 252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 235(1) වැනි වගන්තිය ප්‍රකාර, මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

(කේසර ඩී. සේනානායක,
නගරාධිපති,
මහනුවර මහා නගර සභාව.

2019 නොවැම්බර් මස 01 වැනි දින,
මහනුවර නාගරික කාර්යාලයේ දීය.

11-1349/2

පාලින්දනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (අ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 111 වන කොටසේ 21(1) වගන්තිය අනුව මංමාවත් හා මාර්ග සම්බන්ධතා පිළිබඳ පොදු අධිකාරිය ප්‍රාදේශීය සභාව වන බැවින් ද 21(2) වගන්තිය අනුව මංමාවත්වලට අනුකූලව ක්‍රියාවේ යෙදවීමේ හා ඉටු කිරීමේ හිමිකම සභාව සතු බැවින්ද 23 වගන්තිය අනුව සියළු මංමාවත් සභාව සතු වී ඇතැයි සළකනු ලබන බැවින් ද 24(1) වගන්තිය අනුව පහත සඳහන් මාර්ගය පාලින්දනුවර ප්‍රාදේශීය සභාව විසින් 2019.09.03 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ (ඉ) 22 යෝජනාව ඒකමතිකව සම්මත වී ඇති බව මෙයින් නිවේදනය කරමි.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර, ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත පාලින්දනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

උපලේඛනය

අනු. අංකය	*පාරේ නම*	*ආරම්භය*	*අවසානය*	*දිග මීටර්*	*පළල මීටර්*
01	වෙරළගහවත්ත මාර්ගය	පැලැඳ ප්‍රධාන මාර්ගයේ සිට මිල්ලගහවත්ත පිට කට්ටිය මහගලදෙණිය පිටකට්ටියේ ගොඩැල්ල සිට	පොල්ගස්ගොඩැල්ල ඉඩමේ ආරම්භය දක්වා	140	04

(

ධම්මික රණසිංහ,
ලේකම්,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 20 වැනි දින,
පාලින්දනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-1573

මාතලේ මහා නගර සභාව

අයවැය කෙටුම්පත 2020

අංක 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 212(අ) වගන්තිය ප්‍රකාර, මාතලේ මහා නගර සභාවේ 2020 වර්ෂය සඳහා වන අයවැය කෙටුම්පත 2019 නොවැම්බර් 08 වන දයින් ඇරඹී දින හත (07) ක් ගතවන තුරු මාතලේ මහා නගර සභා කාර්යාලයේ මහජන පරීක්ෂණය සඳහා විවෘතව තබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

(

ඩී. එන්. අලුවිහාරේ.
නගරාධිපති,
මහා නගර සභාව.
මාතලේ

2019 ඔක්තෝබර් මස 30 වැනි දින,
මාතලේ මහා නගර සභා කාර්යාලයේ දීය.

11-1474

ජා- ඇල ප්‍රාදේශීය සභාව

බස්නහිර පළාත් සභාවේ නීතිය හා සාමය මුදල් හා සැලසුම්, අධ්‍යාපන, නිවාස හා ඉදිකිරීම්, රැකීරක්ෂා, පළාත් පරිපාලන හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍ය විසින් 2007 අංක 01 දරන බස්නාහිර පළාත් සභාවේ අපද්‍රව්‍ය කළමනාකරන ප්‍රඥප්තියේ 20(1) වගන්තිය අනුව සාදනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍ර* අංක 1560/6 දරන 2008.07.30 දිනැති *විශේෂ ගැසට් පත්‍රයේ* බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන බස්නාහිර පළාතේ නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීති 01 පරිච්ඡේදය සිට 07 වන පරිච්ඡේදය දක්වා එහි 01 උපලේඛනයේ සිට 09 වන උපලේඛනය දක්වා ඒ අයුරින්ම වැළඳ ගැනීමටත්, ක්‍රියාත්මක කිරීමටත් 2019.10.29 දින පැවති මහා සභා රැස්වීමේ දී සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

චන්ද්‍රපාල මදුරප්පෙරුම,
සභාපති,
ජාඇල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
කඳාන,
ජාඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-1291

බියගම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ඇ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්ති ප්‍රකාරව, බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් කර ඇති මංමාවත් බියගම ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රාදේශීය සභාව විසින් මැනුම් කර සළකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන යම් පාර්ශ්වයන් විසින් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය පළ වූ දින සිට මාස තුනක් ඇතුලත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්ති ප්‍රකාරව, ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ විරෝධතාවයක් ඉදිරිපත් නොවුණහොත් පහත සඳහන් මංමාවත් බියගම ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජී. ඒ. ඒ. සී. ගනේපොළ
සභාපති,
බියගම ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 21 වැනි දින,
බියගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

අනු. අංකය	*මාර්ගයේ නම*	*පිඹුරුපත් අංකය*	*ග්‍රාම සේවා වසම*	*මාර්ගයේ ආරම්භය*	*මාර්ගයේ අවසානය*	*මාර්ගයේ දිග (කි. මී.)*	*මාර්ගයේ පළල (අඩි)*
01	කඩවත එක්සත් සුභසාධක මාවත	2599F	268 පහල බියන්විල (මධ්‍යම)	නුවර පාර	පුෂ්පාරාම පාර	0.512	අඩි 15-20 අතර
02	කඩවත රජවත්ත පාර, සමගි මාවත	2599J	268 පහල බියන්විල (නැගෙනහිර)	පිංතාලිය පාර	මහවෙල පාර	0.395	අඩි 10
03	කඩවත ආසිරි පෙදෙස	2599H	268 A පහල බියන්විල (බටහිර)	නුවර පාර	මල්වත්ත පාර	0.595	අඩි 8-15 අතර

අනු. අංකය	*මාර්ගයේ නම*	*පිඹුරුපත් අංකය*	*ග්‍රාම සේවා වසම*	*මාර්ගයේ ආරම්භය*	*මාර්ගයේ අවසානය*	*මාර්ගයේ දිග (කි. මී.)*	*මාර්ගයේ පළල (අඩි)*
04	කඩවත මහවෙල පාර	2589K	268 පහල බියන්විල (නැගෙනහිර)	පුෂ්පාරාම පාර	වෙල්යාය	0.430	අඩි 10-14 අතර
05	කඩවත මහවෙල පාර (2 පටුමග)	2589J	268B පහල බියන්විල (බටහිර)	මහවෙල පාර	වෙල්යාය	0.360	අඩි 10-12 අතර
06	කඩවත මහවෙල පාර (1 පටුමග)	2589G	268 පහල බියන්විල (බටහිර)	පුෂ්පාරාම පාර	අංක 241/5A නිවස	0.800	අඩි 12
07	කඩවත මල්වත්ත පාර	2589F	268B පහල බියන්විල (මධ්‍යම)	නුවර පාර	මාර්ගයක්	0.710	අඩි 10-12 අතර
08	කඩවත මල්වත්ත පාරේ සිට පුෂ්පාරාම පාර	2589E	268 පහල බියන්විල (මධ්‍යම)	මල්වත්ත පාර	පුෂ්පාරාම පාර	0.425	අඩි 10-14 දක්වා
09	කඩවත ජයසිරි මාවත	2589D	268B පහල බියන්විල (මධ්‍යම)	පිංතාලිය පාර	පිංතාලිය පාර	0.510	අඩි 12
10	කඩවත හල්ගස්දෙනිය පාර	2589C	268 පහල බියන්විල (නැගෙනහිර)	පිංතාලිය පාර	මංකඩ පාර	0.450	අඩි 12-13 අතර
11	බියගම මල්වත්ත පාර	2599D	280 සී බියගම දකුණ	නුවර පාර	පොදු සුසාන භූමිය	0.315	අඩි 15-20 අතර
12	බියගම මැණික්ආගාර වෙල්යාය පාර	2599C	280 සී බියගම දකුණ	බොරළුවල පාර	වෙල්යාය	0.154	අඩි 12
13	බියගම බොරළුවල පාර	2599B	280 සී බියගම දකුණ	කොළඹහේන පාර	කුඹුරු යාය	0.730	අඩි 15-20 අතර
14	බියගම කොළඹහේන පාර	2599A	280 සී බියගම දකුණ	කඩවත නුවර ප්‍රධාන මාර්ගය	මැණික්ආගාර වෙල්යාය පාර	0.726	අඩි 30 පමණ

11-1354

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීම

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක ඉ (01) 15 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස ,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2019.08.27 වන දින අංක ඉ(01) 04 තීරණය යටතේ පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් සභා සම්මත කර පිළිගනු ලැබූ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කර 1988 අගෝස්තු 23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වැනි කොටස පළාත් පාලන *ගැසට් පත්‍රයේ* පළ කර ප්‍රසිද්ධ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව අප්‍රසන්න හා අන්තරාදයක වෙළඳාම අතුරු ව්‍යවස්ථාවේ 1 වන වගන්තියට අනුව පහත උපලේඛනයේ සඳහන් වෙළඳාම්, ව්‍යාපාර, කර්මාන්ත, අප්‍රසන්න හා අන්තරාදයක වෙළඳම් වශයෙන් යෝජනා කරමි.

උපලේඛනය

අප්‍රසන්න (පීඩාකාරී) ව්‍යාපාර :

අනු අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ හෝ වෙළඳාමේ ස්වභාවය*
1	පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීම
2	පොහොර හෝ රසායනික පොහොර ගබඩා කිරීම
3	පොහොර හෝ රසායනික පොහොර විකිණීම
4	පශු ගිලන්හල්
5	සම්පදම් කිරීම
6	සම් විකිණීම
7	ගවයන් ඇති කිරීම (සතුන් 05ට අඩු)
8	ඌරන් ඇති කිරීම (සතුන් 05ට අඩු)
9	එළුවන් ඇති කිරීම (සතුන් 05ට අඩු)
10	කුකුළන් ඇති කිරීම (සතුන් 05ට අඩු)
11	ශීතකළ මස් හෝ මාළු ගබඩා කිරීම
12	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග ආහාරද්‍රව්‍ය ගබඩා කිරීම
13	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
14	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ අයිස් දැමීම
15	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිෂ්පාදනය කිරීම
16	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු ගබඩා කිරීම
17	දුම්කොල වියළීම
18	සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීම
19	සත්ත්ව ආහාර ගබඩා කිරීම
20	සත්ත්ව ආහාර විකිණීම
21	පුන්නක්කු නිෂ්පාදනය කිරීම
22	පුන්නක්කු කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
23	සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම
24	සබන් නිෂ්පාදනය කිරීම
25	සත්ව ඇටකටු ඇඹරීම හා ගබඩා කිරීම
26	ට්‍රන්ක් පෙට්ටි නිෂ්පාදනය කිරීම
27	අලුත් ලෝහ ගබඩා කිරීම හා විකිණීම
28	පරණ යකඩ මිලට ගැනීම, ගබඩා කිරීම හා විකිණීම
29	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය මිලට ගැනීම, ගබඩා කිරීම හා විකිණීම
30	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම
31	වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීම
32	යාන්ත්‍රික වඩු මඩු
33	යාන්ත්‍රික නොවන වඩුමඩු
34	සිරප් හෝ පළතුරු බීම වර්ග නිෂ්පාදනය කිරීම
35	රසකැවිලි නිෂ්පාදනය කිරීම
36	පොල්ලෙලි පෙඟවීම හෝ පල් කිරීම
37	බුරුසු වර්ග නිෂ්පාදනය කිරීම (දත් බුරුසු හැර)
38	දත් බුරුසු නිෂ්පාදනය කිරීම
39	රා එකතු කිරීම, ගබඩා කිරීම හා විකිණීම
40	විනාකිරි නිෂ්පාදනය කිරීම
41	යන්ත්‍රානුසාරයෙන් නොවන දැව ඉරීම
42	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් නිෂ්පාදනය කිරීම
43	පින්තාරු තින්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම්ලීටර් 1000ට වැඩියෙන් ගබඩා කිරීම
44	සෝඩා නිෂ්පාදනය කිරීම
45	කෙඳි සායම් කිරීම
46	සම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම
47	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම
48	මිරිස්, කහ, කුළු බඩු හා කෝපි වර්ග ඇඹරීම
49	ධාන්‍ය වර්ග ඇඹරීම

50 බේකින් පවුඩර් නිෂ්පාදනය කිරීම
51 ගෑස් මැන්ටල් නිෂ්පාදනය කිරීම
52 පොටි නිෂ්පාදනය කිරීම
53 ඉටිපන්දම් නිෂ්පාදනය කිරීම
54 කපුරු නිෂ්පාදනය කිරීම
55 ලියන තීන්ත , අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිෂ්පාදනය කිරීම
56 රෙදි සෝදා නිල් නිෂ්පාදනය කිරීම
57 ලාකඩ නිෂ්පාදනය කිරීම
58 සුවඳ විලවුන් නිෂ්පාදනය කිරීම
59 පාසල් රටහුණු නිෂ්පාදනය කිරීම
60 ටයර් ටියුබ් නිෂ්පාදනය කිරීම
61 ටයර් නැවත පිරවීම
62 ටයර් ටියුබ් වොල්කනයිසින් කිරීම
63 පාවිච්චි කළ ටයර් සහ ටියුබ් ගබඩා කිරීම
64 සිමෙන්ති නිෂ්පාදනය කිරීම
65 සිමෙන්ති කිලෝග්‍රෑම් 1000ට වැඩියෙන් ගබඩා කිරීම"
66 සිමෙන්ති ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කිරීම
67 ඇස්බැස්ටෝස් තහඩු නිෂ්පාදනය කිරීම
68 වැලි කඩදාසි නිෂ්පාදනය කිරීම
69 ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීම
70 ගඩොල් පෝරණු
71 බලවේග යන්ත්‍ර පේෂ කර්මාන්ත ශාලා
72 අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ශාලා
73 අත් වැසුම් හා කන් වැසුම් නිෂ්පාදනය කිරීම
74 වූල් ඇඳුම් නිෂ්පාදනය කිරීම
75 රෙදි පිළි බතික් කිරීම
76 සේවකයින් හා මැෂින් 10ට වැඩි ඇඟලුම් කර්මාන්ත ශාලා
77 පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම
78 යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීම
79 ධාන්‍ය හෝ මාංස භෝග කිලෝග්‍රෑම් 250ට වැඩියෙන් ගබඩා කිරීම
80 බිස්කට් නිෂ්පාදනය කිරීම
81 කේක් වර්ග නිෂ්පාදනය කිරීම
82 කිරිහල්
83 සිසිල් බීම හා පළතුරු බීම විකිණීම
84 කොළ කෑඳ හා ඔසු පැන් විකිණීම
85 බේකරි නිෂ්පාදන විකිණීම
86 රසකැවිලි නිෂ්පාදනය කිරීම
87 රසකැවිලි විකිණීම
88 අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීම
89 අයිස් පැකට් නිෂ්පාදනය කිරීම
90 බදින ලද කඩල මුරුක්කු වර්ග ඇසුරුම් කිරීම
91 බදින ලද කඩල මුරුක්කු වර්ග විකිණීම
92 කිරි ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනය කිරීම
93 කිරි ආශ්‍රිත නිෂ්පාදන විකිණීම
94 පළතුරු ආශ්‍රිත නිෂ්පාදන විකිණීම
95 පළතුරු ආශ්‍රිත නිෂ්පාදන විකිණීම
96 සෝයා ආශ්‍රිත ආහාර පාන නිෂ්පාදනය කර විකිණීම
97 ජෑම්, කෝඩියල්, චට්නි, විලි පේස්ට් වර්ග නිෂ්පාදනය කිරීම
98 වියලි ආහාර වර්ග ඇසුරුම් කිරීම
99 බිත්තර විකිණීම
100 ශීතකළ කුකුල් මස් විකිණීම
101 ශීතකළ කළ එළුමස් විකිණීම
102 ශීතකළ මාළු විකිණීම

103 සකස් කර ඇසුරුම් කළ ශීතකළ කුකුල් මස් විකිණීම
104 සකස් කර ඇසුරුම් කළ ආනයනය කරන ලද ශීත කළ මස් විකිණීම
105 සකස් කර ඇසුරුම් කළ ශීත කළ මාළු විකිණීම
106 කරවල හාල් මැස්සන්, උම්බලකඩ ඇසුරුම් කිරීම
107 කරවල හා හාල්මැස්සන් උම්බලකඩ විකිණීම
108 මිරිස් , කහ හා තුනපහ කුඩු ඇසුරුම් කිරීම
109 මිරිස්, කහ හා තුනපහ කුඩු විකිණීම
110 පිටි වර්ග හා ධාන්‍ය වර්ග ඇසුරුම් කිරීම
111 දියලුණු ඇසුරුම් කිරීම
112 තේ කුඩු කිලෝග්‍රෑම් 100ට වැඩියෙන් ගබඩා කිරීම
113 තේ කුඩු පැකට් කිරීම
114 තේ කුඩු විකිණීම
115 අර්තාපල් හා ඵෑණු කිලෝග්‍රෑම් 1000ට වැඩියෙන් ගබඩාකිරීම
116 පානීය ජලය බෝතල් කිරීම හා බෙදා හැරීම
117 උත්සව සඳහා ආහාර පාන සැපයීම
118 බුලත් පුවක් දුම්කොල විකිණීම
119 දුම්කොල තොග විකිණීම
120 දුම්කොල සැකසීම
121 සිගරට් නිෂ්පාදනය කිරීම හා සැකසීම
122 බීඩි නිෂ්පාදනය කිරීම
123 පාවහන් නිෂ්පාදනය කිරීම
124 පාවහන් අලුත්වැඩියා කිරීම
125 සම්භාණ්ඩ නිෂ්පාදනය කිරීම
126 සම්භාණ්ඩ අලුත්වැඩියා කිරීම
127 බෑග් හා ගමන්මලු නිෂ්පාදනය කිරීම
128 බෑග් හා ගමන් මලු අලුත්වැඩියා කිරිම
129 ඇසුරුම් මලුවර්ග නිෂ්පාදනය කිරීම
130 මුද්‍රණාල
131 භාණ්ඩ වල මුද්‍රණ කටයුතු කිරීම
132 මනාලියන් හැඩගැන්වීම හා රූපලාවන්‍ය කටයුතු කිරීම

අන්තරාදයක ව්‍යාපාර :

1 කළුගල් කැනීම හෝ කැඩීම
2 සිසිල් බිම නිෂ්පාදනය කිරීම
3 අයිස් නිෂ්පාදනය කිරීම
4 එලවළු තෙල් නිෂ්පාදනය කිරීම
5 පොල්තෙල් නිෂ්පාදනය කිරීම
6 පොල්තෙල් ලීටර් 100ට වැඩියෙන් ගබඩා කිරීම
7 පොල්තෙල් විකිණීම
8 ගිනිපෙට්ටි නිෂ්පාදනය කිරීම
9 මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම
10 තේ පෙට්ටි නිෂ්පාදනය කිරීම
11 එළවළු පෙට්ටි නිෂ්පාදනය කිරීම
12 කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය කිරීම
13 කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම
14 පිදුරු ගබඩා කිරීම
15 පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම
16 රන් භාණ්ඩ නිෂ්පාදනය කිරීම
17 රිදී භාණ්ඩ නිෂ්පාදනය කිරීම
18 රන් හා රිදී භාණ්ඩ අලුත්වැඩියා කිරීම
19 යන්ත්‍රානුසාරයෙන් දැව ඉරීම
20 හුණු ගල් කැනීම හෝ කැඩීම
21 යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල්

22 කම්මල්
23 පරණ බෝතල් හිස් ගෝනි මිලයට ගැනීම හා විකිණීම
24 පාපැදි අලුත්වැඩියා කිරීම
25 මෝටර් වාහන විසිරි පින්තාරු (ස්ප්‍රේ පේන්ට්) කිරීම
26 ලෝහ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ආයුධ යන්ත්‍රෝපකරණ උපකරණ නිෂ්පාදනය කිරීම
27 පිත්තල භාණ්ඩ නිෂ්පාදනය කිරීම
28 පිත්තල භාණ්ඩ පොලිෂ් කිරීම
29 වීදුරු ගබඩා කිරීම විකිණීම
30 කෘෂි රසායනික ද්‍රව්‍ය ගබඩා කර විකිණීම
31 අම්ලකර වායුව සහිත සිලින්ඩර ගබඩා කර විකිණීම
32 එල් පී වායුව සහිත සිලින්ඩර ගබඩා කර විකිණීම

අප්‍රසන්න (පීඩාකාරී) හා අන්තරාදයක ව්‍යාපාර :

1 තලාතු මිනිරන් සුද්ද කිරීම
2 රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් සකස් කිරීම
3 ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම
4 රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම
5 රෙදිපිළි බතික් කිරීම
6 විද්‍යුත් ලෝහ ආලේප කිරීම (යාන්ත්‍රික)
7 විද්‍යුත් ලෝහ ආලේප කිරීම (යාන්ත්‍රික නොවන)
8 තෙල් හෝ සත්ත්ව මේද පැසවීම
9 හුණුගල් පිලිස්සීම
10 ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු නිෂ්පාදනය කිරීම හා ගබඩා කිරීම
11 ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු විකිණීම
12 මෝරතෙල් සකස් කිරීම
13 රථවාහන බැටරි අලුත්වැඩියා කිරීම හා විද්‍යුත් ආරෝපනය කිරීම
14 ලෝහ පෑස්සීම
15 මෝටර් වාහන අලුත්වැඩියා කිරීම
16 මෝටර් වාහන සේවා කිරීම
17 ඩීසල් පොම්ප අලුත්වැඩියා කිරීම
18 ත්‍රීරෝද රථ අලුත්වැඩියා කිරීම
19 යතුරුපැදි අලුත්වැඩියා කිරීම
20 පාපැදි අලුත්වැඩියා කිරීම
21 ත්‍රීරෝද රථ සේවා කිරීම
22 යතුරුපැදි සේවා කිරීම
23 දුනු වැඩපල
24 සයිලන්සර් අලුත්වැඩියා කිරීම
25 මෝටර් වාහන ටින්කර් කිරීම
26 වාත්තු වැඩ
27 බෙලෙක් වැඩපල
28 ලොරි බොඩි ගැසීම හෝ ලොරි බොඩි තැබීම
29 විෂබීජ නාශක හා පිරිසිදු කාරක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
30 මදුරු දැඟර නිෂ්පාදනය කිරීම
31 දැව ආරක්ෂක නිෂ්පාදනය කිරීම
32 ගල්තාර හෝ බිටුන්මය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
33 වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීම
34 වීදුරු කැඩපත් නිෂ්පාදනය කිරීම
35 යකඩ තහඩු ගැල්වනයිස් කිරීම
36 පාස්සන ඊයම් නිෂ්පාදනය කිරීම
37 ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම
38 කටුකම්බි නිෂ්පාදනය කිරීම
39 කම්බි ඇණ නිෂ්පාදනය කිරීම
40 කාබන්, කඩදැසි හෝ කාබන් ලියන පටි නිෂ්පාදනය කිරීම

41 බෙලෙක් බදුන්, වානේ පීප්ප නිෂ්පාදනය කිරීම
42 ජී අයි බාල්දි නිෂ්පාදනය කිරීම
43 ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර නිෂ්පාදනය කිරීම
44 ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම
45 ක්ලච් ප්ලේට් හා බ්රේක් ලයිනර් නිෂ්පාදනය කිරීම
46 ක්ලච් ප්ලේට් හා බ්රේක් ලයිනර් අලුත්වැඩියා කිරීම
47 යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය කිරීම
48 විදුලි භාණ්ඩ
49 රබර් මිශ්‍ර කෙඳි නිෂ්පාදනය කිරීම
50 සංචායන බැටරි නිෂ්පාදනය කිරීම
51 මෝටර් වාහන එකලස් කිරීම
52 ට්‍රැක්ටර් රථ එකලස් කිරීම
53 රේඩියේටර් නිෂ්පාදනය කිරීම
54 රේඩියේටර් අලුත්වැඩියා කිරීම
55 ඉලෙක්ට්‍රෝනික් උපකරණ නිෂ්පාදනය කිරීම
56 ඉලෙක්ට්‍රෝනික් උපකරණ අලුත්වැඩියා කිරීම
57 වියළී කෝෂ (බැටරි)නිෂ්පාදනය කිරීම
58 අම්ල (ඇසිඩ්) වර්ග නිෂ්පාදනය කිරීම
59 අම්ල(ඇසිඩ්) වර්ග ගබඩා කර විකිණීම
60 අත්වැල් හා රෝල දොරවල් නිෂ්පාදනය කිරීම
61 ඛනිජ තෙල් ගබඩා කර විකිණීම
62 ලිහිසි තෙල් විකිණීම
63 රථවාහන ඇතුළත පිරිසිදු කිරීම හා වාහන කාපට් පිරිසිදු කිරීම
64 ෆයිබර් වැඩපල
65 ලෝහ ලියවන පට්ටල
66 විදුලි කාර්මික වැඩපල
67 ගෘහ විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම
68 රූපවාහිනී හා ගුවන් විදුලි යන්ත්‍ර අලුත් වැඩියා කිරීම
69 විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම

11-1408

වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව

උතුරු පළාත් ප්‍රාදේශීය සභා සඳහා වන අතුරු සම්මත ව්‍යවස්ථා පිළිගැනීම

1952 වර්ෂයේ අංක 06 දරන පළාත් පාලන අධිකාරියේ (අතුරු සම්මත ව්‍යවස්ථා) පනත

1989 වර්ෂයේ අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය සමග කියවිය යුතු 1952 වර්ෂයේ අංක 06 දරන පළාත් පාලන ආයතන (අතුරු සම්මත ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත හිමි බලතල අනුව උතුරු පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් සකස් කරනු ලැබූ අංක 2092/6 හා 2018.10.08 දින දරන *ගැසට් පත්‍රයේ* (අතිවිශෙෂ) ප්‍රකාශයට පත් කරන ලද උතුරු පළාතේ ප්‍රාදේශීය සභා සඳහා වන අතුරු ව්‍යවස්ථා කෙටුම් පතේ 07 වන පරිච්ඡේදයේ සිට 09 පරිච්ඡේදය දක්වා වන අතුරු සම්මත ව්‍යවස්ථා වවුනියා දිස්ත්‍රික්කයේ පිහිටා ඇති වවුනියාව දකුණු සිංහල ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ *ගැසට් පත්‍රයේ* පළ කරන දිනයේ සිට ක්‍රියාත්මක කරන බව 2019.10.24 වැනි දින මාසික සැසි වාරයේ දී අංක vssps/2019/10/11/165 දරන තීරණය අනුව සම්මත කර ඇති බව මෙයින් දන්වනු ලැබේ.

එස්. එම්. කසුන් ත්‍යාග ශ්‍රී බණ්ඩාර අලගල්ල,
සභාපති,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව.

11-1728

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

2019 අංක 1 දරන පරිපූරක අයවැය ලේඛනය

මහ නගරසභා ආඥාපනතේ (252 වැනි අධිකාරිය)

214(2) (ආ) ඡේදය යටතේ කෙරෙන දැන්වීමයි

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ 2019 වර්ෂයේ අංක 1 දරන පරිපූරක අයවැය ලේඛනය මහජන ප්‍රදර්ශනය සඳහා කාර්යාල වේලාවන් තුළ 2019 නොවැම්බර් මස 22 දින සිට මහ නගර සභා කාර්යාලයේ තබා ඇති බව මෙයින් දැනුම් දෙමි.

නීතිඥ ඕ. වී. මධුර විතානගේ,
නගරාධිපති,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2019 නොවැම්බර් මස 22 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.
රාජගිරිය.

11-1693

මාවනැල්ල ප්‍රාදේශීය සභාව

භාණ්ඩ වෙන්දේසි කිරීම

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ වරිපනම් බදු නොගෙවීම නිසා තහනම් කළ පහත දක්වා ඇති භාණ්ඩ 2019.11.28 දින පෙ. ව. 9.00ට කාර්යාල භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කරනු ලැබේ.

වෙන්දේසි කරනු ලබන භාණ්ඩ :
කොස් ලීයෙන් නිමවන ලද උළුවහු 01 (6' x 3')

ලේකම්,
ප්‍රාදේශීය සභාව, මාවනැල්ල.

11-1619

ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

මුල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

නාරම්මල ප්‍රාදේශීය සභාව

1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 විධි විධානවලට අනුකූල වන පරිදි පහත උපලේඛනවල සඳහන් නාරම්මල ප්‍රාදේශීය සභාවේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය 2018.12.31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. සුමනසිරි,
සභාපති,
ප්‍රාදේශීය සභාව, නාරම්මල.

2019 නොවැම්බර් මස 01 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභාවේදී ය.

නාරම්මල ප්‍රාදේශීය සභාව

2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය

	සටහන්	*2018.12.31*	*2017.12.31*
මෙහෙයුම් ආදායම			
රජයේ දායකය වැටුප් ප්‍රතිපූර්ණ	01	47,364,282.73	49,973,210.90
රජයේ දායකය - ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ආධාර			2,008,064.39
ආදායම	02	71,196,900.58	57,333,870.32
මූල්‍ය මෙහෙයුම් ආදායම		118,561,183.31	109,315,145.22
මෙහෙයුම් වියදම්			
පුනරාවර්තන වියදම්	03	93,414,664.94	74,424,873.78
මුළු මෙහෙයුම් වියදම්		93,414,664.94	74,424,873.78
වර්ෂය සඳහා මෙහෙයුම් අතිරික්තය - ඌනතාවය		25,146,518.37	34,890,271.54
ප්‍රාග්ධන ලැබීම්	04	4,285,361.99	4,977,016.97
ප්‍රාග්ධන වියදම්	05	29,166,852.07	17,258,467.88
වර්ෂය සඳහා අතිරික්තය ඌනතාවය		265,028.29	22,608,820.63

නාරම්මල ප්‍රාදේශීය සභාව

2018 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන්	2018.12.31	2017.12.31
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	06	268,223,651.40	267,175,816.95
ජංගම වත්කම්			
තොගය	07	1,852,462.57	1,966,689.79
ලැබිය යුතු දෑ	08	36,017,552.98	32,807,915.78
සේවක ණය අත්තිකාරම්	09	16,151,426.36	11,476,436.07
ආයෝජන	10	35,414,032.68	25,392,413.28
මුදල් හා මුදල් සමාන දෑ	11	43,922,045.63	16,207,572.74
මුළු වත්කම්		401,581,171.62	355,026,844.61
හිමිකම්	12	354,767,420.87	308,278,610.44
ජංගම නොවන වගකීම්	13	16,694,423.62	20,108,886.26
ජංගම වගකීම්	14	30, 119,327.13	26,639,347.91
මුළු හිමිකම් හා වගකීම්		401,581,172.62	355,026,844.61

නාරම්මල ප්‍රාදේශීය සභාව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2017.12.31
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය	
සාමාන්‍ය මෙහෙයුම්වලින් ලද අතිරික්තය/	25,146,518.37
මුදල් නොවන වෙනස් වීම් සඳහා ගැලපුම්	
ක්ෂය වීම් කපා හැරීම	
පෙර වර්ෂය සඳහා ගැලපුම්	—
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය	45,175,947.69
ඌනතාවය	46,318,025.35
කාරක ප්‍රාග්ධන සංචලනයන්	
තොග/ණය ගැතියෝ/වෙනත් ලැබීම්/(වැඩිවීම)/අඩුවීම	17,792,019.67
ණය හිමියන්/ගෙවිය යුතු දෑ (අඩුවීම)/ වැඩිවීම	3,479,979.22
මෙහෙයුම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය	56,010,425.61
පාරිතෝෂික ගෙවීම්	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	56,010,425.61
ආයෝජන ක්‍රියාකාරම්වලින් ජනිත මුදල් ප්‍රවාහය	
දේපළ මිලදී ගැනීම්	0.00
ප්‍රාග්ධන වියදම්	29,166,852.07
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	29,166,852.07
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහය	
ප්‍රාග්ධන ලැබීම්	4,285,361.99
දේශීය ණය සංවර්ධන අරමුදල	3,414,462.64
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	870,899.35
වර්ෂය තුළ ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	27,714,472.89
2018.01.01 මුදල් හා මුදල් සමාන දෑ	16,207,572.74
2018.12.31 මුදල් හා මුදල් සමාන දෑ	43,922,045.63
(සටහන් 01)	
ලංකා බැංකුව ජංගම ගිණුම - ගිණුම් අංක 0071664601 (පොදු)	40,847,819.00
ලංකා බැංකුව ජංගම ගිණුම - ගිණුම් අංක 0071677671 (කාර්මාන්ත)	1,784,120.14
ලංකා බැංකුව ජංගම ගිණුම - ගිණුම් අංක 0071677609 (සේවක ණය)	597,869.05
ලංකා බැංකුව ජංගම ගිණුම - ගිණුම් අංක 0071268729 (කුට්ටිගල්)	692,237.44
	43,922,045.63

විවිධ දැන්වීම්

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු පැනවීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇත්තා වූ නිවාස, ගොඩනැගිලි, ඉඩම් සහ ගෙපත් සඳහා 2020 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම සම්බන්ධයෙන් 2019.08.26 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 5.13(1) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යූ. කේ. සුමිත් උඩුකුඹුර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2019 අගෝස්තු මස 26 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇත්තාවූ ප්‍රදේශ තුළ පිහිටියා වූ සියලුම නිවාසවල, ගොඩනැගිලිවල ඉඩම්වල,ගෙපත්වල 2019 වර්ෂයට පිළිගෙන ක්‍රියාත්මක කරනු ලැබූ, 2015 වර්ෂයේ තක්සේරු කරන ලද හා ඉන් පසුව 2016, 2017 සහ 2018,2019 වර්ෂවලදී අඛණ්ඩව සිදුකරන ලද නව තක්සේරුවද, ඇතුළත්ව මුළු තක්සේරු වාර්ෂික වටිනාකම 2020 වර්ෂයට පිළි ගැනීමටත්,

(ආ) එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් 2.5% ක වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවටත්,

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත වරිපනම් බද්ද 2020 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු 4 තුළදී සමාන වාරික 4 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙසටද,

(ඈ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (6) වන උපවගන්තියේ බලතල ප්‍රකාරව එසේ නියම කරන ලද වරිපනම් බද්ද 2020 වර්ෂයේ ජනවාරි 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, පහත උපලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියේ 3 වන, තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බද්ද සහ අරමුදලට ගෙවන්නේ නම් එක් එක් කාර්තුවට අදාළ මුදලින් 5% වට්ටමක් ද, සභාව විසින් ලබාදිය යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*		*5% ක වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	ජනවාරි 01	- ජනවාරි 31 දක්වා	ජනවාරි 31ට පෙර
දෙවන කාර්තුව	අප්‍රේල් 01	- අප්‍රේල් 30 දක්වා	අප්‍රේල් 30ට පෙර
තුන්වන කාර්තුව	ජූලි 01	- ජූලි 31 දක්වා	ජූලි 31 දක්වා
හතරවන කාර්තුව	ඔක්තෝබර් 01	- ඔක්තෝබර් 31 දක්වා	ඔක්තෝබර් 31 ට පෙර

11-1240/1

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

අක්කර බදු පැනවීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදාළව අක්කර බදු පැනවීම 2019.08.26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 5.13(2) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යූ. කේ. සුමිත් උඩුකුඹුර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2019 අගෝස්තු මස 26 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) වන උපවගන්තියෙන් ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූද ස්ථිර හෝ නීතිපතා ගොවිතැන් යටතේ වූද,

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමකම 2019 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යාක්ෂණය 2020 වර්ෂයේ සත්‍යාක්ෂණය ලෙස පිළිගැනීමට ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) උපවගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1687 හා 1989.03.10 දිනැති *ගැසට් පත්‍රය* යටතේ අක්කර බද්ද නියම කිරීම හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශයේ හෙක්ටයාර් 5 ට අඩු නමුත් හෙක්ටයාර් 1 ට නොඅඩු ඉඩමක් සඳහා 2020 වර්ෂය සඳහා රු. 50.00 ක් බැගින් ද,

(ඇ) හෙක්ටයාර් 5 හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මතම 2020 වර්ෂය සඳහා රු. 10.00ක් බැගින් වන වාර්ෂික බද්දක් පනවා අය කළ යුතුයැයි ද,

(ඈ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යටෝක්ත අක්කර බද්ද 2020 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු 4 තුළදී සමාන වාරික 4 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙසට ද,

(ඉ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (6) වන උපවගන්තියේ බලතල ප්‍රකාරව එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද 2020 වර්ෂයේ ජනවාරි 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, පහත උපලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියේ 3 වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බද්ද සභා අරමුදලට ගෙවන්නේ නම් එක් එක් කාර්තුවට අදළ මුදලින් 5% වට්ටමක් ද සභාව විසින් ලබාදිය යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% ක වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	ජනවාරි 01 - ජනවාරි 31 දක්වා	ජනවාරි 31ට පෙර
දෙවන කාර්තුව	අප්‍රේල් 01 - අප්‍රේල් 30 දක්වා	අප්‍රේල් 30ට පෙර
තුන්වන කාර්තුව	ජූලි 01 - ජූලි 31 දක්වා	ජූලි 31 දක්වා
හතරවන කාර්තුව	ඔක්තෝබර් 01 - ඔක්තෝබර් 31 දක්වා	ඔක්තෝබර් 31 ට පෙර

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 149 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම සම්බන්ධව 2019.08.26 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 5.13 (3) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යූ. කේ. සුමිත් උඩුකුඹුර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2019 අගෝස්තු මස 26 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 149 වගන්ති යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2020 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ 11 වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යයිද,

(ආ) තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ගාස්තුව එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2019 වර්ෂයේ ලැබීම්වලින් 1%ක ගාස්තුවක් ලෙස 2020 වර්ෂය සඳහා අයකළ යුතු යැයි යෝජනා කරමි.

ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථාව මගින් පනවා ඇති බලපත්‍ර ගාස්තුව 2020.03.31 වැනි දිනට පෙර ලබා ගත යුතු බව වැඩි දුරටත් සඳහන් කරමි'

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750.00 නොඉක්මවන අවස්ථාවකදී	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක*
අප්‍රසන්න ව්‍යාපාර		*රු. ශත*	*රු. ශත*	*රු. ශත*
01.	මිනිරන් ශුද්ධකිරීම හෝ ගබඩාකිරීම	500 0	750 0	1,000 0
02.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
03.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
04.	සම් විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
05.	සත්ත්ව පාලනය (මස්,කිරි, හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
06.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
07.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබා ගැනීම	500 0	750 0	1,000 0
08.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750.00 නොඉක්මවන අවස්ථාවකදී	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක*
අප්‍රසන්න ව්‍යාපාර		*රු. ශත*	*රු. ශත*	*රු. ශත*
09.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබාගැනීම	500 0	750 0	1,000 0
10.	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
11.	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේළීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
12.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
13.	දුම්කොල වියළීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
15.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
16.	සත්ත්ව මාංශ හා ලේ පැසවීම	500 0	750 0	1,000 0
17.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
18.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	ට්‍රන්ක් පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
20.	අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	ලෝහ සුන්බුන් තබාගැනීම	500 0	750 0	1,000 0
22.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
23.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
24.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
25.	සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
26.	රසකැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
27.	පොල්ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
28.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
29.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
30.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
31.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
32.	දැව ඉරීම	500 0	750 0	1,000 0
33.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
34.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
35.	කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
36.	සම්භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
37.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
38.	කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම	500 0	750 0	1,000 0
39.	බේකින් පවුඩර් නිපදවීම	500 0	750 0	1,000 0
40.	ගෑස් මැන්ටල් නිපදවීම	500 0	750 0	1,000 0
41.	පොටි නිපදවීම	500 0	750 0	1,000 0
42.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
43.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
44.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
45.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
46.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
47.	සුවඳ විලවුන් නිපදවීම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	
		රු. 750.00 නොඉක්මවන අවස්ථාවකදී	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
48.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
49.	ටයර් හෝ ටියුබ් නිපදවීම	500 0	750 0	1,000 0
50.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
51.	ටයර් ටියුබ් වොල්කනයිසින් කිරීම	500 0	750 0	1,000 0
52.	සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
53.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
54.	වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
55.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
56.	ගඩොල් පිලිස්සීම	500 0	750 0	1,000 0
57.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
58.	අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත ඇසිරීම	500 0	750 0	1,000 0
59.	උළු නිපදවීම	500 0	750 0	1,000 0
60.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
61.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0

උපලේඛනය

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	
		රු. 750.00 නොඉක්මවන අවස්ථාවකදී	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
අන්තරාදායක ව්‍යාපාර :				
01.	කළුගල් කැණීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
02.	එළවළු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
03.	පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
04.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
05.	මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
06.	තේ පෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
07.	කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
08.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
09.	පිදුරු තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
11.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	
		රු. 750.00 නොඉක්මවන අවස්ථාවකදී	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
12.	යන්ත්‍රානුසාරයන් ලී ඉරීම	500 0	750 0	1,000 0
13.	හිරිගල් හෝ හුණුගල් කැණීම	500 0	750 0	1,000 0
14.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
15.	හිස් ගෝනි හෝ හිස් බෝතල් තබාගැනීම	500 0	750 0	1,000 0
16.	පාපැදි හෝ යතුරුපැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
17.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	විසිරි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
19.	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤ, ගබඩා කිරීම	500 0	750 0	1,000 0
20.	ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ උපකරණ නිපදවීම)	500 0	750 0	1,000 0
	අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර:			
01.	තලාතු මිනිරන් ශුද්ධ කිරීම	500 0	750 0	1,000 0
02.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස්කිරීම	500 0	750 0	1,000 0
03.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
04.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම	500 0	750 0	1,000 0
05.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
06.	තෙල් හෝ සත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0
07.	හුණුගල් හෝ හිරිගල් පිලිස්සීම	500 0	750 0	1,000 0
08.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤ, නිපදවීම	500 0	750 0	1,000 0
09.	මෝරතෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0
10.	බෝට්ටු තැනීම	500 0	750 0	1,000 0
11.	බැටරි විද්‍යුත් ආරෝපනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
12.	ලෝහ වර්ග පෑස්සීම	500 0	750 0	1,000 0
13.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
14.	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
15.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
16.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	මෝටර් වාහන බොඩි තැනීම	500 0	750 0	1,000 0
19.	කෘමිනාශක, දිලීරනාශක, පැළෑටිනාශක හෝ පළිබෝධනාශක නිපදවීම හෝ නැවත පිරවීම	500 0	750 0	1,000 0
20.	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
21.	මදුරු දඟර නිපදවීම	500 0	750 0	1,000 0
	අප්‍රසන්න හෝ අන්තරාදායක නොවන වෙනත් ව්‍යාපාර :			
01.	ලැගුම් නිවාස	500 0	750 0	1,000 0
02.	හෝටල්	500 0	750 0	1,000 0
03.	බත්කඩ, ආපන ශාලා, තේ/කෝපි	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	
		රු. 750.00 නොඉක්මවන අවස්ථාවකදී	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
04.	බේකරි	500 0	750 0	1,000 0
05.	කිරිපට්ටි හා කිරි වෙළඳාම	500 0	750 0	1,000 0
06.	ආහාර විකිණීම	500 0	750 0	1,000 0
07.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
08.	මස් විකිණීම	500 0	750 0	1,000 0
09.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
10.	අයිස් කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
11.	ඝාතක මඩු	500 0	750 0	1,000 0
12.	සිසිල් බීම කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
13.	කොන්ඩා සැකසීමේ සැලුන් සහ බාබර් සාප්පු	500 0	750 0	1,000 0
14.	පෞද්ගලික වෙළඳපොළවල් හා වෙනත් බලයලත් ස්ථාන	500 0	750 0	1,000 0
15.	සංචාරක වෙළෙන්දෝ			

11-1240/3

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

ව්‍යාපාර බදු පැනවීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම 2019.08.26 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 5.13(4) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යූ. කේ. සුමිත් උඩුකුඹුර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2019 අගෝස්තු මස 26 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2019 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා අයකළ යුතු යැයි 152(1) වගන්තිය (3) උපවගන්තිය ප්‍රකාරව යටෝක්ත බද්ද 2020.03.31 දිනට පෙර ගෙවිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

I වන තීරුව	*II* වන තීරුව
2019 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	රු. ශත
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90.00
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180.00
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360.00
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200.00
රු. 1,50,000 ඉක්මවන විට	3,000.00

11-1240/4

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

කර්මාන්ත බදු පැනවීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම සම්බන්ධයෙන් 2019.08.26 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 5.13(5) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යූ. කේ. සුමිත් උඩුකුඹුර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2019 අගෝස්තු මස 26 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද, (ඇ) 150 වගන්තිය (3) උප වගන්තිය ප්‍රකාරව යථෝක්ත බද්ද 2020.03.31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750.00 නොඉක්මවන අවස්ථාවකදී	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
	කර්මාන්තයේ ස්වභාවය			
01.	වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ නිපදවීමේ සහ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	සෙල්ලම් බඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	වීදුරු භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	
		රු. 750.00 නොඉක්මවන අවස්ථාවකදී	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
05.	රබර් මිශ්‍ර මෙට්ට නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	විකිණීම සඳහා රථවාහන නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	මැටි භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	මැණික් මිලට ගැනීමේ හා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	කිරිහට්ටි නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	කොහු නිෂ්පාදනය	500 0	750 0	1,000 0

11-1240/5

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

වාහන හා සතුන් මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 හා 148 වැනි වගන්ති වල විධිවිධාන ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදාළව වාහන හා සතුන් මත බදු පැනවීම සම්බන්ධයෙන් 2019.08.26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 5.13 (6) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යූ. කේ. සුමිත් උඩුකුඹුර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2019 අගෝස්තු මස 26 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාහන හා සතුන් මත බදු පැනවීම යටතේ පහත I වන තීරුවේ නිරූපිත බද්දක් 2020 වර්ෂය සඳහා අයකළ යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

I තීරුව

		රු. ශත
I.	මෝටර් රථයක්, මෝටර්, ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25.00
II.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකලයක්, කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
	(අ) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18.00
	(ආ) වෙළෙඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4.00

III.	සෑම කරත්තයක් ම සඳහා	20.00
IV.	සෑම අත් කරත්තයක් ම සඳහා	10.00
V.	සෑම රික්ෂෝවක් ම සඳහා	7 50
VI.	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු ම සඳහා	15.00
VII.	සෑම ඇතෙකු සඳහා	50.00

2. විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ, "හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත" සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

3. ඉහත සඳහන් වන "වෙළඳ කාර්ය" යන්න, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

11-1240/6

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

ගාස්තු පැනවීම 2020 වර්ෂය සඳහා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව 2019.08.26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 5.13(7) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යූ. කේ. සුමිත් උඩුකුඹුර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2019 අගෝස්තු මස 26 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

	සේවා වර්ගය	*ගාස්තුව රු. ශත*
01.	දැව ප්‍රවහනය වෙනුවෙන් සේවා නඩත්තු අරමුදල ලෙස එක් ගමන් වාරයක් සඳහා	1,000.00
02.	ගොඩනැගිලි ඉල්ලුම්පත්	250.00
03.	අනුකූලතා සහතික නිකුත් කිරීම	300.00
04.	නළ ළිදක් ලියාපදිංචි කිරීමේ ගාස්තුව	200.00
05.	ගිවිසුම් පිටපත් ගාස්තු	200.00
06.	අනතුරුදායක ගසක් ඉවත් කිරීමේ ඉල්ලුම් පත්‍රය	200.00
07.	ඉඩම් වෙන්දේසි ඉල්ලුම්පත් ගාස්තු	250.00
08.	වැලි ප්‍රවාහනය වෙනුවෙන් මාර්ග නඩත්තු ගාස්තු (මාස 3 ක් සඳහා)	3,000.00
09.	වරිපනම් සංශෝධිත ඉල්ලුම්පත් ගාස්තු	100.00
10.	අයිතිය තහවුරුකර ගැනීමේ සහතික සඳහන් සමීක්ෂණ ගාස්තු	100.00
11.	කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම :	
	I. රු. 100,000 ක් අඩු	1,000.00
	II. රු. 100,000 - 500,000 දක්වා	3,000.00
	රු. 500,000 -1000,000 දක්වා	5,000.00
	රු. 1000,000 ට වැඩි	10,000.00
12.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000.00
13.	I. පා පැදි ස්ටිකර් ගාස්තු	21.00
14.	පිඹුර අනුමත කිරීම	200.00
	I. නාගරික සංවර්ධන අධිකාරියට අයත් බල ප්‍රදේශය තුළ	500.00
15.	විනෝද බඳු ඉල්ලුම්පත්‍ර ගාස්තු	200.00

16.	වීථි රේඛා ඉල්ලුම්පත්‍ර ගාස්තු	600.00
17.	අදාහනාගාර ගාස්තු	
	I. බල ප්‍රදේශයේ	7,500.00
	II. බල ප්‍රදේශයෙන් පිටත	9,000.00
18.	සභා බල ප්‍රදේශය තුළ මස් ප්‍රවාහනය කිරීම (මාස තුනක් සඳහා)	3,000.00
19.	සභාව සතු භූමියක සන්දර්ශන කටයුතු සඳහා යොදා ගැනීම	1,500.00
20.	හිස් ජල බවුසරය	1,059.00
21.	ජලය සහිත ජල බවුසරය	1,359.00
22.	අළෙවි ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා ගාස්තු අයකිරීම (එක් දිනක් සඳහා)	3,000.00
23.	මෝටර් ග්‍රේඩර් සඳහා - පැයකට	4,895.00
	(2020 වර්ෂය සඳහා යන්ත්‍රෝපකරණ අධිකාරියේ මිල අනුව සංශෝධනය වේ)	
24.	J. C. B. යන්ත්‍රය සඳහා පැයකට	3,18300
	(2020 වර්ෂය සඳහා යන්ත්‍රෝපකරණ අධිකාරියේ මිල අනුව සංශෝධනය වේ)	
25.	ගල් තලන යන්ත්‍රය දිනකට	8,600.00
26.	ඉදිකරමින් පවතින හා ඉදිකර අවසන් ග්‍රාමීය ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ දී :	

		නේවාසික	*ව්‍යාපාරික*
1.	අත්තිවාරම් කොටසේ පමණක් වැඩ නිමකර ඇත්නම්	3,000 0	4,000 0
2.	වහල මට්ටම දක්වා හෝ එහි අඩක් නිමකර ඇත්නම්	5,000 0	8,000 0
3.	වහලයේ ඉදි කිරීම් අවසන් කර ඇත්නම්	7,000 0	10,000 0
4.	සැලැස්මේ පරිදි සියලු වැඩ කොටස් අවසන කර ඇත්නම්	9,000 0	12,000 0

11-1240/7

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු පැනවීම - 2020 වර්ෂය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සඳහා 2020 වර්ෂයට පහත සඳහන් ආකාරයට ගාස්තු අය කළ යුතු බව 2019.08.26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 5.13(8) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යූ. කේ. සුමිත් උඩුකුඹුර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2019 අගෝස්තු මස 26 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයේ දී පහත උපලේඛනයේ 1 වන තීරුවේ නිරූපිත බද්දක් 2020 වර්ෂය සඳහා අයකළ යුතු බවටත් යෝජනා කරමි.

දැන්වීම් පුවරු සඳහා අයකිරීම් පහත සඳහන් පරිදි වේ. -

		රු. ශත
01.	බිත්තියක් උපයෝගී කරගෙන කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් සඳහා (අවුරුද්දක් සඳහා - වර්ග අඩියකට)	50.00
02.	ස්ථිර දැන්වීම් පුවරු (මාස 06ක් සඳහා - වර්ග අඩියකට)	50.00
03.	රෙදි හෝ පොලිතින් යොදා ගැනීමෙන් කරනු ලබන තාවකාලික ප්‍රචාරක දැන්වීම් (මාස 06ක් සඳහා - වර්ග අඩියකට)	50.00

11-1240/8

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම - 2020 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව 2019.08.26 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 5.13(9) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යූ. කේ. සුමිත් උඩුකුඹුර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2019 අගෝස්තු මස 26 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ,
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ,
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටත් වී ඇති බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1 - 4ට වඩා අඩු වන්නේ නම්,

එය ඉඩම් සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2020 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් 0.5% ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් යෝජනා කරමි.

11- 1240/9

තණමල්විල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ඇතැම් ව්‍යාපාර බද්ද පැනවීම

තණමල්විල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ යෝජනා අංක (08)O. යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද එකී ව්‍යාපාර බද්ද 2020 මාර්තු 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

වසන්ත ලියනගමගේ,
සභාපති,
තණමල්විල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 17 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
තණමල්විල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147,152 වැනි වගන්තිය සමග කියවිය යුතු (1) වැනි උප වගන්තියේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තිකයෙක් නොවන්නා

වූ කිසියම් ව්‍යාපාරයක් තණමල්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2020 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර තණමල්විල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තණමල්විල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

(1) *වන උපලේඛනය* :

I වන තීරුව	*II වන තීරුව*
බද්ද අදාළ වන වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය :	*ගෙවිය යුතු බද්ද* රු. ශ.
01. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
02. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
03. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
04. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
05. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
06. රු. 1,50,000 ඉක්මන වන විට	3,000 0

(11) *වන උපලේඛනය :*

35.	හඳුන්කුරු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම.	500.00	750.00	1000.00
36.	සබන් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
37.	ඉටිපන්දම් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වා ගෙන යාම	500.00	750.00	1000.00
38.	වී අඹරා සහල් නිපදවීම	500.00	750.00	1000.00
39.	වී /පිටි/මිරිස් තුනපහ/ධාන්‍ය ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
40.	පරණ බෝතල් පත්තර අබලි ද්‍රව්‍ය එක්රැස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.	500.00	750.00	1000.00
41.	ගෑස් අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
42.	ගඩොල් නිපදවීම හා අලෙවිය	500.00	750.00	1000.00
43.	මුද්‍රණාලයක් පවත්වා ගෙනයාම	500.00	750.00	1000.00
44.	ටයර් හා ටියුබ් විකිණීමට ගබඩාකර තැබීම.	500.00	750.00	1000.00
45.	බීඩි නිෂ්පාදනය හා ගබඩාකර තැබීම.	500.00	750.00	1000.00
46.	විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම හෝ නිපදවීම.	500.00	750.00	1000.00
47.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිෂ්පාදනය හා ගබඩාකිරීම.	500.00	750.00	1000.00
48.	ජංගම වෙළෙඳාම.	500.00	750.00	1000.0

12-1355/4

අරණායක ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 24 වැනි දින පවත්වන ලද අරණායක ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් මෙයින් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 05 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරය ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ i වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එකී ii වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව වූ ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තකු එකී ව්‍යාපාර බද්ද 2020 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර අරණායක ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I *වැනි තීරුව*	II *වැනි තීරුව*
බද්ද අදාළවන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු. ශ.*
01. රු. 6,000 නොඉක්මවන විට	නැත
02. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
03. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
04. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
05. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
06. රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12-1355/5

අරණායක ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 24 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී තීරණ අංක 11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව, අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත්වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබාගන්නා සෑම තැනැත්තෙකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබාගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2020 වර්ෂය සඳහාවන මෙම බද්ද අරණායක ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 05 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සමග හතරවැනි උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයේ දී පහත උපලේඛනයේ i වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මතම එකී උපලේඛනයේ ii වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අයකිරීමට අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

		I වන තීරුව	*II වන තීරුව* රු. ශ.
(1)	i.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
	ii.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා-	
		(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
		(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
	iii.	සෑම කරත්තයක් සඳහා	20 0
	iv.	සෑම අත් කරත්තයක් සඳහා	10 0
	v.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
	vi.	සෑම අශ්වයකු, පෝනියෙකු හෝ කොටළුවකු සඳහා	15 0
	vii.	සෑම ඇතෙකු සඳහා	50 0

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12-1355/6

අරණායක ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 24 වැනි දින පවත්වන ලද අරණායක ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක 12 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2020 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 05 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) වන වගන්තිය ප්‍රකාර, අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි කිසියම් ඉඩමක්, ගොඩනැගිලි ඉදිකිරීමට පෙර ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසුවන විටක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම යම් කර්මාන්තයක් සඳහා සංවර්ධනය කළ හැකි විටක එවැනි යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත්කර නොමැති විටක, හෝ

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2020 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් 1%ක උපරිම වාර්ෂික බද්දක් 2020 වර්ෂයේ මාර්තු මස 31 දිනට පෙර අරණායක ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කිරීමටත් එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1)(ආ) යටතේ වන සමානුපාතය වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 1:5 විය යුතු බවටත් අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-1355/7

අරණායක ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 24 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 13 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 05 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා අනුමත කර ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම් දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අරණායක ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියක, ඇළකට, දොළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි වර්ග අඩියට නොඅඩු දැන්වීමක් හෝ ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ ගාස්තු අයකිරීමට අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

		එක් වර්ෂයකට හෝ එක් මාසයකට හෝ ඉන් කොටසකට ගාස්තු රු. ශ.
01.	බිත්තියක, පුවරුවක හෝ ලෑල්ලක ආධාරයෙන් ප්‍රදර්ශනය කර ඇති ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියට	50 0
02.	තාවකාලික ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියට (මාස තුනක කාල පරිච්ඡේදයක් සඳහා)	25 0

12-1355/8

අරණායක ප්‍රාදේශීය සභාව

අප්‍රසන්න, අන්තරාදායක,අන්තරාදායක හා අප්‍රසන්න වෙළෙඳාම් ප්‍රකාශයට පත්කිරීම

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 24 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 14 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1988 අගෝසතු මස 23 වැනි දින අංක 520/7 දරන අති විශේෂ *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති පොදු සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 21 වන අතුරු ව්‍යවස්ථාවේ අන්තර්ගත උපලේඛනයට ඇතුළත්විය යුතු අප්‍රසන්න, අන්තරාදායක,අන්තරාදායක හා අප්‍රසන්න වෙළෙඳාම් පහත උපලේඛනයේ පරිදිවන බව වැඩිදුරටත් මෙයින් නිවේදනය කරමි.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 05 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

අරණායක ප්‍රාදේශීය සභාවේ විශේෂ කොමසාරිස් විසින් 1989/12/01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ඇ) වැනි කොටසේ ප්‍රකාශයට පත්කිරීම මගින් අරණායක ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාව) පනතේ (126 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ තීරණය කර වැළඳගෙන ඇති පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් කටයුතුහාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලදුව 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පලකරනු ලද්දාවූ පොදු අතුරු ව්‍යවස්ථාවල i වැනි හා ii වැනි කොටසේ 1 සිට 42 දක්වා වූ අතුරු ව්‍යවස්ථා අතුරින් 21 වැනි අතුරු ව්‍යවස්ථාවේ අන්තර්ගත උපලේඛනයට අප්‍රසන්න,අන්තරාදායක, අන්තරාදායක සහ අප්‍රසන්න වෙළෙඳාමට අදාළව පහත උපලේඛන යටතේ ඇතුළත් වන්නාවූ වෙළෙඳාම් අදාළ විය යුතු බවට අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

පළමුවන උපලේඛනය

මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තියේ කාර්ය සඳහා අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත ලෙස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

1. මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩාකිරීම.
2. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබාගැනීම.
3. සම් පදම් කිරීම.
4. රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබාගැනීම.
5. රබර් භාණ්ඩ නිෂ්පාදනය.
6. ඔට්ටපාලු ගබඩාකර තබාගැනීම හෝ විකිණීම.
7. පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම.
8. සත්ව ආහාර නිපදවීම.
9. සබන් නිෂ්පාදනය කිරීම.
10. අලුත් ලෝහ හෝ පරණ ලෝහ මිලට ගැනීම හෝ ගබඩාකර තබාගැනීම.
11. ලෝහ සුන්බුන් හා අබලි ද්‍රව්‍ය මිලට ගැනීම හෝ ගබඩාකර තබාගැනීම.
12. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ඔපදැමීම.
13. වේවැල් භාණ්ඩ නිපදවීම.
14. වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
15. පොල් ලෙලි පෙඟවීම.(පල් කිරීම)
16. බුරුසු වර්ග නිපදවීම.(දත් බුරුසු හැර)
17. යන්ත්‍රානුසාරයෙන් දැව ඉරීම.
18. පින්තාරු තීන්ත ,වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම.
19. කෙඳි සායම් කිරීම.
20. සම් භාණ්ඩ නිපදවීම.
21. රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ නැවත ඇසිරීම.
22. ගෑස් මැන්ටල් නිපදවීම.
23. පොටි නිපදවීම.
24. ඉටිපන්දම් නිපදවීම.
25. කපුරු නිපදවීම.
26. ලියන තීන්ත, අච්චු තීන්ත, හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
27. රෙදි සෝදන නිල් නිපදවීම.
28. ලාකඩ නිපදවීම.
29. සුවඳ විලවුන් නිපදවීම.
30. පාසල් රටහුණු නිපදවීම.
31. ටයර් හෝ ටියුබ් නිපදවීම.
32. ටයර් නැවත පිරවීම.
33. ටයර්, ටියුබ් වොල්කනයිසින් කිරීම.
34. සිමෙන්ති ගබඩා කිරීම, ඇස්බැස්ටස් ගබඩාකිරීම.
35. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.
36. වැලි කඩදාසි නිපදවීම.
37. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකිරීම.

38. ගඩොල් පිළිස්සීම හා විකිණීම.
39. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම.
40. උළු නිපදවීම හා විකිණීම.
41. භාවිතයට ගත් ගෝනි , බැරල් හා භාජන පිරිසිදු කර විකිණීම.
42. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම.
43. කුරුඳු, කරඳමුංගු වේලා සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම.
44. ගම් වර්ග නිපදවීම හෝ විකිණීම.
45. විෂබීජ නාශක වර්ග නිෂ්පාදනය හෝ විකිණීම.
46. බැටරි පිරවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
47. පරණ බෝතල් එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
48. අවමංගල සේවාවක් පවත්වාගෙන යාම.
49. ගෘහ භාණ්ඩ නිපදවීම හා ගබඩාකර තබා ගැනීම.
50. මැණික් කැපීම හා ඔප දැමීම.
51. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම.
52. යාන්ත්‍රික බලයෙන් රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
53. පිටි හෝ කුළු බඩු ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
54. සත්ත්ව ආහාර ගබඩා කර තබා ගැනීම හා විකිණීම.
55. ධාන්‍ය වර්ග ගබඩා කර තබා ගැනීම.
56. පොලිතින් හෝ ඒ ආශ්‍රිත නිෂ්පාන කිරීම හෝ විකිණීම.
57. සපත්තු නිෂ්පාදනය හා විකිණීම.
58. ඉටිපන්දම් නිෂ්පාදනය හා විකිණීම.

දෙවන උපලේඛනය

මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තියේ කාර්යය සඳහා අන්තරායදායක ව්‍යාපාර හෝ කර්මාන්ත ලෙස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

01 යාන්ත්‍රික බලයෙන් දැව ඉරීම.
02 කොප්පරා නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
03 යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් හෝ වෙනත් යම් තෙල් වර්ගයක් සිදීම හෝ ගබඩා කර තබා ගැනීම.
04 පුළුන් ගබඩා කර තබා ගැනීම හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සකස් කර විකිණීම.
05 ගිණිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
06 මෙතිලේටඩ් ස්පිරිතු නිෂ්පාදනය.
07 කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය.
08 කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
09 පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම.
10 ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම.
11 යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම.
12 දර විකිණීම.
13 උළු හා ගඩොල් ගබඩා කර තබා ගැනීම හා විකිණීම.
14 ටයර් හා ටියුබ් විකිණීමට ගබඩා කර තබා ගැනීම.
15 දැව ආශ්‍රිත ලෑලි නිෂ්පාදනය සහ දැව කුඩු ආශ්‍රිත නිෂ්පාදන
16 කාඩ් බෝඩ් හා කඩදාසි භාවිතයෙන් කරන නිෂ්පාදන ගබඩා කර තබා ගැනීම හා විකිණීම.
17 ගල් හා පතුරු ගල් ආශ්‍රයෙන් කරන කර්මාන්ත.
18 මැටි හා මැටි ආශ්‍රිත කර්මාන්ත.
19 නිමි ඇඳුම් නිෂ්පාදන ආයතන.
20 රසායන ආශ්‍රිත රෙදි නිෂ්පාදන කර්මාන්ත.
21 රෙදි සේදීම් ස්ථාන.
22 බීඩි නිෂ්පාදනය හා ගබඩා කර තබා ගැනීම.
23 වාහන අළුත් වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
24 වාහනවල බඳ කොටස අළුත්වැඩියා කර තීන්ත ආලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
25 වාහන සේවා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

26 මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
27 පරණ පත්තර හෝ කඩදාසි එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
28 පා පැදි , යතුරු පැදි හා මෝටර් වාහන අළුත්වැඩියා කිරීම.
29. විසිරි පින්තාරු කිරීම.
30. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිෂ්පාදනය හා ගබඩා කිරීම.
31. ලෝහ සංස්කාර්යය කර්මාන්ත යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම.

තුන්වන උපලේඛනය

මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තියේ කාර්ය සඳහා අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත ලෙස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

1. ඩ්‍රයි ක්ලීන් කිරීම හෝ සායම් දැමීම.
2. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් කිරීම හෝ බතික් කිරීම.
3. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම.
4. ශීතකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
5. තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම.
6. හුණු ගල් හෝ හිරිගල් පිළිස්සීම.
7. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම.
8. ෆයිබර් නිෂ්පාදන.
9. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
10. ලෝහ වර්ග පෑස්සවීම.
11. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.
12. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
13. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
14. මෝටර් වාහන බොඩි තැනීම
15. කෘමි නාශක, දිලීර නාශක, පැළෑටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම හෝ නැවත පිරවීම.
16. විෂබීජ නාශක නිපදවීම සහ මදුරු දඟර නිපදවීම.
17. දැව ආරක්ෂණ නිපදවීම.
18. ගල් තාර හා සිමෙන්ති ආශ්‍රිත පූර්ව සැකසුම් මධ්‍යස්ථාන.
19. වීදුරු භාණ්ඩ නිපදවීම හා ගබඩා කිරීම.
20. යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.
21. පාස්සන ඊයම් නිපදවීම.
22. ඇළුමිනියම් භාණ්ඩ නිපදවීම.
23. කටු කම්බි නිපදවීම.
24. කම්බි ඇණ නිපදවීම.
25. කාබන් කඩදාසි හෝ යතුරු ලියන රිබන් නිපදවීම.
26. බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබන් නිපදවීම.
27. ජී.අයි.බාල්දි නිපදවීම.
28. වායු සමන යන්ත්‍ර, ශීතකරණ, අධි ශීතකරණ නිපදවීම හෝ අළුත්වැඩියා කිරීම.
29. බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම හා අළුත්වැඩියා කිරීම.
30. යන්ත්‍රෝපකරණ නිපදවීම.
31. විදුලි භාණ්ඩ නිපදවීම.
32. රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම.
33. සංවායත බැටරි නිපදවීම.
34. මෝටර් රථ වාහන එකලස් කිරීම.
35. රේඩියේටර් නිපදවීම.
36. ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අළුත්වැඩියා කිරීම.
37. වියළි කෝෂ බැටරි නිපදවීම.
38. විදුලි බුබුළු නිෂ්පාදනය සහ අළුත්වැඩියාව

අරණායක ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 15 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 05 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් හා වෙනත් අනපනත්වලින් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සිදුකරනු ලබන මහජන සුබසාධක සේවා හා වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය කරන සේවා සැපයීම සඳහා 2020 වර්ෂය තුළ දී ප්‍රාදේශීය සභා පොදු අරමුදලට අයකර ගත යුතු ගාස්තු පහත උපලේඛනයේ පරිදි විය යුතු බවට විධාන කිරීමට අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

		රු. ශත
1.	වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතිකය	750 0
2.	මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමේ ගාස්තු	1,250 0
3.	අනුකූලතා සහතික නිකුත් කිරීම	1,000 0

4. ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තු :

වර්ග අඩි ප්‍රමාණය		*නේවාසික* *රු. ශත*	*ව්‍යාපාරික* *රු. ශත*
(i)	වර්ග අඩි 750 ට අඩු	1,000 0	1,500 0
(ii)	වර්ග අඩි 751 සිට 1,500 දක්වා	1,400.0	2,000 0
(iii)	වර්ග අඩි 1,501 සිට 2,500 දක්වා	2,000.0	3,000 0
(iv)	වර්ග අඩි 2,501 ට වැඩි	3,000.0	3,500 0

			රු. ශ.
5.	(i)	ගොඩනැගිලි බලපත්‍රයේ බලපත්‍ර කාලය වසරකින් දීර්ඝ කිරීම	1,000 0
	(ii)	අමතර වසරකින් දීර්ඝ කිරීමේ ගාස්තු	100 0

6. ඉදිකර ඇති ගොඩනැගිලිවල සැලසුම් අනුමත කිරීම සඳහා පරීක්ෂණ ගාස්තුවලට අමතර පහත දඩ ගාස්තු අය කෙරේ.

වර්ග අඩි ප්‍රමාණය	*නේවාසික* *රු. ශත*	*වාණිජ* *රු. ශත*
වර්ග අඩි 750 ට අඩු	1,500 0	2,500 0
වර්ග අඩි 751 සිට 1,500 දක්වා	1,750 0	3,000 0
වර්ග අඩි 1,501 සිට 2,500 දක්වා	2,500 0	3,500 0
වර්ග අඩි 2,501 ට වැඩි	4,000 0	6,000 0

7. පරිසර ආරක්ෂණ බලපත්‍ර සඳහා පරීක්ෂණ ගාස්තු :

		රු. ශත
(i)	රු. 2,50,000.00 හෝ ඊට අඩු	3,000 0
(ii)	රු. 2,50,001.00 සිට 5,00,000.00	3,750 0
(iii)	රු. 5,00,001.00 සිට 10,00,000.00	5,000 0
(iv)	රු. 10,00,001.00 ට වැඩි	10,000.0

8. පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු :

(i)	බලපත්‍ර ගාස්තුව	4,000 0
(ii)	මුද්දර ගාස්තු	400 0

9. මාර්ග පළුදු කිරීමේ ගාස්තු :

(i)	කොන්ක්‍රීට් පාර/තාර පාර අඩි - 2 1/2 x 2 1/2 වලක් කැඩීම සඳහා	1,200 0
(ii)	කොන්ක්‍රීට් පාර /තාර පාර හරහා කැඩීම වල සමග	3,000 0
(iii)	පස් පාර/බොරළු පාර - අඩි 2 1/2 x 2 1/2 වලක් කැඩීම සඳහා	1,000 0
(iv)	පස් පාර/බොරළු පාර හරහා - කැඩීම වල සමග	1,500 0
(v)	මාර්ගය දිගට (උරහිස) හැරීම සඳහා මීටරයක් සඳහා	50 0
(vi)	ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අවස්ථාවේ උරහිස කැඩීම සඳහා එම ව්‍යාපෘති වටිනාකමින් 5%ක සුපරීක්ෂණ ගාස්තුවක් අය කෙරේ. මාර්ග පළුදු කිරීමේදී රජය මගින් සිදු කරනු ලබන විශේෂ ජල ව්‍යාපෘතිවලදී මාර්ගය පළුදු කොට නැවත සකස් කිරීමට එකඟතාවයක් ලබාගෙන මහා සභා අනුමැතිය පරිදි කටයුතු කිරීම.	

10. ගලි බවුසරයේ සේවාව ලබා ගැනීම සඳහා :

* බල ප්‍රදේශය තුළ සේවය සඳහා -		*රු. ශත*
(i)	මූලික ගාස්තුව - එක් බවුසරයකට	8,000 0
(ii)	සේවක කුළිය	2,000 0
(iii)	කිලෝමීටර් එකකට ප්‍රවාහන ගාස්තුව	50 0
(iv)	ඊට අමතරව වැඩිවන සෑම බවුසරයක් සඳහා ම	4,000 0 බැගින්
(v)	සේවක කුළිය	1,000 0 බැගින්

* බල ප්‍රදේශයෙන් පිට සේවය සඳහා -

(i)	මූලික ගාස්තුව එක් බවුසරයකට	9,000 0
(ii)	සේවක කුලිය	2,000 0
(iii)	කිලෝමීටර් එකකට ප්‍රවාහන ගාස්තුව	50 0 බැගින්
(iv)	ඊට අමතරව වැඩිවන බවුසරයක් සඳහා	4,500 0 බැගින්
(v)	සේවක කුලිය	1,000 0 බැගින්

11. ආදාහනාගාර සේවය ලබා ගැනීමේ ගාස්තු :

බල ප්‍රදේශය තුළ :

(i)	මෘත දේහ ආදාහන ගාස්තුව	8,000 0

බල ප්‍රදේශයෙන් පිට :

(i)	මෘත දේහ ආදාහන ගාස්තුව	9,000 0

12. ජල බවුසරයේ සේවය ලබා ගැනීම :

බල ප්‍රදේශය තුළ :

(i)	පිරවූ ජල බවුසරයක් ගෙන ගොස් භාරදීමට	3,000 0
(ii)	පිරවූ ජල බවුසරයක් ගෙනගොස් එක් දිනක් තබා ගැනීම සඳහා	3,750 0
(iii)	පිරවූ ජල බවුසරයක් එක් දිනකට වඩා තබා ගන්නේ නම් එක් දිනකට අමතර ගාස්තුව (ඉහත ගාස්තුවලට අමතරව)	500 0

(iv)	කිලෝ මීටරයක් සඳහා ප්‍රවාහන ගාස්තු	50 0

බල ප්‍රදේශයෙන් පිටත :

(i)	පිරවූ ජල බවුසරයක් ගෙන ගොස් භාරදීම සඳහා	4,000 0
(ii)	පිරවූ ජල බවුසරයක් ගෙනගොස් එක් දිනක් තබා ගැනීම සඳහා	4,750 0
(iii)	පිරවූ ජල බවුසරයක් එක් දිනකට වඩා තබා ගන්නේ නම් එක් දිනකට අමතර ගාස්තුව (ඉහත ගාස්තුවලට අමතරව)	500 0
(iv)	කිලෝ මීටරයක් සඳහා ප්‍රවාහන ගාස්තු	50 0

* හදිසි ආපදා අවස්ථාවකදී සහ ආගමික, සංස්කෘතික හා ජාතික වැදගත්කමකින් යුතු උත්සව මෙන්ම රාජ්‍ය උත්සව සඳහා අවශ්‍යතාවය සලකා බලා ජල බවුසර් නොමිලේ ලබාදීමට කටයුතු කෙරේ.

13. ක්‍රීඩාපිටි කුළියට දීමේ ගාස්තු (සාමාන්‍ය කටයුතු) :

	රු. ශත
ක්‍රීඩාපිටිය සඳහා ජලය, විදුලිය සමග දිනකට ගාස්තු	1,500 0
දින එකක් සඳහා ඇප තැන්පතු ගාස්තුව	1,000 0
දින එකකට වඩා වැඩිවන විට ඇප තැන්පතු ගාස්තුව	2,500 0
රණවිරු ක්‍රීඩාංගනය රාත්‍රී වොලිබෝල් තරග සඳහා දිනක අය කිරීම	2,500 0
සංගීත සංදර්ශන හා කානිවල් ක්‍රීඩා පිටි කුළියට ලබා දීමේ දිනකට ගාස්තුව	3,000 0
දින එක සිට දින 03 දක්වා ඇප තැන්පත්	5,000 0
දින තුනකට වැඩිවන විට ඇප තැන්පත් ගාස්තුව	25,000 0

* සංදර්ශන, සංගීත සංදර්ශන ආදී කටයුතු සඳහා විදුලිය අවශ්‍ය වන්නේ නම් දිනකට රුපියල් 1,000 ක ගාස්තුවක් ගෙවිය යුතු ය.

* රාජ්‍ය ආයතන මගින් සිදුකරනු ලබන උත්සව, රාජ්‍ය ක්‍රීඩා උත්සව, නොමිලේ සිදුකරනු ලබන ආගමික උත්සව, රජයේ පාසල් මගින් පවත්වන ක්‍රීඩා උත්සව ගාස්තුවෙන් නිදහස් කර ඇත. එසේ වුව ද ඉහත උත්සව සඳහා ජලය හා විදුලිය අවශ්‍ය වන්නේ නම් දිනකට රුපියල් 250.00 ක මුදලක් අයකළ යුතු ය.

14. *විවිධ අයදුම්පත් ගාස්තු :*

		රු. ශත
(i)	ගොඩනැගිලි අයදුම්පත් ගාස්තුව	250 0
(ii)	හිමිකම් වෙනස් කිරීමේ අයදුම්පත් ගාස්තුව	250 0
(iii)	පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමේ නව කර්මාන්තයන් සඳහා අයදුම්පත් ගාස්තුව	100 0
(iv)	පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත් කිරීමේ අයදුම්පත් ගාස්තුව	50 0
(v)	අනතුරුදායක ගස් ඉවත් කිරීමේ අයදුම්පත් ගාස්තු හා ස්ථාන පරීක්ෂණ ගාස්තු :	
	(අ) කොස් ගස් සඳහා	750 0
	(ආ) අනෙකුත් ගසක් සඳහා	250 0
(vi)	මාර්ග ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ගාස්තුව	250 0
(vii)	ඉඩම් කට්ටි කිරීමේ අයදුම්පත් ගාස්තුව	1,000 0
(viii)	කර්මාන්ත පෝරම ගාස්තුව	750 0
(ix)	පුස්තකාල අයදුම්පත් ගාස්තුව	10 0

	රු. ශත
15. උදෘත ලබා ගැනීමේ ගාස්තු :	
(i) වරිපනම් ලේඛනයේ උදෘතයක් ලබා ගැනීම	300 0
(ii) මාර්ග ලියාපදිංචි *ගැසට් පත්‍රයේ* පිටපතක් ලබා ගැනීම	150 0
(iii) මාර්ග ලියාපදිංචි පිඹුරුපතේ පිටපතක් ලබාගැනීම	500 0
16. හට් එකක් කුළියට දීම - දිනකට	400 0
17. ට්‍රැක්ටර් රථ කුළියට දීම - දිනකට රියදුරු සමග	4,500 0
18. සතිපොළ ගාස්තු :	
(i) ස්ථිර කඩ කාමර	300 0
(ii) තාවකාලික කඩ කාමර	150 0
(iii) සුළු පරිමාණ වෙළෙන්දන්	100 0
19. බැකෝ යන්ත්‍රය කුළියට දීම :	
(i) පැය 02ක් හෝ ඊට අඩු කාලයක් සඳහා කුළිය	6,000 0
(ii) ඊට වැඩිවන සෑම අමතර පැයකට කුළිය	2,800 0
(iii) පැය දෙකකට වැඩි එහෙත් පැය 04ක් හෝ ඊට අඩු කාලයක් සඳහා කුළිය	11,250 0
(iv) ඊට වැඩිවන සෑම අමතර පැයකට කුළිය	2,700 0
20. යූටෝන් ගල් රෝල කුළියට සැපයීම :	
(i) පැය 08කට අඩු කාලයක් සඳහා	7,500 0
(ii) ප්‍රවාහන කුළිය කි. මී. 1ක් සඳහා	100 0
21. කියුබ් තුනේ ලොරි රථය :	
1. දිනකට පැය 08ට ඉන්ධන, කුළී, වැටුප් සමග	14,000 0
2. දිනකට පැය 04ට අඩු කාලයක් සඳහා ඉන්ධන, කුළී, වැටුප් සමග	8,000 0
3. ඊට වැඩිවන අමතර පැයක් සඳහා	1,750 0 බැගින්
22. කොඩි කණු කුළියට සැපයීම :	
(i) එක් කොඩි කණුවක් දිනක් සඳහා	10 0
(ii) අමතර දිනකට	05 0 බැගින්
23. පුස්තකාල සාමාජික ගාස්තු :	25 0
පුස්තකාල අයදුම්පත් ගාස්තු	10 0
24. ටෙන්ඩර් පටිපාටියෙන් තොරව බල ප්‍රදේශයේ සමිති වෙත කොන්ත්‍රාත් ලබා ගැනීම සඳහා ස්වේච්ඡා සමිති ලියාපදිංචි කිරීමේ ගාස්තු (මෙය අවශ්‍යතාවය අනුව සමිති ලියාපදිංචි කරගත හැක.)	2,500 0
25. අලෙවි ප්‍රවර්ධන (වෙළඳ ප්‍රචාරක) කටයුතු සඳහා දිනක ගාස්තුව	1,000 0
26. ත්‍රිරෝදරථ ලියාපදිංචි කිරීමේ ගාස්තු	300 0

* අරණායක ප්‍රාදේශීය සභාවසින් 2020 වර්ෂය සඳහා බදු හා ගාස්තු පැනවීමේ දී සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

රත්නපුර මහා නගර සභාව

2020 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

රත්නපුර මහා නගර සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 06-07 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර රත්නපුර මහා නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ටී. එච්. අත්තනායක,
නගරාධිපති,
රත්නපුර මහා නගර සභාව.

2019 ක් වූ ඔක්තෝබර් මස 14 වැනි දින,
රත්නපුර මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

"252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 (ආ) වැනි වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව රත්නපුර මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තකු එකී කර්මාන්ත බද්ද 2020 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර රත්නපුර මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් රත්නපුර මහා නගර සභාව මෙයින් නියම කරනු ලැබේ."

උපලේඛනය

අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම*	
		රු. 1,500 නොඉක්මවන විට	*රු. 1,500ට වැඩි එහෙත් රු. 2,500 නොඉක්මවන විට*	*රු. 2,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	විදුලි කර්මාන්ත වැඩපළක් හා/හෝ ගුවන් විදුලි යන්ත්‍ර හා/හෝ රූපවාහිණී යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
02.	රන්-රිදී හෝ වෙනත් ලෝහවලින් තනන ලද ආභරණ නිෂ්පාදනය කිරීමේ හෝ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
03.	දර ගබඩාවක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
04.	කම්මලක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
05.	පාපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
06.	මහන මැෂින් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
07.	අතින් ලී ඉරන ඉරුම්හලක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
08.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ටේලර් සාප්පු)	5,000 0	3,000 0	5,000 0

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 1,500 නොඉක්මවන විට	*රු. 1,500ට වැඩි එහෙත් රු. 2,500 නොඉක්මවන විට*	*රු. 2,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
09.	යතුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
10.	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
11.	ඔරලෝසු අළුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
12.	රූපවාහිනී සහ ටෙලෙක්ස් ඇන්ටනා නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
13.	මත්පැන්හලක් පවත්වාගෙන යෑම	2,000 0	3,000 0	5,000 0
14.	ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යෑම	2,000 0	3,000 0	5,000 0
15.	ගෑස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
16.	සිල්ලර කඩයක් පවත්වාගෙන යෑම	2,000 0	3,000 0	5,000 0
17.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම	2,000 0	3,000 0	5,000 0
18.	සිසිල් බීම බෙදා හැරීම හා විකිණීම	2,000 0	3,000 0	5,000 0
19.	බෙහෙත් වර්ග විකිණීම :			
	(i) බටහිර බෙහෙත්	2,000 0	3,000 0	5,000 0
	(ii) ආයුර්වේද බෙහෙත්	2,000 0	3,000 0	5,000 0
20.	කුළුබඩු, එළවළු සුළු පරිමාණයේ වෙළෙඳාම	2,000 0	3,000 0	5,000 0
21.	නිමි ඇඳුම් වෙළෙඳාම	2,000 0	3,000 0	5,000 0
22.	විසිතුරු මසුන් හා සුරතල් සතුන් ප්‍රදර්ශනය හා අලෙවිය	2,000 0	3,000 0	5,000 0
23.	බලවේග යන්ත්‍ර මාර්ගයෙන් නූල් කැටීමේ හා විවීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
24.	සම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
25.	සෙල්ලම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
26.	මෝටර් වාහන සඳහා බෝඩ් සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
27.	කම්බි ඇණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
28.	විදුලි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
29.	ප්ලාස්ටික් දැන්වීම් පුවරු සකස් කිරීමේ හා/හෝ ප්ලාස්ටික් අකුරු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
30.	රබර් මුද්‍රා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
31.	නිවාස අලංකරණ හෝ ගෙවතු අලංකරණ උපකරණ විකිණීම	2,000 0	3,000 0	5,000 0
32.	ත්‍රිරෝද/ යතුරුපැදි අළුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
33.	පරිගණක යන්ත්‍ර මගින් මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
34.	පී.වී.සී. පයිප්ප වර්ගවලින් වතුර පීලි, පයිප්ප වැල්ඩින් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
35.	මනාලියන් හැඩ ගැන්වීම	2,000 0	3,000 0	5,000 0
36.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
37.	බේකරි නිෂ්පාදන අලෙවිය	2,000 0	3,000 0	5,000 0
38.	උඩරට මුල් ඇඳුම් කුළියට දීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0

අනු. අංකය	කර්මාන්තයේ ස්වභාවය	*I වැනි තීරුව*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*	
		රු. 1,500 නොඉක්මවන විට	*රු. 1,500ට වැඩි එහෙත් රු. 2,500 නොඉක්මවන විට*	*රු. 2,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
39.	රසකැවිලි වෙළඳාම	2,000 0	3,000 0	5,000 0
40.	ලී වෙළෙඳසැල	2,000 0	3,000 0	5,000 0
41.	බ්‍රේක් ලයිනර් කල්චිපේට් අළුත්වැඩියාව	2,000 0	3,000 0	5,000 0
42.	ඩීසන් ඉන්ජෙක්ටර් අළුත්වැඩියාව	2,000 0	3,000 0	5,000 0
43.	බ්ලොක් ගල් වෙළඳාම	2,000 0	3,000 0	5,000 0
44.	ගෘහ භාණ්ඩ වෙළඳාම	2,000 0	3,000 0	5,000 0
45.	කරවල වෙළඳාම	2,000 0	3,000 0	5,000 0
46.	වතුර පොම්ප මෝටර් ගබඩාව/අලෙවිය	2,000 0	3,000 0	5,000 0
47.	යාන්ත්‍රික වායුසමන යන්ත්‍ර අළුත්වැඩියා සඳහා ආයතනයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
48.	අවුළුපත් වෙළඳාම	2,000 0	3,000 0	5,000 0
49.	මංගල හා උත්සව අවස්ථාවන් ඡායාරූපකරණය කිරීම	2,000 0	3,000 0	5,000 0
50.	ලිහිසි තෙල් වෙළඳාම	2,000 0	3,000 0	5,000 0
51.	වැලි පොලක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
52.	ත්‍රිරෝද රථ සඳහා ග්‍රීස් ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0

රත්නපුර මහා නගර සභාව

2020 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

රත්නපුර මහා නගර සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 06-07 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර රත්නපුර මහා නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ටී. එච්. අත්තනායක,
නගරාධිපති,
රත්නපුර මහා නගර සභාව.

2019 ඔක්තෝබර් මස 14 වැනි දින,
රත්නපුර මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

"252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 (ඇ) වැනි වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ

247 (ආ) වැනි වගන්තිය යටතේ යම් ව්‍යාපාර බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් රත්නපුර මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට අයත් සෑම තැනැත්තෙක්ම, එකී ව්‍යාපාර බද්ද 2020 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර රත්නපුර මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් රත්නපුර මහා නගර සභාව මෙයින් නියම කරනු ලැබේ.”

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*
	බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද*
		රු. ශත
1.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
2.	රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
3.	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
4.	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
5.	රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
6.	රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

11 - 1299/2

රත්නපුර මහා නගර සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2020 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

රත්නපුර මහා නගර සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 06-07 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ රත්නපුර මහා නගර සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2020 වර්ෂයේ දී රත්නපුර මහා නගර සභාව විසින් නිකුත් කරන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ටී. එච්. අත්තනායක,
නගරාධිපති,
රත්නපුර මහා නගර සභාව.

2019 ඔක්තෝබර් මස 14 වැනි දින,
රත්නපුර මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

රත්නපුර මහා නගර සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ රත්නපුර මහා නගර සභාව විසින් 1999 සැප්තැම්බර් මස 24 වැනි දින ගැසට් පත්‍රයේ පළකර ඇති (වැළඳගෙන ඇති) පොදු සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ රත්නපුර මහා

නගර සභාව විසින් 2020 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 (අ) වැනි වගන්තියෙන් මහ නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට රත්නපුර මහා නගර සභාව තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම (රුපියල්)		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500ට වැඩි එහෙත් රු. 2,500 නොඉක්මවන විට*	*රු. 2,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	පොහොර නිෂ්පාදනය	2,000 0	3,000 0	5,000 0
02.	පොහොර ගබඩා කර තැබීම	2,000 0	3,000 0	5,000 0
03.	කුකුළු මස් වෙළෙඳපොළක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
04.	කළුගල් කැඩීම සහ කබොක් කැපීම	2,000 0	3,000 0	5,000 0
05.	පශු ගිලන් හලක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
06.	රබර් සකස් කිරීම	2,000 0	3,000 0	5,000 0
07.	පුවක් සකස් කිරීම	2,000 0	3,000 0	5,000 0
08.	බැටළුවන් හෝ එළුවන් හෝ ඒ දෙවර්ගයම හෝ සතුන් 5 දෙනෙකුට වඩා ගාල් කොට තැබීම සඳහා වූ ගව මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
09.	උළු, කොන්ක්‍රීට් නිෂ්පාදන හෝ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන (බ්ලොක් ගල් නිෂ්පාදනය)	2,000 0	3,000 0	5,000 0
10.	හුණු ගබඩා කොට තැබීම	2,000 0	3,000 0	5,000 0
11.	පොල්කටු අඟුරු කිලෝ ග්‍රෑම් 100කට වඩා ගබඩා කොට තැබීම	2,000 0	3,000 0	5,000 0
12.	ලුණු දැමූ මාළු කිලෝ ග්‍රෑම් 500කට වඩා ගබඩා කර තැබීම	2,000 0	3,000 0	5,000 0
13.	රබර් ඔට්ටපාළු සුන්බුන් ඇඹරීම හෝ වේලීම	2,000 0	3,000 0	5,000 0
14.	ගම් වර්ග නිෂ්පාදනය	2,000 0	3,000 0	5,000 0
15.	විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම	2,000 0	3,000 0	5,000 0
16.	බැටරි පුරවනු ලබන්නා වූ හෝ බැටරි ගබඩා කොට තබනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම/බැටරි චාර්ජ් කිරීම	2,000 0	3,000 0	5,000 0
17.	ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නා වූ හෝ කට්ට කැපීම කරනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
18.	ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම, ගබඩා කිරීම, විකණීම	2,000 0	3,000 0	5,000 0
19.	පරණ ලෝහ හිස් බෝතල් 100කට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම හා පාවිච්චි කළ කඩදාසි කිලෝග්‍රෑම් 500කට අධික ප්‍රමාණයක් ගබඩාකර තැබීම	2,000 0	3,000 0	5,000 0
20.	කුරුඳු පොතු කිලෝ ග්‍රෑම් 250කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම	2,000 0	3,000 0	5,000 0
21.	මිනී පෙට්ටි සෑදීම ගබඩා කොට තැබීම හෝ අවමංගල්‍ය සේවා පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
22.	ගෘහ භාණ්ඩ සෑදීම, වේවැල් භාණ්ඩ සැදීම හා ගබඩා කිරීම	2,000 0	3,000 0	5,000 0
23.	මැණික් කැපීම හා ඔප දැමීමේ ආයතනයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
24.	බලපත්‍රලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩා කොට තැබීම	2,000 0	3,000 0	5,000 0

	1 වැනි තීරුව	*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම (රුපියල්)		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500ට වැඩි එහෙත් රු. 2,500 නොඉක්මවන විට*	*රු. 2,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
25.	කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කොට තැබීම	2,000 0	3,000 0	5,000 0
26.	යාන්ත්‍රික බලය යොදා ගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
27.	ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
28.	පුන්නක්කු හැර සත්ව ආහාර කිලෝ ග්‍රෑම් 1,000 කට වඩා ගබඩා කර තැබීම	2,000 0	3,000 0	5,000 0
29.	වී මෝලක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
30.	රබර් භාණ්ඩ නිෂ්පාදනය	2,000 0	3,000 0	5,000 0
31.	සුළු අපනයන භෝග අලෙවිය	2,000 0	3,000 0	5,000 0
32.	පොලිතීන්, සෙලියුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය හෝ ගබඩා කර තැබීම	2,000 0	3,000 0	5,000 0
33.	ඇසිඩ් ලීටර් 25කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම	2,000 0	3,000 0	5,000 0
34.	බූට් සපත්තු හෝ පාවහන් නිෂ්පාදනය	2,000 0	3,000 0	5,000 0
35.	ඉටිපන්දම් නිෂ්පාදනය	2,000 0	3,000 0	5,000 0
36.	සිසිල් බීම නිෂ්පාදනය	2,000 0	3,000 0	5,000 0
37.	යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය	2,000 0	3,000 0	5,000 0
38.	තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අත් මෝලක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
39.	ගිනි පෙට්ටි නිෂ්පාදනය	2,000 0	3,000 0	5,000 0
40.	පොල්තෙල් හෝ ෆාම් ඔයිල් ලීටර් 500කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම	2,000 0	3,000 0	5,000 0
41.	උළු 500 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
42.	කබොක් ගල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
43.	තීන්ත හෝ වාර්නිෂ් ලීටර් 250කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම	2,000 0	3,000 0	5,000 0
44.	කොහු නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
45.	ඔක්සිජන් සහ වෑල්ඩින් වැඩ කරනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
46.	මෝටර් වාහන අලුත්වැඩියා කරන ආයතනයක් පවත්වාගෙන යාම (ගරාජයක්)	2,000 0	3,000 0	5,000 0
47.	මෝටර් වාහන සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම/ යතුරු පැදි, ත්‍රී රෝද රථ අනෙකුත් සියලුම වාහන (සර්විස්)	2,000 0	3,000 0	5,000 0
48.	යාන්ත්‍රික බලය යොදා ගනු ලබන්නා වූ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
49.	අතින් හෝ පා පොලුවලින් ක්‍රියා කරවන යන්ත්‍රයක් පාවිච්චි කෙරෙන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
50.	කවර වර්ගයක හෝ තෙල් ලීටර් 54.5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම	2,000 0	3,000 0	5,000 0
51.	තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය හා අලෙවිය	2,000 0	3,000 0	5,000 0
52.	100කට අධික ප්‍රමාණයක් පතොරම් ගබඩා කර තැබීම	2,000 0	3,000 0	5,000 0

1 වැනි තීරුව *II වැනි තීරුව*

ස්ථානයේ වාර්ෂික වටිනාකම (රුපියල්)

අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500ට වැඩි එහෙත් රු. 2,500 නොඉක්මවන විට*	*රු. 2,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
53.	කොහු හෝ පුළුන් මෙට්ට හෝ කුෂන් නිෂ්පාදනය හෝ ගබඩා කර තැබීම	2,000 0	3,000 0	5,000 0
54.	පාවිච්චි කළ කඩදාසි කිලෝ ග්‍රෑම් 500 කට අධික ප්‍රමාණයක් ගබඩා කර තැබීම	2,000 0	3,000 0	5,000 0
55.	ස්ප්‍රේ පේන්ටිං වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
56.	ඩ්‍රයි ක්ලීන් වැඩ කරන ආයතනයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
57.	යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන, ඉලෙක්ට්‍රෝ ප්ලේටින් වැඩ, ක්‍රෝමියම් ආලේප කිරීම, රන් ආලේප කිරීම, රිදී ආලේප කිරීම හෝ තඹ ආලේප කිරීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
58.	යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නාවූද ඉලෙක්ට්‍රෝ ප්ලේටින් වැඩ, කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නාවූ ද ආයතනයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
59.	කිලෝග්‍රෑම් දෙකකට අධික ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරන ද්‍රව්‍ය ගිනිකෙළ භාණ්ඩ ගබඩා කිරීම	2,000 0	3,000 0	5,000 0
60.	බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය	2,000 0	3,000 0	5,000 0
61.	ශීතකරණ අළුත්වැඩියා කිරීම, හෝ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
62.	පුපුරණ ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
63.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම හෝ රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
64.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
65.	ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
66.	හෝටලයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
67.	බත් කඩයක්, ආපන ශාලාවක් සහ තේ සහ කෝපි කඩයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
68.	බේකරියක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
69.	කේක් වර්ග නිෂ්පාදනය	2,000 0	3,000 0	5,000 0
70.	ඉරන ලද ලෑලි යන්ත්‍රානුසාරයෙන් ඔප මට්ටම් කිරීම, කැටයම් කිරීම ඇතුළුව සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
71.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ලී මෝල්ක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
72.	වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
73.	රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
74.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
75.	සිල්ක් හෝ කෘතිම රෙදි විවීමේ හෝ විසිතුරු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
76.	සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
77.	සිරප් හෝ පලතුරු බීම වර්ග සහ සැලඩ් වර්ග සෑදීම හා/හෝ ගබඩාකරන ස්ථානයක් පවත්වාගෙන යාම	1,500 0	3,000 0	3,500 0
78.	රබර් කිරි එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
79.	රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0

	1 වැනි තීරුව	*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම (රුපියල්)		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500ට වැඩි එහෙත් රු. 2,500 නොඉක්මවන විට*	*රු. 2,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
80.	පළතුරු යුෂ හෝ වෙනත් බීම වර්ග නිෂ්පාදනය කර පැකට් කර අයිස් බවට පත්කර විකිණීම හා ගබඩා කර තබා ගැනීම	2,000 0	3,000 0	5,000 0
81.	ප්‍රථමාධාර බෙහෙත් පැකට් කර ගබඩාකර විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
82.	යෝගට් හා මුදවපු මීකිරි නිෂ්පාදනය කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම	2,000 0	2,500 0	3,500 0
83.	හඳුන්කුරු, සුවඳ විලවුන් නිෂ්පාදනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
84.	බිම් මල් වගාකිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
85.	කෘතිම දත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
86.	අත්යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
87.	ෂිට් රබර් සකස් කරන රෝලක් පවත්වාගෙන යාම (අතින් ක්‍රියාකරන)	2,000 0	3,000 0	5,000 0
88.	ඇඟලුම් නිෂ්පාදනය සේවකයින් 25ට වැඩි	2,000 0	3,000 0	5,000 0
89.	අයිස් නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
90.	අයිස් ක්‍රීම් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
91.	සිනමා ශාලාවක් හෝ සමාජශාලාවක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
92.	කුකුළු මස් සකස් කරන හෝ සිල්ලර කඩයක් නොවන්නාවූ කුකුළු මස් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
93.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
94.	ෂිට් රබර් වේලනසුළු පරිමාණයේ දුම්ගෙයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
95.	අලුත් හෝ පාවිච්චි කළ ටියුබ් ගබඩාව	2,000 0	3,000 0	5,000 0
96.	සිමෙන්ති කිලෝ ග්‍රෑම් 50 මිටි 25ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම හෝ විකිණීම	2,000 0	3,000 0	5,000 0
97.	එළවළු හෝ අමු ආහාර වර්ග ගබඩා කිරීම හා තොග සැපයීම	2,000 0	3,000 0	5,000 0
98.	අවුළුපත් නිෂ්පාදනය	2,000 0	3,000 0	5,000 0
99.	පිටි බෙදාහැරීම හා ගබඩාව	2,000 0	3,000 0	5,000 0
100.	එම්බ්‍රොයිඩර් සහ ලේසර් කටින් සේවාව පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
101.	ආහාර පිසීම හා බෙදා හැරීම (කේටරින් සර්විස්)	2,000 0	3,000 0	5,000 0
102.	සයිලන්සර් අළුත්වැඩියාව	2,000 0	3,000 0	5,000 0
103.	එන්ඩින් බෝර් කිරීම හා රීබෝරින් කිරීම	2,000 0	3,000 0	5,000 0
104.	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය	2,000 0	3,000 0	5,000 0
105.	තේ කර්මාන්ත ශාලා	2,000 0	3,000 0	5,000 0
106.	තේකොළ, මිරිස්, තුනපහ, ධාන්‍ය වර්ග, රසකැවිලි, බයිට් වර්ග නිෂ්පාදනය හා පැකට් කර විකිණීම	2,000 0	3,000 0	5,000 0
107.	ඌරු කොටු, අශ්වයන් හා ගවයන් ඇතිකරන ස්ථානයක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
108.	සමාජ ශාලාවක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0
109.	තොග භාණ්ඩ බෙදාහාරිමේ ස්ථානයක්	2,000 0	3,000 0	5,000 0
110.	පානීය ජලය බෝතල් කර බෙදාහැරීමේ ස්ථානයක්	2,000 0	3,000 0	5,000 0
111.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	2,000 0	3,000 0	5,000 0

රත්නපුර මහා නගර සභාව

2020 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

රත්නපුර මහා නගර සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 06-07 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ටී. එච්. අත්තනායක,
නගරාධිපති,
රත්නපුර මහා නගර සභාව.

2019 ඔක්තෝබර් මස 14 වැනි දින,
රත්නපුර මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

267 වන අධිකාරය වන විනෝද බදු ආඥා පනතේ 2 වන වගන්තිය I වැනි උපවගන්තිය යටතේ රත්නපුර මහා නගර සභාව විසින් සභාවේ පරිපාලන බල සීමාව ඇතුළත වූ ප්‍රදේශයන්හි පැවැත්වෙන (ආඥා පනතේ විස්තර කොට ඇති පරිදි වූ) විනෝද කටයුතු සඳහා ඇතුළු වීම පිණිස අයකරනු ලබන ගාස්තුවෙන් 10%ක බද්දක් 2020 වර්ෂය සඳහා අයකිරීමට තීරණය කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ටී. එච්. අත්තනායක,
නගරාධිපති,
රත්නපුර මහා නගර සභාව.

2019 ඔක්තෝබර් මස 14 වැනි දින,
රත්නපුර මහා නගර සභා කාර්යාලයේ දී ය.

11 - 1299/4

රත්නපුර මහා නගර සභාව

ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු නියම කිරීම

රත්නපුර මහා නගර සභා ආඥාපනතේ 247 (ඊ1) යටතේ රත්නපුර මහා නගර සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 06-07 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ටී. එච්. අත්තනායක,
නගරාධිපති,
රත්නපුර මහා නගර සභාව.

2019 ඔක්තෝබර් මස 14 වැනි දින,
රත්නපුර මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

247 ඉ වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව මහා නගර සභාවක පාලන සීමාව තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් බ්‍රෝකර් කෙනෙ විසින් හෝ ඔහුගේ සේවකයෙකු නැතහොත් අනුයෝජිතයෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් ඒ විකිණීමෙන් ලැබුණු මුදලින් සියයට එකකට සමාන බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා හෝ විසින් රත්නපුර මහා නගර සභාවට ගෙවිය යුතු බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

11 - 1299/6

රත්නපුර මහා නගර සභාව

2020 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සහ දෘශ්‍ය පරිසරය සඳහා බදු පැනවීම

රත්නපුර මහා නගර සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 06 (07) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ටී. එච්. අත්තනායක,
නගරාධිපති,
රත්නපුර මහා නගර සභාව.

2019 ඔක්තෝබර් මස 14 වැනි දින,
රත්නපුර මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

252 අධිකාරය වන මහා නගර සභා අඥා පනතේ 247 (ආ) වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1989 ජනවාරි මස 20 වැනි දින අංක 541/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (*ආ*) කොටසේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කර 1999 සැප්තැම්බර් මස 24 වැනි දින *ගැසට් පත්‍රයේ* පළකර වැළඳගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ 90 A II වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ විධිවිධාන ප්‍රකාර, රත්නපුර මහා නගර සභා සීමාව තුළ කිසියම් තැනැත්තෙකු විසින්, යම් වීදියකට, පාරකට, ඇළකට හෝ වැවකට පෙනෙන සේ කිසිම දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම, ඒ සඳහා මහා නගර සභාවේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ මිස කරනු නොලැබිය යුතු ය.

උපලේඛනය

	රු. ශත
01. තාවකාලික ප්‍රචාරක දැන්වීම් බැනර් ප්‍රදර්ශන කිරීම (වර්ග අඩි 01ක් දින 14 ප්‍රදර්ශනය කිරීම)	60 0
02. ස්ථිර දැන්වීම් පුවරු අදාළ ආයතන පරිශ්‍රයේ ප්‍රදර්ශනය කිරීම (වර්ග අඩි 01ක් වර්ෂයක් සඳහා ප්‍රදර්ශනය කිරීම)	150 0
03.ස්ථිර දැන්වීම් පුවරු පොදු ස්ථානවල ප්‍රදර්ශනය කිරීම (වර්ග අඩි 01ක් වර්ෂයක් සඳහා ප්‍රදර්ශනය කිරීම)	250 0
04. ප්‍රතිදීප්ත දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම (වර්ග අඩි 01ක් වර්ෂයක් සඳහා ප්‍රදර්ශනය කිරීම)	350 0
05. (I) පෞද්ගලික පන්ති දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම (වර්ග අඩි 01ක් වර්ෂයක් සඳහා ප්‍රදර්ශනය කිරීම) (II) එම දැන්වීම් පුවරුවේ මුද්‍රිත දැන්වීම අදාළ බදු වර්ෂය අවසන් වීමට පෙර දැන්වීමේ ස්වරූපය වෙනස් කරන්නේ නම් නැවත වරක් ව. අ. රුපියල් 100.00ක මුදලක් ද ගෙවිය යුතු ය.	350 0

රත්නපුර මහා නගර සභාව

වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

මහා නගර සභා ආඥාපනතේ 245 (1) හතරවන උපලේඛනයේ දක්වෙන්නා වූ වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව මහා නරග සභා ප්‍රදේශය තුළ තබා ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ ද, සියලු වාහන හා සතුන් වෙනුවෙන් ඒ උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණයක වාර්ෂික බද්දක් අයකිරීමට රත්නපුර මහා නගර සභාව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 08 වැනි දින පැවැත් වූ මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 06 (07) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

රථවාහන නවතා තැබීම වෙනුවෙන් :

වාහන වර්ගය	*පළමු පැයට* *රු. ශත*	*අතිරේක පැයට* *රු. ශත*
යතුරු පැදියක් සඳහා	20 0	10 0
ත්‍රිරෝද රථයක් සඳහා	30 0	20 0
කාර්, වෑන්, සැහැල්ලු වාහන	50 0	20 0
බස් රථ ආසන 26ට අඩු	50 0	20 0
බස් රථ ආසන 26ට වැඩි	100 0	25 0
ලොරි රථයක් සඳහා	50 0	20 0
වෙනත් වාහන සඳහා	50 0	20 0

වාහන වර්ගය	*වාර්ෂිකව* *රු .ශත*
ත්‍රිරෝද රථ ගාල් කිරීම සඳහා	1,500 0
වෑන් රථ ගාල් කිරීම සඳහා	3,000 0
ලොරි රථ ගාල් කිරීම සඳහා	3,000 0

ඒ. එම්. ටී. එච්. අත්තනායක,
නගරාධිපති,
රත්නපුර මහා නගර සභාව.

2019 ඔක්තෝබර් මස 14 වැනි දින,
රත්නපුර මහා නගර සභා කාර්යාලයේ දී ය.

11 - 1299/7

රත්නපුර මහා නගර සභාව

සංවර්ධනය නොකළ ඉඩම්වලින් බදු අයකිරීම

247 ඈ (1) වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව මහා නගර සභාවක පලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක්, ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සුදුසු වන විටක හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ, ඒ සභාවේ මතය අනුව යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධන කළ හැකි විටක,

(අ) ඒ ඉඩමෙහි ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

(ආ) ඒ ඉඩමෙන් ගොඩනැගිලවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය යෝජනා සම්මතයක් මගින් සභාව විසින් නියම කරනු ලැබූ නියමිත අනුපාතයට වඩා අඩු නම්, හෝ

(ඇ) ස්ථාවර නැතහොත් නිතිපතා කෙරෙන ගොවිතැනට ඒ ඉඩම යොදවා නැත්නම්, ඒ ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දෙකක (2%) නොඉක්මවන ප්‍රමාණයක බද්දක් ඒ සභාව විසින් ඒ ඉඩමේ අයිතිකරු විෂයෙහි වාර්ෂිකව නියම කළ යුතුය.

(2) (1) වන වගන්තිය යටතේ ඉඩමක භූමියේ ප්‍රාග්ධන අගය තක්සේරු කරන සෑම අවස්ථාවකදී ම, ප්‍රධාන ප්‍රඥප්තියේ 235 වන සහ 236 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම සහිතව, ඊට අදාළ කරනු ලැබිය යුතුය.

එම වගන්තියේ කාර්ය සඳහා "භූමියේ ප්‍රාග්ධන අගය" යන්න යම් ඉඩමක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ ඉඩමේ ඇති ගොඩනැගිලි සියල්ලම අතහැර හා උකස්කර, බදුකර අවහිර හෝ වෙනත් සියල්ලෙන්ම තොරව ඒ ඉඩම පමණක් විවෘත වෙළෙඳ පොළහි දී විකුණනු ලැබුවහොත් ඒ ඉඩම සඳහා ගෙවනු ලැබිය හැකි මිළ ගණන් ඉන් අදහස් වේ.

එකී ඉඩම් සංවර්ධය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2020 වර්ෂය සඳහා ඒ එක් එක් භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් 1%ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර රත්නපුර මහා නගර සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යැයි රත්නපුර මහා නගර සභාව යෝජනා කරන්නීය.

ඒ. එම්. ටී. එච්. අත්තනායක,
නගරාධිපති,
රත්නපුර මහා නගර සභාව.

2019 ඔක්තෝබර් මස 14 වැනි දින,
රත්නපුර මහා නගර සභා කාර්යාලයේ දී ය.

11 - 1299/8

පානදුර ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ 1 වන උපවගන්තිය යටතේ පානදුර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2019 ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

හේමන්ත ප්‍රනාන්දු,
සභාපති,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

2019 ඔක්තෝබර් මස 10 වැනි දින,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පානදුර ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සෑම

කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*		
කර්මාන්තය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. වඩු වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02. ජා කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03. හඳුන්කුරු හෝ සුවඳ කුඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04. රබර් ෂීට් සෑදීමේ හා දුම් ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05. නූල් බෝල/නූල් පන්දු සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06. ලී භාවිතයෙන් තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීමේ හා බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07. සිල්ක් හා කෘත්‍රිම රෙදි වීවීම හා විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08. සෙල්ලම් බඩු නිෂ්පාදනය කිරීමේ හා අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09. රබර් හා කොහු මෙට්‍රස් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10. අභ්‍යාස පොත් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11. ඇළුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. බට පැලැලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. පොලිෂ් වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. යන්ත්‍ර භාවිතයෙන් තොරව කරනු ලබන කුඩා කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. අබලි ප්ලාස්ටික් ද්‍රව්‍ය කුඩු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. වෙළෙඳාම් නාම පුවරු/ප්ලාස්ටික් නාම පුවරු නිෂ්පාදනය හා ප්‍රචාරක ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17. සෙල්ලම් බඩු පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18. අයිස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. මදුරුනාශක දඟර නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20. විදුලි ලාම්පු ආවරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21. පින්තූර රාමු පටි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22. පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23. කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

පානදුර ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2019 ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වන ලද පානදුර ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

හේමන්ත ප්‍රනාන්දු,
සභාපති,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

2019 ඔක්තෝබර් මස 10 වැනි දින,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

යෝජනාව

1.	රු. 6,000 නොඉක්ම වූ අවස්ථාවක	කිසිවක් නැත
2.	රු. 6,000 ඉක්මවන එහෙත් 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
3.	රු. 12,000 ඉක්මවන එහෙත් 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
4.	රු. 18,750 ඉක්මවන එහෙත් 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
5.	රු. 75,000 ඉක්මවන එහෙත් 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
6.	රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

11-1480/4

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05.01.03 V යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තව දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. ජගත් වසන්ත දිසානායක,
සභාපති,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 11 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I තීරුවෙහි නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත යම් කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බව ද,

(ආ) එකී පනතේ 150(3) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 වර්ෂයේ දෙසැම්බර් 31 වන දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථොක්ත බද්ද 2020 අප්‍රේල් මස 01 වැනි දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු යැයි විධානය කිරීමට, සහ

(ඇ) 2020 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධ වූ විට යථොක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස 03 ක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට පල්ලේපොල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නී ය.

කර්මාන්ත බදු

		I වන තීරුව	*II වන තීරුව*	
අනු. අංකය	*කර්මාන්තය*	*රු. 750 දක්වා*	*රු. 750 එහෙත් රු. 1,500 නොඉක්මවූ*	*රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ගඩොල් හෝ උළු ගබඩා කිරීම හෝ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	කළු ගල් ඇඹරීම, විසිතුරු කිරීම හෝ ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	ගල් ස්මාරක නිපදවීම හෝ ගල් උපකරණ නෙලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	ලෝහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	කොන්ක්‍රීට් හෝ මැටි නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	ජ්‍යෝතිෂ කාර්යාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	සම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	කොහු හෝ වෙනත් කෙඳි ආශ්‍රිත නිෂ්පාදන නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	යකඩ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	යන්ත්‍ර භාවිතා කරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ට්‍රන්ක් හෝ සූට්කේස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ගිනි පෙට්ටි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	වීදුරු භාණ්ඩ නිපදවීමේ, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	සායම් වර්ග නිපදවීමේ, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	සෙල්ලම් බඩු නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	සුවඳ විලුවන් හෝ හඳුන් කුරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	විදුලි උපකරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ඇලුමිණියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	විවිධ යන්ත්‍ර උපකරණ නිපදවීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	සිමෙන්ති ගල් නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	පළතුරු බීම වර්ග හෝ සිසිල් බීම වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	සත්ත්ව ආහාර වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	පොල් තෙල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	පපඩම් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	බිරළු ලියවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	ආහාර සඳහා බිම්මල් නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	මෙට්ට නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තය	I වන තීරුව	II වන තීරුව	
		රු. 750 දක්වා	රු. 750 එහෙත් රු. 1,500 නොඉක්මවූ	රු. 1,500 ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
34.	පැළ තවානක් පවත්වාගෙන යාම හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	විවිධ යන්ත්‍ර උපකරණ නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	වාහන ෂීට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	ලී කැටයම් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	ලියුම් කවර සකස් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	සබන් ඉටිපන්දම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	පැන්ට්‍රි කබඩ්, කාඩ්බෝඩ් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	බීඩි හෝ සුරුට්ටු එතීමේ ගබඩා කිරීමේ ස්ථානයක් හෝ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	සංචාරක වෙළඳාම	500 0	750 0	1,000 0
43.	මැණික් ඔප දැමීම හෝ අලෙවිය	500 0	750 0	1,000 0
44.	පාවහන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	පිඟන් බඩු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	ඡායාරූප පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	කැසට් පටි හෝ වීඩියෝ පටි කුලියට දීම පටිගත කිරීම හෝ වෙළඳාම	500 0	750 0	1,000 0
48.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	උත්සව භාණ්ඩ කුලියට දීම	500 0	750 0	1,000 0
50.	සුරතල් සතුන් විකිණීම	500 0	750 0	1,000 0
51.	පිත්තල බඩු නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම් කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම	500 0	750 0	1,000 0
53.	පරණ පුවත්පත් හෝ ලිපි ද්‍රව්‍ය ගබඩා කිරීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
54.	හිස් බෝතල් හෝ ෂොපින්, යකඩ සුන්බුන් එකතු කිරීම හෝ ගබඩා කිරීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
55.	දුරකථන සේවා හෝ ෆැක්ස් සේවා සැපයීම	500 0	750 0	1,000 0
56.	ව්‍යාපාරයක් වශයෙන් සිමෙන්ති ගල් නිපදවීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
57.	මැණික්, වෙනත් වටිනා ඛණිජ ද්‍රව්‍ය වෙළඳාම	500 0	750 0	1,000 0
58.	පොල් පරාල වෙළඳාම	500 0	750 0	1,000 0
59.	පිංතූර රාමු කිරීම	500 0	750 0	1,000 0
60.	ටයර් නිපදවීම	500 0	750 0	1,000 0
61.	මෙට්ට වෙළඳාම	500 0	750 0	1,000 0
62.	කොප්පරා නිෂ්පාදනය සකස් කිරීම හෝ අලෙවිය	500 0	750 0	1,000 0
63.	තීන්ත වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	ලොතරැයි අලෙවි හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	නිමි ඇඳුම් වෙළඳාම	500 0	750 0	1,000 0
66.	යතුරු පැදි හෝ පාපැදි අමතර කොටස් වෙළඳාම	500 0	750 0	1,000 0
67.	මෝටර් රථ වාහන අමතර කොටස් වෙළඳාම	500 0	750 0	1,000 0
68.	ටයර් කට්ට කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
69.	ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
70.	පරිගණක සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
71.	අනුමැතිය ලත් ලී ගබඩා කිරීම /අලෙවිය	500 0	750 0	1,000 0
72.	පරිගණක උපාංග වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
73.	අට පිරිකර භාණ්ඩ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
74.	පොල් ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම හෝ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
75.	හඳුන්කුරු නිෂ්පාදනය හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0

		I වන තීරුව	*II වන තීරුව*	
අනු. අංකය	*කර්මාන්තය*	*රු. 750 දක්වා*	*රු. 750 එහෙත් රු. 1,500 නොඉක්මවූ*	*රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
76.	දුම්කොළ බාම් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77.	ගොඩනැගිලි ද්‍රව්‍ය කුලියට දීම	500 0	750 0	1,000 0
78.	කොහු ඇඹරුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
80.	පොල් ලෙලි වළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
81.	සම් භාණ්ඩ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
82.	ටෙන්ට් රෙදි මැසීමේ, සවි කිරීමේ හෝ කුෂන් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
84.	වාර්නිෂ් ගබඩා කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
85.	විදුලි බලයෙන්, රන්, රිදී, ක්‍රෝමියන් ආලේප කිරීම	500 0	750 0	1,000 0
86.	බැටරි චාර්ජ් කිරීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
87.	රෙදි වීවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
88.	නූල් කටින ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
89.	ලැමිනේටින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
90.	ජුකී මැෂින් පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
91.	රබර් නිළ මුද්‍රා සෑදීම හෝ ප්ලාස්ටික් නාම පුවරු සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
92.	වාහන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
93.	කිරුම් මිණුම් භාණ්ඩ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
94.	අඟුරු ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
95.	සුළු අපනයන භෝග ගබඩා කිරීම, මිලදී ගැනීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
96.	බතික් ප්‍රදර්ශනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
97.	රෙදි සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
98.	සාප්පු බඩු කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
99.	මසා නිමකළ ඇඳුම් වෙළඳාම	500 0	750 0	1,000 0
100.	ඇස් කණ්නාඩි වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
101.	ඔරලෝසු අළුත්වැඩියාව හෝ වෙළඳාම	500 0	750 0	1,000 0
102.	ශීතකරණ හෝ වායු සමීකරණ වෙළඳාම	500 0	750 0	1,000 0
103.	මෝටර් සයිකල් හෝ පාපැදි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
104.	බ්‍රේක් ලයිනර් විකිණීම	500 0	750 0	1,000 0
105.	වෛද්‍ය උපදේශන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
106.	සයිලන්සර් නිපදවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
107.	ජංගම දුරකතන අලෙවි කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
108.	කොප්පරා නිෂ්පාදනය කිරීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
109.	ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ නිපදවීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
110.	පරිගණක අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
111.	කට් පීස් අලෙවි කිරීම	500 0	750 0	1,000 0
112.	ඔරලෝසු අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා අන්තරාදායක හා අප්‍රසන්න වෙළඳ ව්‍යාපාර සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05.01.03 VI යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද අන්තරාදායක හා අප්‍රසන්න වෙළෙඳ ව්‍යාපාර සඳහා බලපත්‍ර ගාස්තු අයකිරීම ඒ වර්ෂයේ මාර්තු මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තව දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. ජගත් වසන්ත දිසානායක,
සභාපති,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 11 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති අතර පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 21 වැනි කාණ්ඩයේ 1 වැනි ඡේදයේ විධිවිධාන ප්‍රකාර පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන වෙළඳ ව්‍යාපාර අන්තරාදායක හා අප්‍රසන්න වෙළඳ ව්‍යාපාර වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත් එකී ව්‍යාපාර වලින් බදු හා බලපත්‍ර ගාස්තු අය කිරීමටත් යෝජනා කරමි.

උපලේඛනය

අන්තරාදයක ව්‍යාපාර :

01. කුඹුක් බොරළු හෝ කළුගල් කැණීම
02. කුඹුක් බොරළු හෝ කළුගල් ගබඩාකිරීම
03. ග්‍රොස් 1 ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩා කර තබා ගැනීම
04. කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
05. ගැළුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල්තෙල් ගබඩා කර තබාගැනීම
06. පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
07. ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම
08. තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
09. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
10. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම
11. කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම
12. ධාන්‍ය හෝ මාංශ භෝග හොන්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
13. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම
14. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ලී ඉරුම් මෝල්ක් පවත්වාගෙන යාම
15. අතින් ලී ඉරන ඉරුම් මෝල්ක් පවත්වාගෙන යාම
16. දැව ගබඩාවක් පවත්වාගෙන යාම
17. දර ගබඩාවක් පවත්වාගෙන යාම
18. හිරිගල් හෝ හුණු ගල් හැරීම
19. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන හෝ නොකෙරෙන කම්හලක් පවත්වාගෙන යාම
20. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොන්ඩර කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම

21. හිස් බෝතල් හා හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම
22. බයිසිකල් හෝ මෝටර් බයිසිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම
23. විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
24. මැසූ ඇඳුම් නිෂ්පාදන
25. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම

II කොටස

අප්‍රසන්න ව්‍යාපාර :

26. මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
27. හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
28. හම් ගබඩා කර තබා ගැනීම
29. කුකුලන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම
30. බැටළුවන් එළුවන් හෝ ඌරන් 10 කට වැඩි ගණනක් සඳහා හෝ ගාලක් පවත්වාගෙන යාම
31. පශු වෛද්‍ය ගිලන්හලක් පවත්වාගෙන යාම
32. පුවත් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
33. තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග ගබඩා කර තබා ගැනීම
34. කරවල, ලුණු මාළු හෝ ජාඩි හොන්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම
35. සිමෙන්ති හොන්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
36. දුම්කොල සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
37. සත්ත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම
38. පුන්නක්කු ටොන් 1 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
39. සබන් නිෂ්පාදනය කිරීම
40. ලෝහමය සුන්බුන් ද්‍රව්‍යය ගබඩා කර තබා ගැනීම
41. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
42. වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
43. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම
44. සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම
45. පොල්ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම
46. රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
47. හුණු ගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම
49. පැණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
49. කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම
50. කෝපි ධාන්‍ය වර්ග මාංශ භෝග කුළුබඩු හෝ පිටි ඇඹරීම
51. යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය වර්ග වල මාංශ භෝග කෙටීම.
52. ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
53. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් භාණ්ඩ නිපදවීම
54. ගල් නිපදවීම, ඇඹරීම හා ඔප දැමීම
55. ශීත කළ මස් මාළු ගබඩා කර තැබීම
56. දියලුණු සුදු (වයිට්) හුණු හෝ හිරිගල් නිපදවීම
57. එනසල් (කරදමුංගු) සකස් කිරීම හෝ වියලීම

III කොටස

අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර :

58. තලාතු මිනිරන් ශුද්ධ කිරීම
59. ඩ්‍රයික්ලීන් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම
60. රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම
61. විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම

62. හුණු පිළිස්සීම හෝ සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණුගල් කැඩීම
63. ගිණිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
64. බැටරි චාජ්කිරීම හෝ අළුත් වැඩියා කිරීම
65. වෑල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
66. මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම
67. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
68. ගල් ස්මාරක නිපදවීම
69. පෙට්‍රල් ඩීසල් තෙල් හෝ වෙනත් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම
70. පෙට්‍රල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
71. කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
72. වීදුරු භාණ්ඩ නිපදවීම
73. වීදුරු කැටපත් නිපදවීම
74. යකඩ තඹ තහඩු ගැල්වනයිස් කිරීම
75. වායු සමනය කළ යන්ත්‍ර ශීතකරණ හෝ අධි ශීතකරණ නිපදවීම සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම
76. රබර් කැවුන කෙඳි වර්ග නිපදවීම
77. ඊයම් බැටරි චාර්ජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
78. විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන්විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වාගෙන යාම
79. පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම

11-1480/6

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

විනෝද බදු ආඥාපනත යටතේ විනෝද බදු පැනවීම 2020

පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05.01.03 VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. ජගත් වසන්ත දිසානායක,
සභාපති,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 11 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(267 අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ පළමුවන උප වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ආඥාපනතේ විස්තර කර ඇති විනෝද කටයුත්තකට ඇතුළත්වන ගෙවීම්වලින් බද්දක් පනවා අය කරනු ලැබේ. මෙහි විධිවිධාන යටතේ 2020 වර්ෂය සඳහා විනෝද බද්දක් 2020.01.01 වැනි දින සිට ක්‍රියාත්මවන පරිදි පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පැවැත්වෙන විනෝද කටයුත්තක් සඳහා මුද්‍රණ ගත ටිකට් පත්වල වටිනාකමින් 10% ක මුදලක් අය කිරීමට පල්ලේපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

11-1480/7

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අය කිරීම

පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05.01.03 VIII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. ජගත් වසන්ත දිසානායක,
සභාපති,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 11 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 154(1) වැනි වගන්තිය යටතේ පල්ලේපොල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේදී හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% හෝ සමාන බද්දක් විකුණුම්කරු හෝ ඔහුගේ සේවාදායකයා හෝ අනුප්‍රාප්තිකයා විසින් එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් පල්ලේපොල ප්‍රාදේශීය සභාවට 2020.01.01 දින සිට ගෙවිය යුතු බව යෝජනා කරයි.

11-1480/8

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම

පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05.01.03 IX යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. ජගත් වසන්ත දිසානායක,
සභාපති,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 11 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් පල්ලේපොල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා 2010.10.05 දිනැති 1955/7 දරන පළාත් පාලන අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ ගරු පළාත් පාලන ඇමතිතුමා විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව දෙවන කොටසේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් හෝ බැනර් ඉදි කිරීමක් හා ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම සඳහා පහත දෙවන උපලේඛනයේ පරිදි ගාස්තු 2020.01.01 දින සිට අය කරන බවට පල්ලේපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01 උපලේඛනය

ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සම්බන්ධ ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :.....

2. ස්ථිර ලිපිනය :.....

3. අයදුම්කරුගේ දුරකථන අංකය :..... විද්‍යුත් තැපෑල :.....

4. දැන්වීම් ප්‍රචාරය කිරීමට අදහස් කරන වෙළඳ ව්‍යාපාරය, උත්සවය, ප්‍රදර්ශනය, සැණකෙළිය, රැස්වීම හෝ වෙළඳ ද්‍රව්‍ය පිළිබඳ විස්තර :.....

5. දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට බලාපොරොත්තුවන ස්ථානය/ස්ථාන :.....

6. අදාළ ආකෘති අමුණා තිබේ ද? :.....

7. ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දැන්වීම් වර්ගය (බැනර්, පුවරු, කටවුට්, බිත්ති, තාප්ප හෝ ස්ථාවර) :.....

8. යම් අයුරකින් තම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලැබීමෙන් පසුව ද, දැන්වීම් දූර්වර්ණ වීම, ඇලවීම, ගැලවීම, බිමට කඩා වැටීමක් සිදුවුවහොත් යථා පරිදි සකස් කිරීමට එකඟ වන්නේ ද යන්න.

ප්‍රාදේශීය සභාවේ පිළිගත් නියමයන්ට එකඟව දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට එකඟවන අතර ඒ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හෝ එහි යම් වගන්තියක් උල්ලංඝනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව ද හොඳාකාරවම මම දනිමි.

.....
අත්සන.

දිනය :.....

02 උපලේඛනය

අනු. අංකය	පුවරුවේ ස්වභාවය	වර්ග මීටර් ප්‍රමාණය	ගාස්තුව රුපියල්		
			මාස 03 කට අඩු	මාස 03 හෝ 06 අතර	වසරක්
			රු.	රු.	රු.
01.	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
02.	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250	350	500
		3 ට වැඩි	3 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහාම රු. 200 බැගින්		
03.	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
04.	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහාම රු. 300 බැගින්		

අනු. අංකය	පුවරුවේ ස්වභාවය	වර්ග මීටර් ප්‍රමාණය	ගාස්තුව රුපියල්		
			මාස 03 කට අඩු	මාස 03 හෝ 06 අතර	වසරක්
			රු.	රු.	රු.
05.	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහාම රු. 200 බැගින්		
06.	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහාම රු. 200 බැගින්		
07.	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750	850	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහාම රු. 500 බැගින්		

11-1480/9

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා දුරකථන කුළුණු ගාස්තු

පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05.01.03 X යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ දුරකථන කුළුණු ගාස්තු ඒ වර්ෂයේ මාර්තු මස 30 වන දිනට පෙර පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තවදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. ජගත් වසන්ත දිසානායක,
සභාපති,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 11 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් පල්ලේපොල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, වෙනත් ව්‍යාපාර මත බදු අය කිරීම යටතේ බලපත්‍ර සඳහාවන උපරිම ගාස්තුවට යටත්ව රු. 3,000 ක ගාස්තුවක් දුරකථන කුළුණු සඳහා අය කිරීමට පල්ලේපොල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නීය.

11-1480/10

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට ගොඩනැගිලි ඉදිකිරීම මත ගාස්තු හා මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමේ ගාස්තු අය කිරීම

පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05.01.03 XI යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. ජගත් වසන්ත දිසානායක,
සභාපති,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 11 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21.49.78 වගන්තිවලින් පල්ලේපොල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2009.04.17 දිනැති අංක 1597/8 දරන පළාත් පාලන අති විශෙෂ ගැසට් පත්‍රයේ I කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව නිවාස සහ නගර ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් පරිදි අය කිරීමට පල්ලේපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

1 වන උපලේඛනය

ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තු — නාගරික - රු. 2,000 0
ග්‍රාමීය - රු. 1,000 0

(i) සංවර්ධන අවසර පත්‍ර ලබා ගැනීම සඳහා පෙරසැරි ගාස්තු ආවරණය අනුමැතිය දීම සඳහා ගාස්තු සහ සේවා ගාස්තු :

සංවර්ධන කාර්යයේ ස්වභාවය	භාවිතා කළ යුතු ආකෘති පත්‍රය	අය කළ යුතු ගාස්තු		
i. ඉඩම් අනු කොටස්වල බෙදීම සඳහා සංවර්ධන බලපත්‍රය නිකුත් කිරීම	''අ''	පෙරසැරි ගාස්තු බිම් කට්ටියක ප්‍රමාණය		එක් බිම් කට්ටියකට අය කළ යුතු මුදල (මාර්ග, කාණු හා පොදු බිම් කොටස් හැර)
		ව. මී. 150-300 අතර		රු. 500 0
		ව. මී. 301-600 අතර		රු. 400 0
		ව. මී. 601-900 අතර		රු. 300 0
		ව. මී. 901 වැඩි		රු. 200 0
ii. ගොඩනැගිලි ඉදිකිරීම්/පවත්නා ගොඩනැගිලිවලට කොටසක් එකතු කිරීම /නැවත ඉදිකිරීම සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම	''ආ''	ගෙබිමේ විශාලත්වය මීටර්වලින්	පදිංචිය සඳහා රු. ශත	වාණිජ හෝ වෙනත් භාවිත රු. ශත
		45 ට අඩු	500 0	1,000 0
		45-90	1,500 0	2,000 0
		91-180	2,500 0	3,000 0
		181-270	3,500 0	4,000 0
		271-450	4,500 0	6,000 0
		451-675	5,500 0	8,000 0
		676-900	6,500 0	10,000 0
		901-1225	7,500 0	12,000 0
		1225 ට වැඩි	7,500 0	12,000 0
			ව. මී. 1226 ඉක්ම වීමෙන් පසු සෑම ව. මී. 90 ක් සඳහාම රු. 1000 බැගින්	ව. මී. 1226 ඉක්ම වීමෙන් පසු සෑම ව. මී. 90 ක් සඳහාම රු. 1,250 බැගින්

(ii) නීත්‍යානුකූල කිරීමේ දී දඩ මුදල් අය කිරීම :

(අ) අත්තිවාරම් අවසාන දක්වා ඉදිකර ඇත්නම් වර්ග අඩියකට රු. 5.00 බැගින් ද,
(ආ) ජනේල මට්ටම ඉදිකර ඇත්නම් වර්ග අඩියකට රු. 6.00 බැගින් ද,
(ඇ) බිත්ති අවසානය දක්වා ඉදිකර ඇත්නම් වර්ග අඩියකට රු. 7.00 බැගින් ද,
(ඈ) වහල අවසානය දක්වා ඉදිකර ඇත්නම් වර්ග අඩියකට රු. 8.00 බැගින් ද,

(iii) ගොඩනැගිලි අයදුම්පත්‍ර කාලය දීර්ඝ කිරීමේ ගාස්තු එක් වර්ෂයකට රු. 350.

11-1480/11

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට වෙනත් ගාස්තු පැනවීම

පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05.01.03 XII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද වෙනත් ගාස්තු එම වර්ෂය තුළ ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. ජගත් වසන්ත දිසානායක,
සභාපති,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 11 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් වෙනත් ගාස්තු 2020.01.01 දින සිට පනවා අය කිරීමට පල්ලේපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

1 උපලේඛනය

අනු. අංකය	පෝරම ගාස්තු හා වෙනත් ගාස්තු	මුදල රු. ශත
01.	වීටී රේඛා හා නොපවරවා ගැනීමේ සහතික සඳහා ගාස්තුව	750 0
02.	ගොඩනැගිලි සහතික කාලය දීර්ඝ කිරීම	350 0
03.	අනුකූලතා සහතික	500 0
04.	අනු බෙදුම අනුමත කිරීමේ ගාස්තු	500 0
05.	කට්ටි ඉඩම් පරීක්ෂා කිරීමේ ගාස්තු (කට්ටියකට)	500 0
06.	ටෙන්ඩර් පෝරම 50,000 දක්වා	400 0
	50000 ට වැඩි	1,500 0
07.	වරිපනම් බදු ලේඛනයේ පිටපතක් සඳහා ඒ.ටී. ඩී. පෝරම ගාස්තු	250 0
08.	වරිපනම් බදු තක්සේරු ලේඛනයේ පිටපතක් ලබා ගැනීම සඳහා පළමු වසරට (ඊළඟ වර්ෂයේ සිට වසරකට රු. 10.00 බැගින්)	100 0
09.	වරිපනම් බදු ලේඛනයේ නම වෙනස් කිරීමේ අයදුම්පත්‍ර	25 0
10.	පරිසර ආරක්ෂණ බලපත්‍ර, අයදුම්පත්‍ර ගාස්තු	100 0
11.	පරිසර බලපත්‍ර අළුත්කිරීමේ ඉල්ලුම්පත්‍ර සඳහා ගාස්තු	50 0
12.	මස් ප්‍රවාහනය සඳහා ගාස්තු මසකට	1,000 0

අනු. අංකය	පෝරම ගාස්තු හා වෙනත් ගාස්තු	මුදල රු. ශත
13.	ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා දෛනික ගාස්තු	
	* ක්‍රීඩා උත්සව/තරග/පුහුණු කිරීම් සඳහා	2,000 0
	පුරවැසියන් පෞද්ගලික ආයතන හා රාජ්‍ය ආයතන සඳහා	500 0
	පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පාසල්, පිට පාසල් සඳහා	2,000 0
	* විවිධ අවස්ථාවන් සඳහා සංගීත සන්දර්ශන, අළෙවි ප්‍රවර්ධන වැඩසටහන්, ජාතික උත්සව, විවිධ උත්සව, කානිවල් ඇතුළු විවිධ වැඩසටහන් සඳහා (ස්වභාවය, ධාරිතාවය, එකතු කළ වටිනාකම හා හානි පූර්ණය සලකා බැලීම මත)	(අවමය රු. 20,000 0 සිට උපරිමය රු. 10,000 0 දක්වා
14.	පුස්තකාල සඳහා ගාස්තු :	
	i. තැන්පත්	100 0
	ii. පුස්තකාල සාමාජික අලුත් කිරීම	30 0
15.	ත්‍රිරෝද රථ ගාස්තු හා සමිති ලියාපදිංචි කිරීමේ ගාස්තු :	
	i. එක් ත්‍රිරෝද රථයක් සඳහා මාසික ගාස්තු	100 0
	ii. ත්‍රිරෝද රථ සමිති ලියාපදිංචි කිරීමේ ගාස්තු	2,000 0
	iii. රථ වාහන නැවතුම්පලේ තාවකාලික වාහන නැවතුම් ගාස්තුව	100 0
	iv. රථගාල කුලියට දීම එක් දිනකට	2,000 0
16.	ජල අයදුම්පත්	100 0
	ජලය විකිණීම ලීටර් 1000 ක්	500 0
	නළ ළිං තැන්පත් වර්ෂයකට	750 0
	ප්ලාස්ටික් ටැංකිය කුලියට දීම පමණක් (ලීටර් 1000)	200 0
	ප්ලාස්ටික් ටැංකිය සඳහා තැන්පත් ගාස්තු	1,000 0
17.	ප්ලාස්ටික් පුටු කුලියට දීම සඳහා තැන්පත්	1,000 0
	ප්ලාස්ටික් පුටු එකකට	10 0
18.	ඉහළ මාලය කුලියට දීම එක් දිනකට	2,000 0
	ඉහළ මාලය කුලියට දීම වරුවකට	1,000 0
19.	ආදාහනාගාරයේ සේවා සැපයීමේ ගාස්තු	
	1. පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ උප සභාපතිතුමාගේ ගරු මන්ත්‍රීතුමන්ගේ/මන්ත්‍රීවරියන්ගේ හෝ කාර්යමණ්ඩලයේ සාමාජිකයෙකු හා ඔවුන්ගේ දෙමව්පියන් මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා	8,000 0
	2. පල්දෙණිය ග්‍රාම නිලධාරී වසමේ ජනතාවගේ මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා	8,000 0
	3. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් තැනැත්තෙකුගේ මෘත දේහයක් ආදාහනයක කිරීම සඳහා	9,000 0
	4. පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත යම් තැනැත්තෙකුගේ මෘත දේහයක් ආදාහනයක කිරීම සඳහා	11,000 0

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට යන්ත්‍රෝපකරණ කුලියට දීමේ ගාස්තු

පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05.01.03 XIII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. ජගත් වසන්ත දිසානායක,
සභාපති,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 11 වන දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් පල්ලේපොල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, පල්ලේපොල ප්‍රාදේශීය සභාවට අයත් යන්ත්‍රෝපකරණ කුලියට දීමට පල්ලේපොල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නීය.

බවුසරය කුලියට දීමට (ජලය හා ප්‍රවාහනය සඳහා එක් වරකට) :

	රු. ශත
* පල්ලේපොල නගර සීමාව තුළ	3,000 0
* පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ	3,500 0
* පල්ලේපොල බල ප්‍රදේශයෙන් පිටත වැඩිවන කි.මී. 1 ට	200 0
* ජලය සහ බවුසරය පමණක්	2,000 0
* බවුසරය පමණක්	500 0

බැකෝ යන්ත්‍රය

i. බැකෝ යන්ත්‍රය මී. පැය 1 ට	2,500 0
ii. මාර්ග තලන යන්ත්‍රයට මී.පැ. 1 ට	3,500 0
iii. කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය දිනකට (පැය 8)	3,500 0
iv. ලොරි රථය ඉන්ධන සමඟ දිනකට (පැය 8)	6,750 0
* වැඩි වන සෑම පැය 1 ටම	800 0
* නවතා තැබීමට	50 0
* පළමු කි. මී. 5 ඇතුළත	1,500 0
* අතිරේක කි. මී. 1 ට	200 0

ටිපර් රථය

* ඉන්ධන සමඟ දිනකට (පැය 8)	8,000 0
* අතිරේක පැයකට	1,500 0
* නවතා තැබීමට	50 0
* පළමු කි. මී. 5 ඇතුළත	3,000 0
* අතිරේක කි.මී. 1 ට	400 0

ට්‍රැක්ටරය

* ඉන්ධන සමඟ දිනකට (පැය 8)	6,500 0
* අතිරේක පැයකට	800 0
* නවතා තැබීමට	50 0
* පළමු කි. මී. ඇතුළත	1,000 0
* අතිරේක කි. මී. 1 ට	200 0

	රු. ශත
චතුර පොම්පය	
* ඉන්ධන සමඟ දිනකට (පැය 8)	2,000 0
* අතිරේක පැයකට	250 0
වයිබ්‍රේටින් ගල්රෝල ඉන්ධන ඇතුළුව කම්පන සහිත යන්ත්‍ර පැයකට	4,500 0

11-1480/13

පල්ලේපොල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05.01.03 XIV යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 30 වැනි දිනට පෙර පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තවදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. ජගත් වසන්ත දිසානායක,
සභාපති,
පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 11 වන දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභාපනතේ 148 වගන්තිය යටතේ රථ වාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමට එකී පනතේ 147 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙන අතර මෙම බදු මුදල 2020 මාර්තු 31 දින හෝ ඊට පෙර එකී පනතේ 148.3 වැනි වගන්තිය යටතේ ගෙවිය යුතු බවට යෝජනා කරමි.

		රු. ශ.
1.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, හෝ ජීන් රික්ෂෝවක් නොවන සෑම වාහනයක් සඳහා සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් කාරයක් හෝ කරත්තයක් සඳහා	30 0
(අ)	වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් සේවා ගාස්තු	18 0
(ආ)	වෙළඳ කාර්යය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් සේවා ගාස්තු	4 0
2.	සෑම කරත්තයක් සඳහා සේවා ගාස්තු	20 0
3.	සෑම අත් කරත්තයක් සඳහා සේවා ගාස්තු	10 0
4.	සෑම රික්ෂෝවක් සඳහා	15 0
5.	සෑම අශ්වයෙකු, පෝනියෙකු, කොටළුවෙකු සඳහා	10 0
6.	සෑම ඇතෙකු සඳහාම	50 0

11-1480/14

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

මැදදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 19 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05 (XII) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම්, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහාවන සම්පූර්ණ වරිපනම් 2020 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%)ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

අශෝක සමරකෝන්,
සභාපති,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2020 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන් පහත උපලේඛන අංක 01හි සඳහන් ප්‍රතිශත මත වරිපනම් බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් යෝජනා කරමි.

උපලේඛනය 01

නාගරික කොටඨාස වශයෙන් සියයට පහක (5%) වරිපනම් අයකරන ප්‍රදේශ :

තෙල්දෙණිය -

ප්‍රධාන වීදිය - වම
ප්‍රධාන වීදිය - දකුණ
මහ විද්‍යාල වටරවුම් පාර - වම
මහ විද්‍යාල වටරවුම් පාර - දකුණ
රෝහල වටරවුම් පාර - වම
රෝහල වටරවුම් පාර - දකුණ
අනිල කැලේ පාර - වම
අනිල කැලේ පාර - දකුණ
මහියංගන පාර - වම අංක 01 සිට 169/6 දක්වා
මහියංගන පාර - දකුණ අංක 6 සිට 182 දක්වා
නුවර පාර වම - අංක 1 සිට 223 දක්වා
නුවර පාර දකුණ - අංක 2 සිට 248/1/2 දක්වා
රංගල පාර - වම අංක 1 සිට 3/1 දක්වා

උඩිස්පත්තුව -

ගල්මල්ඔය පාර - වම අංක 1 සිට 65 දක්වා
ගල්මල්ඔය පාර - දකුණ අංක 10 සිට 58/1 දක්වා

මැදමහනුවර -

තෙල්දෙණිය පාර - වම අංක 01 සිට 105/1 දක්වා
තෙල්දෙණිය පාර - දකුණ අංක 2 සිට 100 දක්වා

ග්‍රාමීය කොට්ඨාස වශයෙන් සියයට තුනක (3%) වරිපනම් අයකරන ප්‍රදේශ -

තෙල්දෙණිය -

මහියංගණ පාර - වම අංක 175 සිට 357/16 දක්වා
මහියංගණ පාර - දකුණ අංක 192 සිට 398 දක්වා
නුවර පාර වම - අංක 225 සිට 573 දක්වා
නුවර පාර දකුණ - අංක 250 සිට 498/10 දක්වා
රංගල පාර - වම අංක 5 සිට 93 දක්වා
රංගල පාර - දකුණ
වේරපිටිය පාර - වම
වේරපිටිය පාර - දකුණ
අලුත්වෙල පාර - වම
අලුත්වෙල පාර - දකුණ

උඩිස්පත්තුව -

ගල්මල්ඔය පාර - වම අංක 67 සිට 213/1 දක්වා
ගල්මල්ඔය පාර - දකුණ අංක 62 සිට 222 දක්වා
රංගල පාර - වම
රංගල පාර - දකුණ
පරණ රංගල පාර - වම
පරණ රංගල පාර - දකුණ
තෙල්දෙණිය පාර - වම
තෙල්දෙණිය පාර - දකුණ

මැදමහනුවර -

තෙල්දෙණිය පාර - වම අංක 115 සිට 387 දක්වා
තෙල්දෙණිය පාර - දකුණ අංක 104 සිට 316 දක්වා
මිණිපේ පාර - වම
මිණිපේ පාර - දකුණ
හාලියද්ද පාර - වම
හාලියද්ද පාර - දකුණ
නවදගල පාර - වම
නවදගල පාර - දකුණ
උඩිස්පත්තුව පාර - වම
උඩිස්පත්තුව පාර - දකුණ
හුන්නස්ගිරිය පාර - දකුණ

රංගල -

තංගප්පුව පාර - වම
තංගප්පුව පාර - දකුණ
ගෝනවල පාර - වම
ගෝනවල පාර - දකුණ
තෙල්දෙණිය පාර - වම
තෙල්දෙණිය පාර - දකුණ

බෝබැබිල -

රංගල පාර - වම
රංගල පාර - දකුණ

11-1473/1

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට අදාළව අක්කර බදු ගාස්තු පැනවීම

මැදදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 19 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05 (XIII) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහාවන සම්පූර්ණ අක්කර බද්ද 2020 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

අශෝක සමරකෝන්,
සභාපති,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යාක්ෂණය කිරීම 2020 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී පනතේ 134 වැනි වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ,

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2020 වර්ෂය සඳහා රුපියල් 10.00 බැගින්වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත්,

(ආ) හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත, 2020 වර්ෂය සඳහා රුපියල් 50.00 බැගින්වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් යෝජනා කරමි.

11-1473/2

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2020 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

මැදදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 19 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05 (XVI) යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව, කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2020 වර්ෂයේ දී මැදදුම්බර ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් අයකරනු ලබන බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. අශෝක සමරකෝන්,
සභාපති,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ මැදදුම්බර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මැදදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්ත වෙනුවෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපනශාලාවක් හෝ නවාතැන් පොළක්වන විට එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන් පොළෙන් පසුගිය වර්ෂයේලත් ලැබීම්වලින් සියයට එක (1%) ක ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත් මැදදුම්බර ප්‍රාදේශීය සභාව යෝජනා කරයි.

2020 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

උපලේඛනය

I වන තීරය		*II වන තීරය*		
	ව්‍යාපාරය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	බයිසිකල් වින්කලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	ත්‍රීරෝද රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	යතුරුපැදි සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ත්‍රීරෝද රථ සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	මෝටර් රථ සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වන තීරය	*II වන තීරය*		
	ව්‍යාපාරය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
08.	ටයර් ටියුබ් වොල්කයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	වාහන විදුලි කාර්මික කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	600 0	1,000 0
12.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	දුණු වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	කඩල මුරුක්කු වර්ග නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
15.	රටකජු බෑද පැකට් කිරීමේ ව්‍යාපාරයක් කිරීම	500 0	750 0	1,000 0
16.	උත්සව සඳහා ආහාර සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ආහාර ද්‍රව්‍ය තොග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	රසකැවිලි සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	පපඩම් නිෂ්පාදනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	පැණි හකුරු නිෂ්පාදනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	තේ සහ කෝපි වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	බත් කඩයක්/ආපනශාලාවක්/හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	මාළු කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	යෝගට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	අයිස් පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	600 0	1,000 0
26.	සිරප් හෝ පළතුරු බීම නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	ශීතකළ කුකුල් මස්/මාළු විකිණීම	500 0	750 0	1,000 0
28.	ශීතකළ ආහාර පාන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	දුම්කොළ ඇසුරුම් කර විකිණීම	300 0	600 0	1,000 0
30.	දුම්කොළ උඳුනක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	දුම්කොළ ගබඩා කිරීමේ ස්ථානයක් හා සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	ගිණිකෙළි භාණ්ඩ, රතිඤ්ඤු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	පැළ තවාන් හෝ පැළ සිටුවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	විෂබීජ නාශක හා පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම	500 0	750 0	1,000 0
35.	වී මෝලක් පවත්වාගෙන යාම (අශ්වබල 10 ට අඩු)	500 0	750 0	1,000 0
36.	කුළුබඩු හෝ ධාන්‍ය ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	තේ කුඩු කුළු බඩු, ධාන්‍ය වර්ග පැකට් කර අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	ශීතකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	විදුලි උපකරණ නිපදවීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	300 0	600 0	1,000 0

	I වන තීරය	*II වන තීරය*		
	ව්‍යාපාරය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
41.	සායම් කුඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	යාන්ත්‍රික ලී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	දැව ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	ලියවන පට්ටල් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	පිංතූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	600 0	1,000 0
47.	අළුහුණු ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	හුණු පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	හුණු පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	දත් බැඳීමේ හා ගැලවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	දෘෂ්ටී පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	බටහිර ඖෂධ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57.	ආයුර්වේද බෙහෙත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	කිරි එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59.	සත්ත්ව/කුකුල් ඌරු/එළු ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60.	සත්ත්ව ආහාර නිෂ්පාදනය හා ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	අවමංගල්‍ය අධ්‍යක්ෂක ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	එළවළු පළතුරු විජලනය කර ඇසුරුම් කර විකිණීම	500 0	750 0	1,000 0
65.	පළතුරු එළවළු අපනයනය සඳහා ස්ථානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	පොල් තෙල් තොග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	පොල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
68.	ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
69.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
70.	රූපලාවන්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
71.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
72.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
73.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
74.	බීඩි නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
75.	ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කිරීම හා කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වන තීරය	*II වන තීරය*		
	ව්‍යාපාරය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
76.	සබන් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77.	කොසු ඉදල් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
78.	එනසාල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	බිම්මල් නිෂ්පාදනය හා අලෙවිය	300 0	600 0	1,000 0
80.	හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
81.	සිමෙන්ති ආශ්‍රිත වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82.	යකඩ සුන්බුන් එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
84.	යකඩ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
85.	පිත්තල වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
86.	රන්රිදී වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
87.	සම්භාණ්ඩ නිෂ්පාදනය හා වෙළෙඳාම	500 0	750 0	1,000 0
88.	මැටි බඳුන් නිපදවීමේ හෝ ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
89.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
90.	තිරරෙදි මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
91.	බෑග් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
92.	මදුරු දැල් මසා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
93.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
94.	පොලිතීන් පවුඩර් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
95.	පී. වී. සී. බට සොකට් වර්ග සෑදීම	500 0	750 0	1,000 0
96.	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
97.	යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
98.	වීදුරු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
99.	සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
100.	හඳුන්කුරු / ඉටි නිෂ්පාදනය හා වෙළඳාම	500 0	750 0	1,000 0
101.	මෝටර් රථ වායුසමීකරණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
102.	විසිතුරු මල්පැළ/විසිතුරු මසුන් අලෙවි කිරීමේ පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
103.	ආහාර වර්ග නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
104.	සිනමා ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
105.	ගෝඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම	-	-	1,000 0
106.	ගවමස් වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	-	-	1,000 0
107.	ගවමස් ප්‍රවාහනය සඳහා	-	-	1,000 0
108.	ගෝඝාතක තාවකාලික බලපත්‍ර ගාස්තු (එක් සතෙකු සඳහා)	-	-	1,000 0
109.	ගවමස් විකිණීමේ තාවකාලික බලපත්‍ර ගාස්තු	-	-	1,000 0
110.	ගවමස් ප්‍රවාහනය සඳහා තාවකාලික බලපත්‍ර ගාස්තු	-	-	1,000 0

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

මැදදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 19 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05 (XVIII) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 01 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. අශෝක සමරකෝන්,
සභාපති,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකු ගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ අනුරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2020 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර මැදදුම්බර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත්, මැදදුම්බර ප්‍රාදේශීය සභාව යෝජනා කරමි.

උපලේඛනය අංක 01

i වන තීරය	වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද
ව්‍යාපාර :	
01.	රියදුරු පාසලක් පවත්වාගෙන යාම
02.	රේස් ඔට්ටුපලක් පවත්වාගෙන යාම
03.	වතුර බෝතල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
04.	වෙළෙඳ අලෙවි නියෝජිතයකු ලෙස කටයුතු කිරීම
05.	උකස් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
06.	ගොල්ෆ් ක්‍රීඩාංගන
07.	පෞද්ගලික අධ්‍යාපන ශාලාවක් වශයෙන් පවත්වාගෙන යාම
08.	තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
09.	විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
10.	ලොතරැයි අලෙවි නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම
11.	ප්‍රචාරක කටයුතු නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම
12.	පෞද්ගලික ආරක්ෂක ස්ථානයක් පවත්වාගෙන යාම
13.	රක්ෂණ නිලධාරිවරයෙකු වශයෙන් කටයුතු කිරීම
14.	විදුලි කාර්මිකයකු වශයෙන් කටයුතු කිරීම
15.	ගෘහ නිර්මාණ ශිල්පියෙකු වශයෙන් කටයුතු කිරීම
16.	දඹදිව වන්දනා චාරිකා සංවිධානය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
17.	රථ වාහන හා වාහන අමතර කොටස් අලෙවි නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම
18.	කුළී පදනමින් රථ වාහන සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
19.	වෙන්දේසිකරුවෙකු වශයෙන් කටයුතු කිරීම
20.	මුදල් තැරැව්කරුවෙකු වශයෙන් කටයුතු කිරීම
21.	දේපළ වෙළෙඳුම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම

22. අත්යන්ත්‍ර ක්‍රමයට රෙදි වියන ස්ථානයක් පවත්වාගෙන යාම
23. බලවේග පෙහෙකම්හලක් පවත්වාගෙන යාම
24. ඇඟලුම් කම්හල් පවත්වාගෙන යාම
25. ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකු වශයෙන් කටයුතු කිරීම
26. ඇළුමිනියම් සැකසුම් කොන්ත්‍රාත්කරුවකු වශයෙන් කටයුතු කිරීම
27. ඛනිජ තෙල් ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
28. රටබීම වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
29. රා තැබෑරුමක් පවත්වාගෙන යාම
30. බැංකු හා මූල්‍ය ආයතන පවත්වාගෙන යාම
31. විකුණුම් ජාල වෙබ් අඩවියක් පවත්වාගෙන යාම
32. පරිගණක මෘදුකාංග සකස් කිරීමේ කටයුතු කිරීම
33. උපකරණ හා ආහාර ද්‍රව්‍ය ආනයන අපනයන වෙළෙඳ කටයුතු කිරීම.
34. කුඩා විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම
35. ගෘහ භාණ්ඩ විදුලි උපකරණ අලෙවි නියෝජිතයෙකු වශයෙන් කටයුතු කිරීම
36. ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා කර බෙදාහැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37. පවිත්‍රතා සිදුකිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
38. මාර්ග උපදේශන කටයුතු සිදුකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
39. ශ්‍රමිකයන් සැපයීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
40. සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම
41. දිවාසුරුකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
42. ගබඩාවක් පවත්වාගෙන යාම
43. දුම්කොළ සමාගමක් පවත්වාගෙන යාම
44. නවාතැන්පළක් පවත්වාගෙන යාම
45. කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

II වන කීරය

	ව්‍යාපාරයේ වාර්ෂික ආදායම	*ගෙවිය යුතු වාර්ෂික බදු මුදල* *රු. ශත*
(i)	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
(ii)	රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
(iii)	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
(iv)	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
(v)	රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
(vi)	රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

11-1473/4

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

මැදදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 19 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05 (XVII) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 01 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. අශෝක සමරකෝන්,
සභාපති,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, 2019 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යටොක්ත බද්ද 2020 අප්‍රේල් මස 01 වැනි දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමටත්, 2020 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යටොක්ත බද්ද ආරම්භ කර මාස 03ක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ සඳහන් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයෙහි 11 වන තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක්, 2020 වර්ෂය සඳහා පනවා අය කළයුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙක් 2020 වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවන ලෙස මහව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් නිවේදනය කළ දින සිට දින 07ක් ඇතුළත මහව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, මහව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	විසිතුරු හා කැටයම් භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
2.	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
3.	විදුලි උපකරණ හා විද්‍යුත් උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
4.	අත් යන්ත්‍ර රෙදි විවීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
5.	වී මෝලක් /ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	සිසිල් බීම නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් සඳහා (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිර්දේශය අවශ්‍ය වේ)	500 0	750 0	1,000 0
7.	අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් සඳහා	500 0	700 0	1,000 0
8.	විදුලි බල්බ් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
9.	හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	වැහිපීලි හෝ දම්වැල් නිෂ්පාදනය	500 0	750 0	1.000 0
11.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යන ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
12.	කම්හලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
13.	ඉදල් නිපදවීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
14.	පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය නිෂ්පාදන ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0

මහව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගාස්තු පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05:3 යටතේ පහත දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙසේ නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2020 වර්ෂයේ දී මහව ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මත ගාස්තුවක් අය කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. පියසේන,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 12 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2020 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගාස්තු පැනවීම සඳහා වූ යෝජනාව - 1

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ 1987/15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමග කියවිය යුතු 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලය අනුව මෙම අතුරු ව්‍යවස්ථා පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගැනීමට, වයඹ පළාත් ගරු ප්‍රධාන අමාත්‍යවරයා විසින් 2010.07.06 වැනි දින අංක 1063 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් නිවේදනය කර ඇති පරිදි අප්‍රසන්න, අන්තරාදායක සහ අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මෙම සභාව විසින් වැළඳගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1734 හා 2011.11.25 දිනැති *ගැසට් පත්‍රයේ* iv (ආ) පළාත පාලන කොටසෙහි නිවේදනය කර ඇති පරිදි, 2020 වර්ෂය තුළ දී මහව ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් වන උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්, එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපනශාලාවක් හෝ නවාතැන්පොළක් වන විට, එකී හෝටලයෙන් හෝ ආපනශාලාවෙන් හෝ නවාතැන්පලෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම් වලින් සියයට (1%) ක ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත් මහව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
	අප්‍රසන්න ව්‍යාපාර :			
1.	මිනිරන් සුද්ද කිරීම	500 0	750 0	1,000 0
2.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට ළඟ තබා ගැනීම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව	II වැනි තීරුව		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 දක්වා	වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා	වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
3.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
4.	සම් විකිණීමට ළඟ ලබා ගැනීම	500 0	750 0	1,000 0
5.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
6.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
7.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබා ගැනීම	500 0	750 0	1,000 0
8.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
9.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	කරවල, ලුණු, මාළු හෝ ජාඩි කිලෝ 150කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	700 0	1,000 0
11.	මාළු හෝ මස් ජාඩි දැමීම, වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
12.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
13.	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
15.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
16.	සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
17.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
18.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	ට්‍රන්ක් පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
20.	අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	700 0	1,000 0
22.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
23.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
24.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
25.	සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
26.	රස කැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
27.	පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
28.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
29.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
30.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
31.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
32.	දැව ඉරීම	500 0	750 0	1,000 0
33.	පින්තාරු වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
34.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
35.	කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
36.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
37.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
38.	කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම	500 0	750 0	1,000 0
39.	බේකින් පවුඩර් නිපදවීම	500 0	750 0	1,000 0
40.	ෆෑස් මැන්ටල් නිපදවීම	500 0	750 0	1,000 0
41.	පොටි නිපදවීම	500 0	750 0	1,000 0
42.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
43.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව	II වැනි තීරුව		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 දක්වා	වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා	වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
44.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
45.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
46.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
47.	සුවඳ විලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
48.	පාසල් රට හුණු නිපදවීම	500 0	750 0	1,000 0
49.	ටයර් හෝ ටියුබ් නිපදවීම	500 0	750 0	1,000 0
50.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
51.	ටයර් -ටියුබ් වෝල්කනයිස් කිරීම	500 0	750 0	1,000 0
52.	සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
53.	සිමෙන්ති භාණ්ඩ, ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
54.	වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
55.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
56.	ගඩොල් පිළිස්සීම	500 0	750 0	1,000 0
57.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
58.	අම්ල නිෂ්පාදනය කිරීම හා නැවත ඇඹරීම	500 0	750 0	1,000 0
59.	උළු නිපදවීම	500 0	750 0	1,000 0
60.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
61.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
	අන්තරාදායක ව්‍යාපාර :			
1.	කළුගල් කැනීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
2.	එළවළු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
3.	පොල් තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
4.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
5.	මෙතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
6.	තේ පෙට්ටි නිපදවීම	500 0	750 0	1,000 0
7.	කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
8.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
9.	පිදුරු තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
11.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කර අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
12.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
13.	හිරිගල් හෝ හුණුගල් කැනීම	500 0	750 0	1,000 0
14.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
15.	හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	පා පැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
17.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	විසිරි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
19.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
20.	ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ නිපදවීම)	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව	II වැනි තීරුව		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 දක්වා	වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා	වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
	අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :			
1.	තලාතු මිනිරන් සුද්ධ කිරීම	500 0	750 0	1,000 0
2.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳිවර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
3.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
4.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම	500 0	750 0	1,000 0
5.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
6.	තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0
7.	නුණු ගල් හෝ හිරිගල් පිළිස්සීම	500 0	750 0	1,000 0
8.	ගිණිකෙලි භාණ්ඩ හා රතිඤ්ඤා නිපදවීම	500 0	750 0	1,000 0
9.	මෝර තෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0
10.	බෝට්ටු තැනීම	500 0	750 0	1,000 0
11.	ලෝහ වර්ග පෑස්සීම	500 0	750 0	1,000 0
12.	බැටරි විද්‍යුත් ආරෝපනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
13.	මෝටර් වාහන අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
14.	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
15.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
16.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	මෝටර් වාහන බොඩි තැනීම	500 0	750 0	1,000 0
19.	කෘමි නාශක, දිලීර නාශක, පැලෑටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම හෝ නැවත පිරවීම	500 0	750 0	1,000 0
20.	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
21.	මදුරු දඟර නිපදවීම	500 0	750 0	1,000 0

2020 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගාස්තු පැනවීම සඳහා වූ යෝජනාව - 2

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ 1987/15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමග කියවිය යුතු 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලය අනුව, මෙම අතුරු ව්‍යවස්ථා පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගැනීමට වයඹ පළාත් පාලන නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් නිවේදනය කර ඇති පරිදි පහත උපලේඛනයේ සඳහන් අතුරු ව්‍යවස්ථා මෙම සභාව විසින් වැළඳගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1539 හා 2008.02.29 දිනැති *ගැසට් පත්‍රයේ* iv (ආ) පළාත් පාලන කොටසෙහි නිවේදනය කර ඇති පරිදි, 2020 වර්ෂය තුළ දී මහව ප්‍රාදේශීය සභාව විසින් අදාළ ව්‍යාපාර සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන උපවගන්තිය සමග කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් වන උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්, මහව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	ලැගුම් නිවාස සඳහා	500 0	750 0	1,000 0
2.	හෝටල් සඳහා	500 0	750 0	1,000 0
3.	බේකරි සඳහා	500 0	750 0	1,000 0
4.	කිරි පට්ටි හා කිරි වෙළෙඳාම සඳහා	500 0	750 0	1,000 0
5.	බත් කඩ, ආපනශාලා හා තේ කඩ හෝ කෝපි වෙළඳාම	500 0	750 0	1,000 0
6.	ආහාර පිසීම	500 0	750 0	1,000 0
7.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
8.	මස් විකිණීම	500 0	750 0	1,000 0
9.	අයිස් කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
10.	සිසිල් බීම කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
11.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
12.	සංචාරක වෙළෙන්දෝ	500 0	750 0	1,000 0
13.	ගව ගාල්	500 0	750 0	1,000 0
14.	සාතක මඩු	500 0	750 0	1,000 0
15.	කොණ්ඩා සැකසීමේ සැළුන්හල් හා බාබර් සාප්පු	500 0	750 0	1,000 0

11-1475/3

මහව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05:3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙසේ නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ව්‍යාපාර බද්ද 2020 වර්ෂයට අදාළව මහව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවන ලෙස මහව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් දන්වා සිටින දින සිට දින 07ක් ඇතුළත මහව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. පියසේන,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 12 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2020 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීමේ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන උප වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධි විධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක්/කර්මාන්තයක් මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ආදායම් ලැබීම මෙහි පහත උපලේඛනයේ II කොටසේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද, 2020 වර්ෂයට අදාළව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවන ලෙස මහව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් නිවේදනය කර සිටින දින සිට දින 07ක් ඇතුළත මහව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මහව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

අනු. අංකය	*I තීරුව*	*II තීරුව*
	2018 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	*ගෙවිය යුතු බද්ද රු. ශත*
1	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
2	රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
3	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
4	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
5	රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
6	රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

11-1475/4

මහව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05:3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙසේ නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා අක්කර බද්ද මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදීම සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2020 වර්ෂයේ ජනවාරි මස 31 ට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

එච්. පියසේන,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 12 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2020 වර්ෂය සඳහා අක්කර බදු පැනවීමේ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2019 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යාක්ෂණය කිරීම 2020 වර්ෂය සඳහා ද පිළිගැනීමටත්, එකී පනතේ 134 වන වගන්තියේ (3) වන උපලේඛනයෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් 05 හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2020 වර්ෂය සඳහා රුපියල් 10/- (දහය) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ 1989.03.10 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත්, හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2020 වර්ෂය සඳහා රු. 50/- (පනහක්) බැගින් වන වාර්ෂික අමතර බද්දක් පනවා අය කිරීමටත්,

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද මහව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

2020 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2020 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) ක වට්ටමක් ද, දෙනු ලබන බවට මහව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

11-1475/5

මහව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05:3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙසේ නිවේදනය කරනු ලැබේ. ඒ අනුව මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකු විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2020 වර්ෂය සඳහා වන මෙම බද්ද මහව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව ද, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. පියසේන,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 12 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2020 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම සඳහා වූ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය හා හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කළයුතු යැයි ද යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*
	බද්ද අදාළ වන වර්ෂයට හෝ වර්ෂය වනතෙක් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු. ශත*
01. I	මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
II	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකලයක් කරත්තයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
	(අ) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළෙඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
III	සෑම කරත්තයක් සඳහා	20 0
IV	සෑම අත්කරත්තයක් සඳහා	10 0
V	සෑම රික්ෂෝවක් සඳහා	7 50
VI	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවකු සඳහා	15 0
VII	සෑම ඇතෙකු සඳහා	50 0

03. විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

04. ඉහත සඳහන් වෙළෙඳ කාර්යය යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍යයක් හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

11-1475/6

මහව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ගාස්තු පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05:3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙසේ නිවේදනය කරනු ලැබේ.

එච්. පියසේන,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 12 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2020 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ගාස්තු පැනවීම සඳහා වූ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවකින් හෝ වෙනයම් නීතියකින් පැනවී ඇති බලතල අනුව මෙහි පහත සඳහන් එක් එක් කාර්යය සඳහා එය ඉදිරියෙන් දක්වා ඇති ගාස්තු ප්‍රමාණයන් 2020 වර්ෂයේ දී ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මහව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

			රු. ශත
01. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම			1,000 0
02. කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම			1,000 0
03. පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම			
	සාමාජික ගාස්තුව රු. ශත	*සාමාජිකත්වය අලුත් කිරීම රු. ශත*	
වැඩිහිටියන් සඳහා	60 0	45 0	
ළමුන් සඳහා	40 0	30 0	
04. ජල සැපයුම් අයදුම්පත්‍ර නිකුත් කිරීම			50 0
05. පුස්තකාල අයදුම්පත්‍ර ගාස්තු			10 0
06. වරිපනම් තක්සේරු ලේඛනයේ නම වෙනස් කිරීම			50 0
07. ප්‍රසිද්ධ රැගුම් බලපත්‍ර - සංදර්ශන සඳහා දිනකට			1,000 0
08. ක්‍රීඩා පිටිය කුලියට දීම - එක් දිනකට :			
I. දිගන ක්‍රීඩා පිටිය සඳහා			
සංගීත සංදර්ශනයක් හෝ වෙනත් විනෝද කටයුත්තක් සඳහා දිනකට			10,000 0
වෙනත් කාර්යයන් සඳහා දිනකට			5,000 0
II. අනෙකුත් ක්‍රීඩා පිටි සඳහා			
සංගීත සංදර්ශනයක් සඳහා දිනකට			10,000 0
වෙනත් කාර්යයන් සඳහා දිනකට			2,000 0
III. පොදු වෙළෙඳපළ භූමිය සඳහා දිනකට			5,000 0
IV. තාවකාලික වෙළෙඳ කුටි සඳහා මසකට හෝ ඊට අඩු කාලයක් සඳහා			3,000 0
09. පරිසර බලපත්‍ර සඳහා ඉල්ලුම් පත්‍ර ගාස්තු			100 0
10. පරිසර බලපත්‍ර සඳහා අලුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු			50 0
11. සහතික පිටපත් නිකුත් කිරීම එක් පිටපතකට			100 0
12. අලෙවි ප්‍රවර්ධන කාර්යයන් සඳහා ගාස්තු අය කිරීම - දිනකට			2,000 0
13. ජල සැපයුම් ප්‍රතිසන්ධි ගාස්තු			400 0
14. ජල බවුසරය මගින් ජලය ලබාදීමේ දී අය කරනු ලබන ගාස්තු			
යාමට හා ඒමට කි. මී. 2 1/2 ක දුරක් වන විට			1,200 0
ඊට වැඩි වන කි. මී. 1 හෝ ඉන් කොටසකට			50 0 බැගින්

රු. ශත

15. විටී රේඛා ඉල්ලුම්පත්‍ර ගාස්තුව 100 0
16. පිඹුරු ඉල්ලුම්පත්‍ර ගාස්තුව 100 0
17. ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තුව 500 0
18. ගොඩනැගිලි ඉදිකිරීම/ පවත්නා ගොඩනැගිලිවලට අලුතින් කොටසක් එකතු කිරීම/ නැවත ඉදිකිරීම (නාගරික නොවන බල ප්‍රදේශ) අය කළ යුතු ගාස්තුව

ගෙබිමේ විශාලත්වය වර්ග මීටර් වලින්	*පදිංචිය සඳහා* *රු.*	*වාණිජ හෝ වෙනත්* *රු.*
45 ට අඩු	500 0	1,000 0
45 - 90	1,000 0	1,500 0
91 - 180	2,000 0	2,500 0
181 - 270	3,000 0	3,500 0
271 - 450	4,000 0	5,500 0
451 - 675	5,000 0	7,500 0
676 - 900	6,000 0	9,500 0
901 - 1,225	7,000 0	11,500 0
1,225 ට වැඩි	7,000 0	11,500 0
1,226 ඉක්මවන විට සෑම වර්ග මීටර් 90 ක් සඳහා	750 0 බැගින්	1,000 0 බැගින්

19. මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම සඳහා අය කළ යුතු ගාස්තු (නාගරික නොවන බල ප්‍රදේශ)

විස්තරය	*නේවාසික දික්* *මීටර් 1 ක් සඳහා* *රු. ශත*	*වාණිජ හා වෙනත් දික්* *මීටර් 1 ක් සඳහා* *රු. ශත*
ගොඩනැගිලි සීමාවෙන් පිටත	200 0	300 0
ගොඩනැගිලි සීමාව තුළ	400 0	500 0

20. ඉඩම්/කුඹුරු ගොඩ කිරීම සඳහා අය කිරීම (නාගරික නොවන බල ප්‍රදේශ)
    - ව. මී. 150 ට අඩු රු. 1,250 සහ එයට වැඩි සෑම ව.මී. 150 කට රු. 750.00 බැගින්

21. දුරකථන කුළුණු/ ඇන්ටනා කුළුණු ඉදිකිරීම සඳහා අය කිරීම (නාගරික නොවන බල ප්‍රදේශ)
    - උස මීටර් 5 - 20 දක්වා රු. 18,000 ක් සහ වැඩි වන සෑම මීටර් 01 කට රු. 75.00 බැගින්

22. විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම සඳහා අය කිරීම (නාගරික නොවන බල ප්‍රදේශ)
    - රුපියල් මිලියන 05 කට රුපියල් 4,000 සහ වැඩිවන සෑම රුපියල් මිලියන 1 කට රු. 75.00 බැගින්

23. අනුකූලතා ප්‍රදානය කිරීමේ ගාස්තු (නාගරික නොවන බල ප්‍රදේශ)

නේවාසික ඉදිකිරීම් :
ව. මීටර් 300 ට අඩු රු. 2,500 සහ ඊට මායිම් වන සෑම ව. මී. 1 ටම රු. 10 බැගින්

වාණිජ ඉදිකිරීම :
ව. මී. 1,000 ට අඩු රු. 2,500 සහ ඊට වැඩිවන සෑම ව. මී. 1 ටම රු. 15 බැගින්

මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම :
පළමු දික් මීටර් 100 සඳහා රු. 750ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 1 ටම රු. 10 බැගින්

දුරකථන විදුලි සංදේශ කුළුණු :

උස මීටර් 5 -20 දක්වා රු. 1,500 සහ ඊට වැඩි වන සෑම මීටර් 01 ටම රු. 75 බැගින්

24. නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම/කොටස් එකතු කිරීම/නැවත ඉදිකිරීම (නාගරික නොවන බල ප්‍රදේශ)

විස්තරය	*නේවාසික වර්ග අඩි 01 රු.*	*ව්‍යාපාරික වර්ග අඩි 01 රු.*
අත්තිවාරම මට්ටම දක්වා	2	2
බිත්ති මට්ටම දක්වා	3	3
සම්පූර්ණ ඉදිකිරීම	5	5
මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම	5	5

ඉඩම්/කුඹුරු ගොඩ කිරීම :

සෑම වර්ග මීටර් 150 ටම රු. 5,000 බැගින්

දුරකථන/විදුලි සංදේශ කුළුණු :

සෑම උස මීටර් 05 ටම රු. 10,000 බැගින්

25. අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වීම/ භාවිත කිරීම හෝ ප්‍රයෝජන ගැනීම අය කිරීම් (නාගරික නොවන බල ප්‍රදේශ) එක් දිනකට රු. 25.00 බැගින්

26. ගොඩනැගිලි අයදුම්පත්‍ර කාලය දීර්ඝ කිරීම සඳහා අය කිරීම (නාගරික නොවන බල ප්‍රදේශ) එක් වර්ෂයකට රු. 500 බැගින්

27. වීථි රේඛා අනුමත කිරීම රු. 600 තැන්පත් රු. 100.00

පිඹුරු අනුමත කිරීම එක් කැබැල්ලකට රු. 250.00

28. *බැනර් ප්‍රදර්ශනය කිරීම :*

		රු. ශත
(i)	මාස 03කට අඩු බැනරයක් හෝ බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කිරීම කරනු ලබන ප්‍රචාරක දැන්වීමකට වර්ග අඩි 01 ට	30 00
(ii)	මාස 03කට වැඩි, මාස 06කට අඩු බැනරයක් හෝ බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කිරීම - වර්ග අඩි 01කට	40 0
(iii)	මාස 06කට වැඩි අවුරුද්දකට අඩු බැනරයක් හෝ බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කිරීම - වර්ග අඩි 01කට	50 0

29. නගර ශාලාවේ ගාස්තු අයකිරීම :

I. මංගල උත්සවයක් වෙනුවෙන් (එක් දිනක් සඳහා)

දිවා කාලය සඳහා	රු. 30,000.00
රාත්‍රී කාලය සඳහා	රු. 35,000.00

(මීට අමතරව භාවිතා කරනු ලබන ජල ඒකක ගණන හා විදුලි ඒකක ගණන සඳහා ද ගාස්තු අය කෙරේ.)

II. අලෙවි ප්‍රවර්ධන වැඩ සටහනක් පැවැත්වීම සඳහා (එක් දිනක් හෝ ඉන් කොටසක් සඳහා) රු. 10,000.00

III. අධ්‍යාපනික, සම්මන්ත්‍රණ, දේශන වැනි වැඩසටහනක් සඳහා (එක් දිනක් හෝ ඉන් කොටසක් සඳහා) රු. 5,000.00

IV. විනෝදාත්මක කටයුත්තක් සඳහා දිනකට (සංගීත සංදර්ශන, චිත්‍රපට පෙන්වීම, වේදිකා නාට්‍ය) රු. 15,000.00

30. ත්‍රිරෝද රථ නැවතුම් ස්ථානය සඳහා ත්‍රිරෝද රථ ගාස්තුව (වාර්ෂික) රු. 1,000.00

31. ආදාහනාගාරය සඳහා ගාස්තු අය කිරීම :
බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට රු. 7,000.00
බල ප්‍රදේශය පිට පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට රු. 8,000.00

32. ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍ර කුලියට දීමේ දී අයකරනු ලබන ගාස්තු :

යන්ත්‍රය	*ඉන්ධන සහිතව පැය 01ක් සඳහා අයකරන මුදල*	*VAT*	*NBT*	*මුළු එකතුව රු. ශත*	*ගෙවිය යුතු අවම පැය ගණන රු. ශත*
මෝටර් ග්‍රේඩරය	4,240.00	636.00	84.80	496.80	6
බැකෝ යන්ත්‍රය	2,997.00	449.55	59.94	3,506.49	4
මාර්ග තලනය	2,700.00	405.00	54.00	3,159.00	6
කියුබ් 3 ටිපර් රථය	දිනකට 10,000.00	1,500.00	200.00	11,700.00	

(මහ සභාව විසින් වරින් වර සිදුකරනු ලබන ගාස්තු සංශෝධනයන්ට අනුව ඉහත ගාස්තු වෙනස් විය හැක.)

33. මහව බස්නැවතුම්පොල ගාස්තු අයකිරීම :

බස්නැවතුම්පොලට ඇතුළත් වන සෑම මගී බස් රථයකින්ම දිනකට රු. 50.00

11-1475/7

මහව ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05.3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. පියසේන,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 12 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ *ස්ථාවර නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 60% (සියයට හැටට) වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2020 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 1% (සියයට එකක) වාර්ෂික බද්දක් පැනවීමටත් එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර මහව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යැයි මහව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

11-1475/8

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

වරිපනම් ප්‍රතිශතය පිළිගැනීම සහ වරිපනම් බදු පැනවීම - 2020

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති අතුකෝරළ ආරච්චිලාගේ ප්‍රියන්ත පුෂ්පකුමාර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2019 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි. එනම්, 2019 සැප්තැම්බර් මස 10 වැනි දිනැති සභා තීරණ අංක ඉ (01) යටතේ සභා සම්මත වූ බව නිවේදනය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 453/6 හා 1987.05.12 දිනැති *ගැසට් පත්‍රය* යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තාවූ ප්‍රදේශය ඇතුළත පිහිටියාවූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා වේයන්ගොඩ උප කාර්යාල බල ප්‍රදේශයට 2016 වර්ෂයේ තක්සේරුව ද, බෙම්මුල්ල උපකාර්යාලය සඳහා 2019 තක්සේරුව ද, අනෙකුත් උපකාර්යාල වන (එගොඩපොත උ. කා./ මෙගොඩපොත උ. කා./ඔයබඩපේරුව උ. කා.) සඳහා 2009 වර්ෂයේ තක්සේරුව ද සත්‍යාක්ෂණය 2020 වර්ෂය සඳහා තක්සේරුව/සත්‍යාක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත්, එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) උපවගන්තියෙහි බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට හතක් (7%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2020 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2020 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවට අදාළ මුදලින් 5% ක (සියයට පහක) වට්ටමක් ද, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*10% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2020 මාර්තු 31 ට පෙර	2020 ජනවාරි මස 31	
දෙවන කාර්තුව	2020 ජූනි 30 ට පෙර		2020 අප්‍රේල් 30
තුන්වන කාර්තුව	2020 සැප්තැම්බර් 30 ට පෙර		2020 ජූලි 31
හතරවන කාර්තුව	2020 දෙසැම්බර් 31 ට පෙර		2020 ඔක්තෝබර් 31

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-1334/1

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වැනි වගන්ති යටතේ අක්කර බදු පැනවීම - 2020

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති, අතුකෝරළ ආරච්චිලාගේ ප්‍රියන්ත පුෂ්පකුමාර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත පිහිටියා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර එකක් මත 2020 වර්ෂය සඳහා රුපියල් 50 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කළ යුතු බවටත්,

තව ද, ඉහත කී පනතේ 134 (3) වන වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද නියම කිරීමේ හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් සළකනු ලබන බව අංක 450/6 හා 1989.02.03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති නියමයන්ට ඇතුළත් අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර පහකට අඩු ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ හෙක්ටයාර එකක් සඳහා 2020 වර්ෂයට රුපියල් පනහක් (රු. 50.00) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කළ යුතු බවටත්,

තව ද, 2020 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර, එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2020 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවකට මුදලින් 5% ක වට්ටමක් ද, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත්, 2019 සැප්තැම්බර් මස 10 වන දිනැති සභා තීරණ අංක ඉ (02) යටතේ සභා සම්මත වූ බව නිවේදනය කරමි. එනම්,

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*10% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2020 මාර්තු 31 ට පෙර	2020 ජනවාරි 31	
දෙවන කාර්තුව	2020 ජූනි 30 ට පෙර		2020 අප්‍රේල් 30
තුන්වන කාර්තුව	2020 සැප්තැම්බර් 30 ට පෙර		2020 ජූලි 31
හතරවන කාර්තුව	2020 දෙසැම්බර් 31 ට පෙර		2020 ඔක්තෝබර් 31

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-1334/2

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 155, 159 (1) හා 161 වගන්ති අනුව වරෙන්තු ගාස්තු පැනවීම - 2020 වර්ෂය

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති, අතුකෝරළ ආරච්චිලාගේ ප්‍රියන්ත පුෂ්පකුමාර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) හා 161 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රකාශිත වරිපනම් බදු හා කුළී ගාස්තු අය කිරීමේ දී නිශ්චිත කාලසීමාව තුළ ගෙවීම පැහැර හරින්නන් වෙත වරෙන්තු ගාස්තුවක් පහත සඳහන් පරිදි පනවා අයකළ යුතු බවට 2019 සැප්තැම්බර් මස 10 වන දිනැති සභා තීරණ අංක ඉ (03) යටතේ සභා සම්මත වූ බව, නිවේදනය කරමි. එනම්,

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1. අයවිය යුතු බද්දේ හෝ කුළියේ ප්‍රමාණයෙන් 10%ක් ද,
2. හිස්බිම් හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් අය විය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 15%ක් ද,
3. හිස්බිම් හා නිවාස ස්ථාන නොවන දේපළ සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 20% ක් ද, අය කළ යුතු වේ.

11-1334/3

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2020

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති, අතුකෝරළ ආරච්චිලාගේ ප්‍රියන්ත පුෂ්පකුමාර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (i) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔවුන්ගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන

අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලැබෙන මුදලින් 1% කට සමාන බද්දක් එකී වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ අනු නියෝජිතයා විසින් අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත්, එකී බද්ද පෙර වර්ෂවල මෙන් 2020 වර්ෂයේ ද අය කළ යුතු බවත්, 2019 සැප්තැම්බර් මස 10 වන දිනැති සභා තීරණ අංක ඉ (04) යටතේ සභා සම්මත වූ බව, නිවේදනය කරමි. එනම්,

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-1334/4

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා පැනවෙන බදු - 2020 වර්ෂය

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති, අතුකෝරළ ආරච්චිලාගේ ප්‍රියන්ත පුෂ්පකුමාර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් (2%) වන බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) (ආ) ඡේදය යටතේ වන "සමානුපාතය" වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය නියමිත ප්‍රමාණයට වඩා අඩු විය යුතු බවටත්, 2019 සැප්තැම්බර් මස 10 වන දිනැති සභා තීරණ අංක ඉ (05) යටතේ සභා සම්මත වූ බව, නිවේදනය කරමි. එනම්,

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-1334/5

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

රථ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම - 2020

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති අතුකෝරළ ආරච්චිලාගේ ප්‍රියන්ත පුෂ්පකුමාර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 148 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදාළව නියම කර අය කිරීමට 2019 සැප්තැම්බර් මස 10 වන දිනැති සභා තීරණ අංක ඉ (06) යටතේ සභා සම්මත වූ බව, නිවේදනය කරමි. එනම්,

උපලේඛනය

	I වැනි තීරය	*II වැනි තීරය* රු. ශත
1.	මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක් හෝ කරත්තයක්, ජින් රික්ෂෝවක් හෝ බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුව	25 0
	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ කරත්තයක් සඳහා -	
	(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
2.	සෑම කරත්තයක් සඳහා	20 0
3.	සෑම අත් කරත්තයක් සඳහා	10 0
4.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
5.	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
6.	සෑම ඇතෙකු සඳහා	50 0

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළඳ කාර්ය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-1334/6

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

109 වගන්තිය අනුව 2020 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අය කිරීම

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති, අතුකෝරළ ආරච්චිලාගේ ප්‍රියන්ත පුෂ්පකුමාර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109 වගන්තිය අනුව පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදාළව වෙනත් ගාස්තු නියම කර අයකළ යුතු බවට 2019 සැප්තැම්බර් මස 10 වන දිනැති සභා තීරණ අංක ඉ (07) යටතේ සභා සම්මත වූ බව, නිවේදනය කරමි. එනම්,

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

	විස්තරය	*රු. ශත*
01.	සුසාන භූමිවල ස්මාරක ඉදි කිරීම (උපරිම උස අඩි 06) - වර්ග අඩියට	500.00
02.	සුසාන භූමිවල තැන්පත් කිරීම සඳහා (උපරිම උස අඩි 06) - වර්ග අඩියකට	500.00
03.	ආදාහනාගාර වෙන් කිරීම :	
	- බල ප්‍රදේශය තුළ සිදුවන එක් ආදාහනයක් සඳහා	රු. 5,500 + 300.00 (සේවා ගාස්තු)
	- බල ප්‍රදේශයෙන් පිටත සිදුවන එක් ආදාහනයක් සඳහා	රු. 6,500 + 300.00 (සේවා ගාස්තු)
04.	ගලි බවුසරය වෙන් කිරීම :	
	- බල ප්‍රදේශය තුළ - නිවාස	3,350.00
	- ව්‍යාපාරික ස්ථානය	6,200.00
	- ආගමික	3,050.00
	- රාජ්‍ය	3,850.00
	(මෙම මුදලට NBT හා VAT එකතු විය යුතුය.)	
	- බල ප්‍රදේශයෙන් පිටත - නිවාස	4,000.00
	- ව්‍යාපාරික ස්ථාන	6,750.00
	- ආගමික	3,000.00
	- රාජ්‍ය	3,500.00

(මෙම මුදලට NBT සහ VAT එකතු විය යුතු අතර ප්‍රවාහන ගාස්තු ලෙස කි. මී. 01ක් සඳහා රු. 80.00 ක් එකතු වේ.)

05.	ශාලා ගාස්තු -	
	- ප්‍රධාන කාර්යාලයේ රැස්වීම් ශාලාව (දිනකට)	
	බල ප්‍රදේශය තුළ	6,000.00
	බල ප්‍රදේශයෙන් පිටත	7,500.00
	- ඔයබඩපේරුව උප කාර්යාලයේ රැස්වීම් ශාලාව (දිනකට)	
	ආසන සමග ශාලාව	5,000.00
06.	(i) මාර්ග පළුදු කිරීම හේතුවෙන් අය කිරීම හේතුවෙන්,	
	අය කරනු ලබන 1. බොරළු	325.00
	2. තාර	700.00
	3. කොන්ක්‍රීට්	1,500.00
	4. කාපට්	4,000.00
	(ii) මාර්ග භාවිතයට අවසර ගැනීම (මාර්ග හානි සඳහා) කිලෝමීටරයක් සඳහා ආපසු ගෙවන රු. 50,000.00 ක තැන්පතුවක් (හානිය සඳහා අයකර ගැනීමට යටත්ව)	10,000.00
07.	ප්‍රාදේශීය සභා භූමියේ රථ ගාල් සඳහා වාහන නැවතුම් ගාස්තු අයකිරීම (පැයකට) :	
	1. මෝටර් සයිකලයක් සඳහා	20.00
	2. ත්‍රීවීල් රථයක් සඳහා	30.00
	3. කාර්/වෑන් සඳහා	50.00
	4. ලොරි/බස් සඳහා	100.00
	(වැඩි වන සෑම පැයකටම රු. 10.00 බැගින් අයකළ යුතුය.)	

08. කොම්පෝස්ට් පොහොර :

ප්‍රමාණය Kg		*මිල* *රු. ශත*
02		30 0
50-250 දක්වා	1Kg ක්	12 0
250 - 1,000 දක්වා	1Kg ක්	10 0
1,000ට වැඩි	1Kg ක්	08 0

		රු. ශත
09.	ජල බවුසරය සඳහා ප්‍රවාහන ගාස්තුව	4,000.00
	ජල ගාස්තුව	525.00
	සති අන්තය සඳහා රු. 200.00 ක අමතර ගාස්තුවක් අය කරයි.	

රඳවාගෙන සිටීමේ ගාස්තුව,

පළමු පැය නිදහස්
දෙවන පැයේ සිට වැඩි වන සෑම පැයකටම රු. 500.00 බැගින්,
(VAT හා NBT අදාළ වේ.)

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-1334/7

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

1947/6 හා 2015/12/28 දින පළාත් සභාව විසින් සම්මත කරන ලද අතුරු ව්‍යවස්ථාව අනුව ගාස්තු අය කිරීම

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති, අතුකෝරළ ආරච්චිලාගේ ප්‍රියන්ත පුෂ්පකුමාර වන මම, 1947/6 හා 2015/12/28 දින පළාත් සභාව විසින් සම්මත කරන ලද අතුරු ව්‍යවස්ථාව, අංක 1989, 2016/10/14 දින *ගැසට් පත්‍රයේ* පළකර 2017/01/01 වැනි දින සිට අදාළවන පරිදි අත්තනගල්ල ප්‍රාදේශීය සභාව විසින් වැළඳගැනීමෙන් පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදාළව ගාස්තු අයකිරීමට නියම කළ යුතු බවට 2019 සැප්තැම්බර් මස 10 වන දිනැති සභා තීරණ අංක ඉ (08) යටතේ සභා සම්මත වූ බව නිවේදනය කරමි. එනම්,

		රු. ශත
1.	ගොඩනැගිලි අයදුම්පත්‍රයක්/බිම් කට්ටි/පෝරම ගාස්තු	500 0
2.	විථි රේඛා පරීක්ෂණ ගාස්තු/මාර්ග සහතික	500 0
3.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත් ගාස්තු	500 0
4.	ගොඩනැගිලි සැලැස්මේ කාලය දීර්ඝ කිරීම (වර්ෂයකට)	250 0
5.	පෙර පාසල් ගාස්තු - එක් දරුවෙකු සඳහා මසකට උපරිමය	250 0
6.	පෙර පාසල්වල ඇතුළත් වීමේ අයදුම්පත්‍ර ගාස්තු	20 0
7.	පුස්තකාල සාමාජික ගාස්තු	100 0
8.	පුස්තකාල අයදුම්පත්‍ර ගාස්තු	20 0
9.	පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීම	50 0
10.	ඔප්පු සාරාංශ අයදුම්පත්‍ර ගාස්තු	50 0
11.	ඔප්පු සාරාංශ පරීක්ෂණ ගාස්තු	300 0

12. සභාව සතු භූමි තාවකාලිකව විවිධ කාර්යයන් සඳහා ලබා දීමේ දී අයකරන ගාස්තු :

			රු. ශත
1.	I.	සභාව සතු වේයන්ගොඩ ක්‍රීඩා පිටිය මුදල් අය කිරීමේ කාර්යයක් සඳහා යොදවා ගැනීමේ දී කුළී අය කිරීම වැට් බදු රහිතව - එක් දිනක් සඳහා	5,000 0

			රු. ශත
	II.	සභාව සතු වේයන්ගොඩ ක්‍රීඩා පිටිය මුදල් අය නොකරන කාර්යයක් සඳහා යොදවා ගැනීමේ දී කුළී අය කිරීම වැට් බදු රහිතව - එක් දිනක් සඳහා	2,500 0
2.	I.	සභාව සතු නිට්ටඹුව මහජන ක්‍රීඩාපිටිය මුදල් අය කිරීමේ කාර්යය සඳහා යොදවා ගැනීමේ දී කුළී අය කිරීම වැට් බදු රහිතව - එක් දිනක් සඳහා	10,000 0
	II.	සභාව සතු නිට්ටඹුව මහජන ක්‍රීඩාපිටිය මුදල් අය නොකරන කාර්යයන් සඳහා යොදවා ගැනීමේ දී කුළී අය කිරීම වැට් බදු රහිතව - එක් දිනක් සඳහා	4,000 0
3.		නිට්ටඹුව හා වේයන්ගොඩ ක්‍රීඩාභූමිය සංගීත සංදර්ශන, සැණකෙළි සඳහා එක් දිනකට වෙන් කිරීමේ දී කොන්දේසි මත ආපසු ගෙවන රු. 50,000 ක් ද තැන්පත් කළ යුතු ය.	
4.		ඉහත ස්ථාන හැර ප්‍රාදේශීය සභාව සතු සියලුම ක්‍රීඩා පිටි සඳහා කුළී අය කිරීම වැට් බදු රහිතව එක් දිනක් සඳහා	2,500 0
5.		නාගරික ප්‍රදේශය තුළ පිහිටි සභාවට අයත් විවෘත බිම් කුළියට දීමට වර්ග අඩියක් සඳහා වැට් බදු රහිතව එක් දිනකට සභාව තීරණය කරනු ලබන වෙළඳ කාර්යයන් සඳහා පමණයි (උපරිමය දින 14)	10 0
03.	I.	වීථිරේඛා සහතිකයක්/නොපවරා ගැනීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා	500 0
	II.	වරිපනම් ලේඛනයේ උධෘත සනාථ කරන සහතික (වර්ෂ ගණනාවක් සම්බන්ධයෙන් උධෘත ලබා ගැනීමේ දී වැඩිවන එක් වර්ෂයක් සඳහා එක් අවුරුද්දකට රු. 100 බැගින් වැඩිවේ.)	500 0
	III.	නිකුත් කරන ලද තක්සේරු නිවේදන සනාථ කරන සහතික	500 0
04.		ලියාපදිංචි ත්‍රිරෝද රථ සංගමයක එක් ත්‍රිරෝද රථයක් සඳහා (මෙම මුදලට NBT හා VAT එකතු විය යුතුය.)	100 0

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-1334/8

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති අතුකෝරළ ආරච්චිලාගේ ප්‍රියන්ත පුෂ්පකුමාර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට එනම්, 2019 සැප්තැම්බර් මස 10 වන දිනැති සභා තීරණ අංක ඉ (09) යටතේ සභා සම්මත වූ බව, නිවේදනය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන උපවගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් අත්තනගල්ල ප්‍රාදේශීය

සභා ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන් ම එම ව්‍යාපාරයේ 2019 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා නියම විය යුතු බවට නිවේදනය කරමි.

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

පළමුවන උපලේඛනය

I වැනි තීරුව *වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *ගෙවිය යුතු වාර්ෂික බද්ද* *රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

11-1334/9

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

කර්මාන්ත බදු පැනවීම - 2020

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති අතුකෝරළ ආරච්චිලාගේ ප්‍රියන්ත පුෂ්පකුමාර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2019 සැප්තැම්බර් මස 10 වන දිනැති සභා තීරණ අංක ඉ (10) යටතේ සභා සම්මත වූ බව, නිවේදනය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අත්තනගල්ල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා නියම විය යුතු බවට නිවේදනය කරමි.

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
			පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	පුවක් වේලා සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
2.	ලේ හෝ අතුණුබහන් උණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
3.	ලී වේලීම සඳහා	500 0	750 0	1,000 0
4.	යන්ත්‍රානුසාරයෙන් රබර් ෂීට් නිපදවීම හා දුම් ගැසීම	500 0	750 0	1,000 0
5.	අත්යන්ත්‍ර මාර්ගයෙන් රබර් ෂීට් නිපදවීම හා දුම් ගැසීම	500 0	750 0	1,000 0
6.	ප්ලාස්ටික් වැල් හෝ වේවැල් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් සඳහා	500 0	750 0	1,000 0
7.	දුම්කොළ වේලා සකස් කිරීම සඳහා	500 0	750 0	1,000 0
8.	සුරුට්ටු නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
9.	පැණි නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
10.	බීඩි, නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
11.	කොප්පරා නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
12.	දත් බෙහෙත් නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
13.	කපාපු පොල් නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
14.	හුණු නිපදවීමට පෝරණුවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
15.	ගම් නිපදවීම	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රානුසාරයෙන් හෝ විදුලි බලයෙන් ක්‍රියා කරන (බලවේග, නූල් කටින) හෝ රෙදි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
17.	ඇඟලුම් කම්හලක් (ගාමන්ට්) පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
18.	ප්ලාස්ටික් බඩු, ප්ලාස්ටික් නාම පුවරු හා ප්ලාස්ටික් ද්‍රව්‍ය නිපදවීම	500 0	750 0	1,000 0
19.	යන්ත්‍රානුසාරයෙන් සපත්තු හෝ පාවහන් නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
20.	රබර් අත්වැසුම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
21.	කුඩාරම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
22.	කාඩ්බෝඩ් පෙට්ටි නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	ප්‍රමාණයෙන් ටොන් 01ක් ඉක්මවන සත්ත්ව ආහාර නිෂ්පාදන ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	වතුර බෝතල් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	දැව පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	මෙතිලේටඩ් ස්ප්‍රීතු නිපදවීම හෝ ගබඩා කිරීම සඳහා	500 0	750 0	1,000 0
27.	කපු පුළුන් නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
28.	එක් අයෙකුට වැඩි දෙනෙකු සේවය කරන ස්ථානයක ආහරණ නිපදවීම	500 0	750 0	1,000 0
29.	එක් අයෙකුට වැඩි දෙනෙකු සේවය කරන ස්ථානයක යකඩ කම්හලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
30.	විදුලි බලයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
31.	අත්යන්ත්‍ර මගින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
32.	තේ කොළ පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
33.	ඩුප්ලෝ යන්ත්‍ර භාවිතා කර මුද්‍රණ කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
34.	මිශ්‍ර හෝ කෘතිම පොහොර නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
35.	වීදුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
36.	යන්ත්‍රෝපකරණ හා යන්ත්‍රානුසාරයෙන් අමතර කොටස් එකළස් කිරීම සඳහා	500 0	750 0	1,000 0
37.	සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
38.	කළු ගල් පිපිරවීම සඳහා	500 0	750 0	1,000 0
39.	කරවල වේලීම සඳහා	500 0	750 0	1,000 0
40.	මිරිස්, ගෝනි, පිටි ධාන්‍ය හෝ කුළු බඩු හෝ වෙනත් ඇට වර්ග ඇඹරීම සඳහා	500 0	750 0	1,000 0
41.	අත්යන්ත්‍ර මගින් ක්‍රියාකරන ලී මෝල්ක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
42.	අම්ලකර වායුව (ඔක්සිජන්) භාවිතා කරන යකඩ කම්හලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
43.	අ. බ. 10 හා 20 අතර වූ වී මෝල්ක් සඳහා ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
44.	අ. බ. 20 ට අධික වූ වී මෝල්ක් සඳහා ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
45.	යන්ත්‍රානුසාරයෙන් ගඩොල් හෝ උළු පිළිස්සීම	500 0	750 0	1,000 0
46.	යන්ත්‍රානුසාරයෙන් නොව අන් අයුරකින් ගඩොල් හෝ උළු පිළිස්සීම	500 0	750 0	1,000 0
47.	බැටරි චාජ් කිරීම සඳහා	500 0	750 0	1,000 0
48.	හුණු ගල් පිළිස්සීම, රෑස් කිරීම, වේලීම හා කැබලිවලට කැඩීම සඳහා	500 0	750 0	1,000 0
49.	යාන්ත්‍රික බලයෙන් ක්‍රියාකරන ටයර් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
50.	ටයර් හෝ ට්‍යුබ් වෝල්කනයිසින් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
51.	රෙදි මුද්‍රණය කිරීම හා පින්තාරු කිරීම සඳහා	500 0	750 0	1,000 0
52.	විද්‍යුත් ලෝහාලේපනය කිරීම සඳහා යාන්ත්‍රික බලයෙන් ක්‍රියා නොකරන ගරාජයක් හැර වෙනත් ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
53.	බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
54.	බෙලෙක් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
55.	වඩු වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
56.	ගෘහ භාණ්ඩ නිපදවීමේ සාප්පුවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
57.	තෙල් නිෂ්කර්ෂණය කිරීම සඳහා යන්ත්‍රයක් හෝ සෙක්කුවක් තබා ගැනීම	500 0	750 0	1,000 0
58.	විදුලි උපකරණ හෝ රේඩියෝ අළුත්වැඩියා කිරීමේ සාප්පුවක් හෝ රේඩියෝ කර්මාන්ත ශාලාවක් සඳහා	500 0	750 0	1,000 0
59.	රස කැවිලි නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
60.	තේ පෙට්ටි නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
61.	පොල්කටු අඟුරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
62.	සෙල්ලම් බඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
63.	නූල් කෝන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
64.	තලාතූ මිනිරන් වේලීම සඳහා	500 0	750 0	1,000 0
65.	ගෙන්දගම් දුම් ගැසීමෙන් කුරුඳු, එනසාල් හෝ කොහු වේලීම සඳහා	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
66.	මාළු වරල් වේලීම හෝ සකස් කිරීම සඳහා	500 0	750 0	1,000 0
67.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ ග්‍රැනයිට් ගැනීම සඳහා	500 0	750 0	1,000 0
68.	හුණු ගල් කැඩීම	500 0	750 0	1,000 0
69.	කපු නූල් සායම් පොඟවා නිම කිරීම සඳහා	500 0	750 0	1,000 0
70.	සයිලන්සර් නිපදවීමේ කර්මාන්ත ශාලාවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
71.	මේද නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
72.	යන්ත්‍රානුසාරයෙන් තෙල් නිෂ්කර්ෂණය කිරීම සඳහා	500 0	750 0	1,000 0
73.	යන්ත්‍රානුසාරයෙන් ඇටකටු ඇඹරීම සඳහා	500 0	750 0	1,000 0
74.	තෙල් මෝලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
75.	පෑස්සීමේ හෝ අම්ලකර පෑස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
76.	ලියවන පට්ටලයක් භාවිතා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
77.	මෝටර් ගරාජයක් සහිතව හෝ මෝටර් වාහන සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
78.	කොහු හෝ කෙඳි වර්ග නිපදවීම හෝ කොහු කෙඳි වර්ගවලින් සාදනු ලබන භාණ්ඩ නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
79.	ලී පෙඟවීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
80.	ඇළුමිනියම් බඩු නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
81.	යන්ත්‍ර නොමැතිව ගඩොල් හෝ උළු නිපදවීම	500 0	750 0	1,000 0
82.	ගල් කැඩීම පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
83.	යන්ත්‍රානුසාරයෙන් ගල් කැඩීම සඳහා	500 0	750 0	1,000 0
84.	යන්ත්‍රානුසාරයෙන් කුට්ටි ගල් කැඩීම හා ඉරීම සඳහා	500 0	750 0	1,000 0
85.	මැණික් වෙළෙඳුන් මැණික් කපා ඔප දැමීම සඳහා	500 0	750 0	1,000 0
86.	සීනි බෝල හා ද්‍රව ග්ලූකෝස් නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
87.	යන්ත්‍ර නොමැතිව සපත්තු හෝ පාවහන් නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
88.	අත් යන්ත්‍ර මාර්ගයෙන් පෙට්ටි නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
89.	හකුරු නිපදවීම	500 0	750 0	1,000 0
90.	කම්මලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
91.	ගිනි පෙට්ටි නිෂ්පාදනය සඳහා	500 0	750 0	1,000 0
92.	ආයුර්වේද ඖෂධ වර්ග, තෙල් වර්ග නිෂ්පාදනය සඳහා	500 0	750 0	1,000 0
93.	සබන් නිෂ්පාදනය කිරීම සඳහා	500 0	750 0	1,000 0
94.	බුරුසු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
95.	ඉලාස්ටික් පටි නිපදවීම	500 0	750 0	1,000 0
96.	විකල්ප බලශක්ති උත්පාදනය	500 0	750 0	1,000 0
97.	විෂබීජ නාශක හා පරවිත්‍රකාරක නිපදවීම	500 0	750 0	1,000 0
98.	මැටි භාණ්ඩ ගබඩා කිරීම, විකිණීම හා නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
99.	පොල් ලෙලි පෙඟවීම සඳහා වලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
100.	කොන්ක්‍රීට් උළු බට හෝ වෙනත් කොන්ක්‍රීට් භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
101.	වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා ගබඩා කිරීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත.	*රු. ශත.*	*රු. ශත.*
102.	රා තැබෑරුමක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
103.	වී තම්බා වේලන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා (වී මෝලක්)	500 0	750 0	1,000 0
104.	වතුර පොම්ප හා වෙනත් යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
105.	කරත්ත අළුත්වැඩියා කරන හා සාදන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා (වෑල්ඩිං වැඩපළක් රහිතව)	500 0	750 0	1,000 0
106.	මෝටර් රථ බොඩි සාදන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
107.	බතික් වැඩපොළක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
108.	ඇඳුම් මසන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
109.	සිමෙන්ති ග්‍රිල් වැඩපොළක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
110.	රබර් සීල් සෑදීම සඳහා හා ප්ලාස්ටික් නාම පුවරු සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
111.	ලී බීරළු කැපීම	500 0	750 0	1,000 0
112.	කොහු මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
113.	වීදුරු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
114.	යන්ත්‍රානුසාරයෙන් ලාම්පු චිමිනි වැඩ දැමීම	500 0	750 0	1,000 0
115.	කඩදාසි කපන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
116.	ඔරලෝසු අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
117.	යාන්ත්‍රික වඩු කාර්මික ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
118.	වාහන එන්ජින් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
119.	සපත්තු අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
120.	රෙදි විවීමේ ස්ථානයක් (පෞද්ගලික) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
121.	මෝටර් රථ පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
122.	ඇස් කණ්නාඩි රාමු නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
123.	ගරාජයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
124.	මිනිරන් වේලීම හා ගබඩා කර තැබීම සඳහා	500 0	750 0	1,000 0
125.	කොහු නිපදවීම හෝ ගබඩා කිරීම සඳහා	500 0	750 0	1,000 0
126.	විවීමේ යන්ත්‍රාගාර පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
127.	නූල් කැටීමේ යන්ත්‍රාගාර පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
128.	නිම කිරීමේ යන්ත්‍රාගාර පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
129.	ඉන්ජෙක්ටර් පොම්ප අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
130.	ජංගම දුරකථන අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
131.	ප්ලාස්ටික් උපකරණ හෝ සෙල්ලම් බඩු නිපදවීම	500 0	750 0	1,000 0
132.	සංගීත භාණ්ඩ අලෙවි කිරීම හා අලුත්වැඩියාව	500 0	750 0	1,000 0

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2020

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2020 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2019 සැප්තැම්බර් මස 10 වන දිනැති සභා තීරණ අංක ඉ (11) යටතේ සභා සම්මත වූ බව, නිවේදනය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා අත්තනගල්ල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2020 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2019 වර්ෂයේ ලැබීම්වලින් 1% ක බලපත්‍ර ගාස්තුවක් ලෙස 2020 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම නිවේදනය කරමි.

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

147, 149 වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ විස්තරය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	භෝජනාගාරයක් (හෝටලයක්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
5.	මස් විකිණීම	500 0	750 0	1,000 0
6.	අවමංගල සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	කිරි විකිණීම	500 0	750 0	1,000 0
10.	ආහාර වෙළෙඳාම	500 0	750 0	1,000 0
11.	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
අනු. අංකය	*වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ විස්තරය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
13.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ගවගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ගෝඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	පොදු වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	කොණ්ඩා සැකසීම සැළුන්හල් හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
පීඩාකාරී ව්‍යාපාර :				
1	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
2	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
3	සම් විකිණීම	500 0	750 0	1,000 0
4	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
5	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
6	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7	විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
8	කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
9	පොල්කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
10	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12	පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
14	සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
15	අළුත් හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
16	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
17	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
18	වේවැල් භාණ්ඩ නිපදවීම හා ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
19	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
21	රසකැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
22	පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
23	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
24	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
25	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
26	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
27	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දූව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

අනු. අංකය	වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ විස්තරය	I වැනි තීරුව රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත	II වැනි තීරුව රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත	 රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත
28	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
29	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
30	සම්භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
31	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
32	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශ භෝග, කුළු බඩු හෝ කිරිපිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
33	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
34	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
35	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
36	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
37	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
38	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
39	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
40	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
41	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
42	ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
43	සිමෙන්ති කිලෝග්‍රෑම් 1000ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
44	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
45	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
46	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
47	පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
48	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම	500 0	750 0	1,000 0
49	ධාන්‍ය හෝ මාංශ භෝග කිලෝග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
	අන්තරාදායක ව්‍යාපාර :			
1	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
2	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
3	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළු ගාලක් හෝ කුකුළු කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
6	ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
7	දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8	කළුගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
9	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
අනු. අංකය	*වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ විස්තරය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
10	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11	ගිනි පෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
12	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
15	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම	500 0	750 0	1,000 0
16	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
17	පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
18	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
19	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0
20	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
21	දූව ගබඩා කිරීම	500 0	750 0	1,000 0
22	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
23	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
24	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
25	ශීත කල මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
ජීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර :				
1	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම	500 0	750 0	1,000 0
2	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් කිරීම	500 0	750 0	1,000 0
3	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් කිරීම	500 0	750 0	1,000 0
4	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අළුහුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
6	බැටරි විද්‍යුත් ආරෝපන කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8	මොටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
9	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10	බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වගෙන යාම	500 0	750 0	1,000 0
12	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
13	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදනය කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ විස්තරය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
15	කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
16	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
18	පැට්‍රල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0 500 0	750 0 750 0	1,000 0 1,000 0
19	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
20	වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
21	විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

11-1334/11

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු අය කිරීම - 2020

1988 අංක 56 හා අංක 2000 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1133/16 දරන වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 25 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* "ඇ" කොටසේ නියමිත ව්‍යාපෘති ලෙස ප්‍රකාශිත පහත සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම අලුත් කිරීම, අවලංගු කිරීම, ප්‍රතික්ෂේප කිරීම සහ අත්හිටුවීම මෙම සභාවේ අධිකාරි බලය යටතේ සිදු කරනු ලබන බවට 2019 සැප්තැම්බර් මස 10 වන දිනැති සභා තීරණ අංක ඉ (12) යටතේ සභා සම්මත වූ බව, නිවේදනය කරමි. එනම්,

1. සියලුම වාහන ඉන්ධන පිරවුම්හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු)
2. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හා 25 ට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල්තෙල් සිඳීමේ කර්මාන්ත
4. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හා 25 ට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
5. වියළි ක්‍රියාවලි සහිත වී මෝල්
6. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 1,000 කට අඩුවන ඇඹරුම්හල්
7. දුම්කොළ වේලීමේ කර්මාන්ත
8. සල්ෆර් දුම්ගැසීම සහිත එක් ක්‍රියාවලියක දී නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 5,000 ක් හෝ ඊට වැඩි ධාරිතාවයක් සහිත කුරුඳු ගැසීමේ කර්මාන්ත
9. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත
10. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා

11. කොන්ක්‍රීට් පෙර සවි කර්මාන්ත
12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
13. දිනකට මෙට්‍රික් ටොන් 20කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත හුණු පෝරණු
14. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයින් 25 ට අඩු සංඛ්‍යාවක් නියුක්ත පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
15. සියලු බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත
16. උළු සහ ගඩොල් කර්මාන්ත
17. එක් වරකට බෝර වලක් බැගින් පුපුරවමින් මසකට ඝණ මීටර් 600 ක නිෂ්පාදන ධාරිතාවයකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදුකරනු ලබන කැනීම්
18. දිනකට ඝණ මීටර් 50 ට අඩු දැව ඉරුම් ධාරිතාවයක් ඇති ලී මෝල් හෝ පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත, දැව පදම් කිරීමේ කර්මාන්ත
19. බහු කර්මාන්ත යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයන් 05 ට අඩු සංඛ්‍යාවක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත
20. නේවාසික කාමර 05 හෝ ඊට වැඩි සහ 20 ට නොඅඩු හෝටල්, ආගන්තුක නිවාස හා තානායම්
21. වාහනවල වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ/ නඩත්තු කිරීමේ හා සවි කිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුතු සිදුකරන ගරාජ හැර අනෙකුත් වාහන අලුත්වැඩියා කිරීමේ/නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන ගරාජ
22. ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීම හා සවිකිරීම සිදු කරන ස්ථාන
23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලු පර්යන්ත
24. සේවකයින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අලුත්වැඩියා කිරීමේ ස්ථාන
25. ඊයම් උණු කිරීම සිදුකිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

කර්මාන්ත පරීක්ෂා කිරීමේ ගාස්තුව :

1. උපරිම ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපෘතියේ මූලික ප්‍රාග්ධන ආයෝජනය පදනම් කොට ගෙන නිශ්චය කරනු ලැබේ. පහත දැක්වෙන පරිදි උපරිමයට යටත්ව පරීක්ෂා කිරීමේ ගාස්තුව අයකර ගැනීම නිර්දේශ කෙරේ.

ආයෝජනය	*පරීක්ෂා කිරීමේ ගාස්තුව (උපරිම)* *රු. ශත*
1. රු. 250,000 හෝ ඊට අඩු	3,000 0
2. රු. 250,000 - 500,000 දක්වා	3,750 0
3. රු. 500,001 - 1,000,000 දක්වා	5,000 0
4. රු. 1,000, 000 වැඩි	10,000 0
* පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අයදුම් පත්‍ර ගාස්තුව	100 0
* පරිසර බලපත්‍රය අලුත් කිරීම සඳහා අයදුම්පත්‍ර ගාස්තුව	50 0
* පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව	4,000 0

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-1334/12

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් ගාස්තු පැනවීම - 2020

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වගන්තියෙන් අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2015 දෙසැම්බර් මස 28 වැනි දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv (ආ) කොටසේ පළාත් සභා *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් පරිශ්‍රයකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශයනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිශ්‍රයකට, 2020 වර්ෂය සඳහා ගාස්තු අයකිරීමට, 2019 සැප්තැම්බර් මස 10 වැනි දිනැති සභා තීරණ අංක ඉ (13) යටතේ සභා සම්මත වූ බව, නිවේදනය කරමි.

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

	පුවරුවේ ස්වභාවය	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03ට අඩු	*මාස 03 හෝ මාස 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3ට අඩු	250.00	350.00	500.00
		3ට වැඩි	3 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500.00	750.00	1,000.00
		1ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300.00 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300.00 බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
06	ප්ලාස්ටික් පුවරු යොදාගෙන ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	750.00	850.00	1,000.00
		1ට වැඩි	1ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500.00 බැගින්		

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන්" ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019.10.18 දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:1 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන්" ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූද ඉහත කී පනතේ 135 වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූද ස්ථීර හෝ නීතිපතා ගොවිනැනක් යටතේ වූ,

(*අ*) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2020 වර්ෂය සඳහා රුපියල් දහයක් (10/-) ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත්,

(*ආ*) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු විධානය යටතේ හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2020 වර්ෂය සඳහා රුපියල් පනහක් (50/-) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත් යෝජනා කරමි,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව 2020 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික 4කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතුය.

2020 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2020 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බද්දෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

11-1359/1

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීම

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය'' හා ප්‍රකාශයට පත් කරන ලද්දා වූ සම්මත අතුරු ව්‍යවස්ථා මගින් යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019.10.18 දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:2 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (අ) හා 122-126 වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්, දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.05.17 වැනි දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 වැනි දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද සම්මත අතුරු ව්‍යවස්ථාවල i-xxx (iv හැර) දක්වා වූ කාණ්ඩවල ඇතුළත් xxviii වන ප්‍රචාරක දැන්වීම්, පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් යක්කලමුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, ගඟකට, මුහුදකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ I වන තීරුවේ විස්තර පරිදි II වන තීරුවේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

උපලේඛනය 01

	I වැනි තීරුව *විස්තරය*	*II වැනි තීරුව* *බලපත්‍ර ගාස්තුව මසක් හෝ ඉන් කොටසක් සඳහා* *රු. ශත*
I.	බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන, ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම	50 0
II.	ලෑල්ලක් හෝ ආධාරකයක් හෝ බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන, ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම	50 0
III.	චිත්‍රපට දර්ශන ප්‍රචාරය සඳහා ප්‍රදර්ශනය කරන දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම	40 0
IV.	බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රතිදීප්ත දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම	50 0
V.	තාවකාලික ප්‍රදර්ශන පුවරු (කටවුට්) සඳහා සෑම වර්ග අඩියකටම	50 0

තව ද, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා ලිත් වර්ෂයකට වර්ග අඩියකට රු. 400.00 ක මුදලක් අය කරනු ලැබේ.

11-1359/2

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තිය" ප්‍රකාර යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 2019.10.18 දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:3 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2020 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත් ගරු සභාවට යෝජනා කරමි."

උපලේඛනය

අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
		වාර්ෂික වටිනාකම රුපියල්		
		වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට	*වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	ඇළුමිනියම්, නිකල් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
03.	තේ කුඩු, කුළු බඩු පැකට් කර විකිණීම	500 0	750 0	1,000 0
04.	පා පැදි අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
05.	වී මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	යතුරු පැදි ත්‍රීවීල් අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
07.	සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
08.	ටයර් හා ටියුබ් අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
09.	විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ගුවන්විදුලි හා රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ඩිජිටල් තාක්ෂණයෙන් මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	බීරළු ලී කැටයම් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ගිනිකෙළි භාණ්ඩ නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
18.	රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	වායු සමීකරණ, ශීතකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ඉදල්, පාපිසි, කොහු ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
21.	මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	රන් රිදී ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	මැණික් කැපීමේ හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	ශීත කළ මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	වාහන සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	හුණු පිළිස්සීම, විකිණීම හා ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	කොප්පරා නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	පොල්තෙල් සෑදීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			වාර්ෂික වටිනාකම රුපියල්	
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්ම වන විට*	*වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
29.	කෘත්‍රිම දත් සකස් කරන, දත් බඳින ස්ථාන හෝ දත් ගලවන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ගල් වලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	ගල් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	වෙල්ඩින් වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
33.	කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	ඇසිඩ් වර්ග නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	ප්ලාස්ටික්, ෆයිබර් ග්ලාස් නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	ලී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	කුළුබඩු ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

11-1359/3

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය" යටතේ යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019.10.18 දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:4 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව වූ ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2020 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර යක්කල මුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට ගරු සභාවට යෝජනා කරමි".

උපලේඛන අංක - 01

I තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
(i) රු. 1 සිට රු. 6,000 දක්වා	-
(ii) රු. 6,001 සිට රු. 12,000 දක්වා	90 0
(iii) රු. 12,001 සිට රු. 18,750 0 දක්වා	180 0
(iv) රු. 18,751 සිට රු. 75,000 දක්වා	360 0
(v) රු. 75,001 සිට රු. 1,50,000 දක්වා	1,200 0
(vi) රු. 1,50,001 ට වැඩි	3,000 0

11-1359/4

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීම

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග තිබිය යුතු 149 වැනි වගන්තිය" යටතේ යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 2019.10.18 දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:5 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග තිබිය යුතු 149 වන වගන්තිය" යටතේ යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ ඇති පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති පරිදි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලපත්‍ර දෙමින් 2020 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛයෙහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා, 2020 වර්ෂය සඳහා අය කිරීමටත් මෙම වෙළඳ බලපත්‍ර ගාස්තුව 2020 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවට ගරු සභාවට යෝජනා කරමි."

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	වෙළෙඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 ඉක්ම නොයන විට* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 - රු.1,500 දක්වා* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි* *රු. ශත*
01.	බේකරියක් පැවැත්වීම	500 0	750 0	1,000 0
02.	බත් කඩයක් හෝ භෝජනාගාරයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
03.	තේ, කෝපි කඩයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
04.	ලැගුම් හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
05.	බාබර් සාප්පුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
06.	පළතුරු, එළවළු විකිණීම	500 0	750 0	1,000 0
07.	මස් වෙළෙඳසැල්	500 0	750 0	1,000 0
08.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
09.	සංචාරක වෙළඳාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	වෙළෙඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 ඉක්ම නොයන විට රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 - රු.1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත*
10.	සිසිල් බීම කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
11.	කිරි වෙළඳාම	500 0	750 0	1,000 0
12.	සත්ව පාලන	500 0	750 0	1,000 0
13.	අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර	500 0	750 0	1,000 0
14.	හොටෙල්	500 0	750 0	1,000 0

11-1359/5

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සංචාරක හෝටල් ආපනශාලා හා නවාතැන්පොළවල් සඳහා ගාස්තු අයකිරීම

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වෙනි වගන්තිය යටතේ, යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019.10.18 දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:06 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි."

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වෙනි වගන්තිය යටතේ, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, අනුමත කර හෝ පිළිගත්තා වූ ද, හෝටලයක හෝ ආපනශාලාවක හෝ නවාතැන්පොලක හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනුවන් නිකුත් කරනු ලබන බලපත්‍රය සඳහා වූ ගාස්තුව එම හෝටලයේ හෝ ආපනශාලාවේ හෝ නවාතැන්පොළේ 2019 වර්ෂය සඳහා වූ ආදායමෙන් 1%ක් අය කිරීම ගරු සභාවට යෝජනා කරමි."

11-1359/6

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වගන්තිය යටතේ යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019.10.18 දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:7 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධාන" වලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේ දී පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම එහි II වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, රුපියල් 20.00ක සේවා ගාස්තුවක් අය කිරීමට ගරු සභාව වෙත යෝජනා කරමි."

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
(i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක් කරත්තයක්, ජීප් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන ඕනෑම වාහනයක් සඳහා	25 0
(ii)	සෑම බයිසිකලයක්, ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
	(*අ*) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18 0
	(*ආ*) වෙළඳ කාර්යය නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
(iv)	සෑම අත් කරත්තයක් සඳහා	10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi)	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
(vii)	සෑම ඇතෙකු හෝ අලියෙකු සඳහා	50 0

11-1359/7

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා විනෝද බදු හා සංදර්ශන බලපත්‍ර ගාස්තු පැනවීම

''1946 අංක 12 දරන විනෝද බදු අඥාපනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය'' යටතේ යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019.10.18 දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:8 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය'' ප්‍රකාරව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත චිත්‍රපට දර්ශනයක්, මැජික් දර්ශනයක්, සර්කස් දර්ශනයක්, සෑම සංගීත දර්ශනයක් සඳහා මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍ර වටිනාකමින් 10% ක විනෝද බද්දක් අය කිරීමට ගරු සභාව වෙත යෝජනා කරමි."

11-1359/8

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා බිම් බදු පැනවීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට අයත් යක්කලමුල්ල වෙළඳ සංකීර්ණය හා බස් නැවතුම්පොළ අවට භූමිය තාවකාලික වෙළෙඳකුටි, ප්‍රචාරක වැඩ සටහන් සඳහා බිම් බදු පැනවීම සම්බන්ධයෙන් 2019.10.18 දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:9 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට අයත් යක්කලමුල්ල වෙළෙඳ සංකීර්ණය හා බස් නැවතුම්පොළ අවට භූමිය තාවකාලික වෙළෙඳ කුටි, ප්‍රචාරක වැඩ සටහන් සඳහා කුළියට දීම වෙනුවෙන් සෑම වර්ග අඩියකටම, පහත උපලේඛනයේ සඳහන් පරිදි 2020 ජනවාරි 01 වැනි දින සිට බිම් බදු අයකිරීමට ගරු සභාවට යේජනා කරමි.

උපලේඛනය

තාවකාලික වෙළඳ කුටි සඳහා,

- බදු දීම දිනක් වන විට රු. 20.00 ක්ද;
- බදු දීම දින දෙකක් වන විට රු. 18.00 ක් ද;
- බදු දීම දින තුනක් වන විට රු. 17.00 ක්ද;
- බදු දීම දින හතරක් හෝ ඊට වඩා වැඩිවන විට රු. 15.00 ක්ද.

ප්‍රචාරණ වැඩසටහන් සඳහා,

- බදු දීම දිනක් වන විට රු. 35.00 ක්ද;
- බදු දීම දින දෙකක් වන විට රු. 34.00 ක්ද;
- බදු දීම දින තුනක් වන විට රු. 33.00 ක්ද;
- බදු දීම දින හතරක් හෝ ඊට වඩා වැඩිවන විට රු. 32.00 ක්ද.

මීට අමතරව ක්‍රීඩාපිටි බදු දීමේ දී,

නැවත නිදහස් කරන ඇප තැන්පත්,

❋ *සාමාන්‍ය කටයුත්තක දී,*

- යක්කලමුල්ල ක්‍රීඩාංගනය රු. 15,000.00
- නාකියාදෙනිය ක්‍රීඩාංගනය රු. 10,000.00
- වාඩියවත්ත ක්‍රීඩාංගනය රු. 5,000.00

❋ *විනෝද කටයුත්තක දී, (සංදර්ශන, සැණකෙළි, නොමිලේ පෙන්වන සංගීත ප්‍රසංග)*

- යක්කලමුල්ල ක්‍රීඩාංගනය රු. 30,000.00
- නාකියාදෙනිය ක්‍රීඩාංගනය රු. 25,000.00
- වාඩියවත්ත ක්‍රීඩාංගනය රු. 5,000.00

❋ *විනෝද කටයුත්තක දී, (ප්‍රවේශ පත්‍ර අයකර පෙන්වන සංගීත ප්‍රසංග)*

- යක්කලමුල්ල ක්‍රීඩාංගනය රු. 30,000.00
- නාකියාදෙනිය ක්‍රීඩාංගනය රු. 25,000.00
- වාඩියවත්ත ක්‍රීඩාංගනය රු. 20,000.00

ක්‍රීඩාපිටි සඳහා බිම් බදු,

❋ සාමාන්‍ය කටයුත්තක දී, [අවුරුදු උත්සව, ක්‍රීඩා තරග (පාසල් හැර) හා රැස්වීම් (සියලුම සැණකෙළි හා සංගීත ප්‍රසංග හැර)].

- යක්කලමුල්ල ක්‍රීඩාංගනය රු. 5,000.00
- නාකියාදෙනිය ක්‍රීඩාංගනය රු. 3,500.00
- වාඩියවත්ත ක්‍රීඩාංගනය රු. 1,000.00

❋ *විනෝද කටයුත්තක දී,*

- නොමිලයේ පෙන්වන සංගීත ප්‍රසංග සඳහා රු. 10,000.00 බිම් බද්දක් ද, වෙළඳ ප්‍රචාරණ කටයුතු සඳහා රු. 7,500.00 බිම් බද්දක් ද, ප්‍රවේශ පත්‍ර අයකර පෙන්වන සංගීත ප්‍රසංග සඳහා රු. 7,500.00 ක බිම් බදු මුදලක්ද 2020.01.01 දින සිට අය කරනු ලැබේ.

රැස්වීම් ශාලාව වෙන් කිරීමේ දී,

- රැස්වීම් ශාලාව වෙන් කිරීම සඳහා රු. 7,500.00ක ඇප තැන්පතු මුදලක් හා දිනකට රු. 10,000.00 ක මුදලක් ද, මෙම ගාස්තුව සඳහා ජලය හා විදුලිය පුටු හා ශාලා පහසුකම් පමණක් අදාළ වේ.)

- රැස්වීම් සහ සම්මන්ත්‍රණ ආදිය සඳහා රැස්වීම් ශාලාව වෙන් කිරීමේ දී :

  පාසලකට හෝ ආගමික කටයුත්තකට දිනකට රු. 3,000.00 ද වෙනත් ඕනෑම රාජ්‍ය ආයතනයකට දිනකට රු. 5,000.00 ක මුදලක් ද අයකරනු ලැබේ. (මෙම ගාස්තුව සඳහා ජලය හා විදුලිය, පුටු හා ශාලා පහසුකම් පමණක් අදාළ වේ.

- ශබ්ද පරිපාලන පද්ධතිය ලබා ගැනීම සඳහා දිනකට රු. 1,500.00 ක මුදලක් ද, ප්‍රොජෙක්ටර් යන්ත්‍රය සඳහා පැය 01 කට රු. 500.00 ක මුදලක් අය කරනු ලැබේ.

කොට්ටව නාන තටාකය සඳහා ගාස්තු පහත පරිදි අය කරනු ලැබේ :

- එක් අයෙකුට පැය 01 ක් සඳහා, *රු. ශත*

  දේශීය පුද්ගලයෙකුට :

  වැඩිහිටි (වයස අවුරුදු 12ට වැඩි) 100 0
  ළමා 50 0
  විදේශීය පුද්ගලයෙකුට 300 0

  තටාකය වෙන් කිරීම සඳහා (එක් දිනකට) 20,000 0
  තටාකය වෙන් කිරීම සඳහා (එක් වරුවකට) 10,000 0
  තටාකය සහ අවට පරිසරය තුළ මංගල ඡායාරූප ගැනීම සඳහා 500 0

  සිංහල අලුත් අවුරුදු කාලය හා නත්තල් කාලය සඳහා තටාකය වෙන් කිරීමට,

  අප්‍රේල් 12 දින සිට සතියක කාලයක් තුළ දිනකට 30,000 0
  දෙසැම්බර් 24 දින සිට සතියක කාලයක් තුළ දිනකට 30,000 0

රථ ගාල සඳහා බිම් බදු පහත පරිදි අය කරනු ලැබේ.

	රු. ශත
පා පැදියකට	10.00
යතුරු පැදියකට	20.00
ත්‍රී රෝද රථයකට	30.00
මෝටර් කාර්/වෑන්	50.00
පැයකට අඩු ලොරි/බස්	60.00
පැයකට වැඩි ලොරි/බස්	100.00
පැයකට වැඩි වෑන්/කාර්	80.00

පැය 03න් පසු මුදල මෙන් දෙගුණයකි.

බදු කුලී -

සභාව සතු වත්කම් සභාව විසින් තීරණය කරනු ලබන අවම ලංසුව අනුව ටෙන්ඩර් කර කුලියට දීමට කටයුතු කරනු ඇත.

ටෙන්ඩර් අයදුම්පත්‍ර ගාස්තුව රු. 1,000 0

11-1359/9

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර වෙනුවෙන් ගාස්තු අය කිරීම

යක්කලමුල්ල ප්‍රදේශීය සභාව විසින් 2020 වර්ෂය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2019.10.18 දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:10 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1533/16 දරන වර්ෂ 2008 ක්වූ ජනවාරි මස 25 දිනැති *ගැසට් පත්‍රයේ* (ඇ) උපලේඛනයෙන් හා 2008 ක්වූ පෙබරවාරි මස 01 දිනැති අංක 1534/18 දරන *ගැසට් පත්‍රයේ* සඳහන් පරිදි පැවරී ඇති බලය අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවරා දී ඇති බලතල ප්‍රකාරව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආරම්භ කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර හා කර්මාන්ත සඳහා එකවර වසර තුනක කාල පරිච්ඡේදයක් සඳහා රු. 4,000 ක් වූ පරිසර බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි."

එසේම පරිසර බලපත්‍ර සඳහා වන පරීක්ෂණ ගාස්තු නව කර්මාන්ත සඳහා හා නැවත බලපත්‍ර අලුත් කිරීමේදී පහත පරිදි ගෙවිය යුතු ය :-

මූලික ආයෝජනය	*පරීක්ෂණ ගාස්තු* *රු. ශත*
රු. 2,50,000 දක්වා	3,000 0
රු. 2,50,001 - රු. 5,00,000 දක්වා	3,750 0
රු. 5,00,001 - රු. 10,00,000 දක්වා	5,000 0
රු. 10,00,000 ට වැඩි	10,000 0

11-1359/10

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේදී ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2019.10.18 දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 5:11 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සිදුකරන අතර, එක් සැපයුම්කරුවෙකුගෙන් පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් සැපයුම්කරුවන්ගෙන් II තීරුවේ සඳහන් පරිදි ලියාපදිංචි ගාස්තුවක් අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.".

උපලේඛනය

I තීරුව	*II තීරුව* *රු. ශත*
•ලිපිද්‍රව්‍ය සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•විදුලි උපකරණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•වාහන අළුත්වැඩියාවට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•වාහන සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•සියලුම වර්ගයේ හාඩ්වෙයාර් බඩු සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•පරිගණක හා උපාංග සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•කාර්යාලීය උපකරණ (රෝනියෝ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ගණක යන්ත්‍ර ආදිය සැපයීම) සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•වාහන අමතර කොටස්, ටයර් හා ටියුබ් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•කොන්ක්‍රීට් භාණ්ඩ හා හියුම් පයිප්ප සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•සනීපාරක්ෂක උපකරණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•පරිසනක අළුත්වැඩියාව හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•කාර්යාලීය ලී බඩු හා වානේ කබඩ් ඇතුළු අනෙකුත් උපකරණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•මුද්‍රණ සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•පළිබෝධ නාශක හා කෘමි නාශක සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•පුස්තකාල පොත් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•ආදාහනාගාර අලුත්වැඩියා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•කොන්ත්‍රාත් සැපයුම්කරුවන් ලියාපදිංචි කරීම	1,000 0
•රබර් මුද්‍රා හා දින මුද්‍රා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•නාමපුවරු හා දැන්වීම් පුවරු සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
•සමරු තිළිණ හා පදක්කම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සහතිකපත් සහ වෙනත් ආදායම් මත ගාස්තු පැනවීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂය සඳහා සහතිකපත් සහ වෙනත් ආදායම් මත ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් 2019.10.18 වැනි දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:12 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ය්‍. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට අයත් නිශ්චල සහ චංචල දේපළ දෛනික කුළී පදනම මත වෙනත් ආදායම් සඳහා 2020 වර්ෂය සඳහා පහත උපලේඛනයේ I තීරයේ සඳහන් අයිතමය සඳහා II තීරයේ සඳහන් ගාස්තුවක් පනවා අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

I තීරුව	*II තීරුව* *රු. ශත*
• අනතුරුදායක ගස් සඳහා වන අයදුම්පත්‍ර ගාස්තු	1,500 0
• නඩුවක් පවතින විට අනතුරුදායක ගස් සඳහා වන අයදුම්පත්‍ර ගාස්තු	2,000 0
• අනතුරුදායක ගස් සඳහා වන පරීක්ෂණ ගාස්තු :	
* කොස්, දෙල්, නැදුන්, තෙක්ක, බුරුත, මහෝගනී ගසක් සඳහා	1,500 0
* වෙනත් ගස් සඳහා	1,000 0
පඳුරු සහිත ගස් (උණ, බට පඳුරු ආදිය)	
01-05ත් අතර	500 0
06-10ත් අතර	900 0
11-20ත් අතර	2,000 0
21-40ත් අතර	2,500 0
40ට වැඩි	3,000 0
• පෙර පාසල් අයදුම්පත් ගාස්තු	100 0
• පෙර පාසල් සඳහා ඇතුළත් වීමේ ගාස්තු	300 0
• වීථිරේඛා සහ නොපවරා ගැනීමේ සහතික ලබා ගැනීම සඳහා :	
* අයදුම්පත් ගාස්තු	500 0
* පරීක්ෂණ ගාස්තු	1,000 0
1998 ට පෙර නිවාස සැලසුම් අනුමත කරවා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තු	1,000 0
• අනුකූලතා සහතික නිකුත් කිරීම	2,000 0
කාලය දීර්ඝ කිරීමේ ගාස්තු :	
* වසරකට	1,500 0
* අයදුම්පත්‍ර ගාස්තු	500 0

/ තීරුව		// තීරුව රු. ශත
• වෙනත් සහතික නිකුත් කිරීම		500 0
• ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනය සඳහා වන, * අයදුම්පත් ගාස්තු * ආදාහනය කිරීමේ ගාස්තු,		250 0
	බල ප්‍රදේශය තුළ	6,000 0
	බල ප්‍රදේශයෙන් පිටත	7,000 0
• නාකියාදෙණිය සුසාන භූමියේ නාකියාදෙණිය ග්‍රාමසේවා වසම තුළ පදිංචි අයට පමණක් මෘත ශරීරයක් * තැන්පත් කිරීම සඳහා මුදල * අයදුම්පත් ගාස්තු		30,000 0 1,500 0
• නාකියාදෙණිය සුසාන භූමියේ නාකියාදෙණිය ග්‍රාමසේවා වසම තුළ පදිංචි අයට පමණක් මෘත ශරීරයක් * මිහිදන් කිරීම සඳහා * අයදුම්පත්‍ර ගාස්තුව		5,000 0 250 0
• ලේ පරීක්ෂා කිරීමේ ගාස්තු (අවු. 60ට වැඩි පුද්ගලයින් සඳහා ගාස්තු අය නොකෙරේ.)		70.00
• උත්සව කාලයේ දී යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ භාවිතා කරනු ලබන ශබ්ද විකාශන යන්ත්‍රය භාවිතය සඳහා දිනකට,		1,500 0
• කොම්පෝස්ට් පොහොර සඳහා :		
කාර්යාලයෙන්	1 Kg පැකට් 1 ක් සඳහා	15.00
	2 Kg පැකට් 1 ක් සඳහා	30.00
	5 Kg පැකට් 1 ක් සඳහා	75.00
වෙළෙන්දාව වත්තෙන් කාබනික පොහොර 1 Kg ක් සඳහා		12.00

11-1359/12

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා යක්කලමුල්ල ප්‍රාදේශීය සභා පුස්තකාලය සඳහා අයකරනු ලබන ගාස්තු

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂයට ප්‍රාදේශීය සභා පුස්තකාලය සඳහා ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2019.10.18 වැනි දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:13 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 36 කොටසේ සඳහන් පරිදි පහත සඳහන් පුස්තකාල ගාස්තු අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි."

(i) පුස්තකාල තැන්පත් :

ළමා - රු. 50 0
වැඩිහිටි - රු. 75 0

(ii) පොත් ආපසු භාර දිය යුතු දිනය ඉක්මවා යන එක් එක් දවස වෙනුවෙන් පහත පරිදි දඩ මුදල් ගෙවිය යුතු ය :

ළමා - රු. 1.00
වැඩිහිටි - රු. 2.00

මීට අමතරව –

(i) සෑම වසරක් තුළ දී ම පුස්තකාල සාමාජිකත්වය අලුත් කළ යුතු අතර අලුත් කිරීමේ ගාස්තුව ලෙස රු. 30 ක මුදලක් 2020.01.01 වැනි දින සිට ගෙවිය යුතු ය.

(ii) සාමාජික ඉල්ලුම්පත් ගාස්තු ලෙස 2020.01.01 වැනි දින සිට රු. 30 ක මුදලක් අය කරනු ඇත.

(iii) අලාභ හානි සඳහා :

(*අ*) පොත්වල කුරුටු ගෑම හා ලිවීම රු. 30 0

(*ආ*) පොත් ඉරීම හා පිටු කැඩීම රු. 100 0

(*ඇ*) පාවිච්චියට ගත නොහැකි පරිදි අලාභ හානි කිරීමක දී එම පොත නැවත සපයා ගැනීමට යන වියදම ගෙවිය යුතු ය.

(*ඈ*) පොත් අස්ථානගත කිරීමක දී එම පොත නැවත සපයා ගැනීමට යන වියදම ගෙවිය යුතු ය.

11-1359/13

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් මත ගාස්තු අය කිරීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂයට ගොඩනැගිලි ඉදිකිරීම් සහ අනවසර ඉදිකිරීම් සඳහා ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2019.10.18 වැනි දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:14 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 31 හා 78 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර 2020.01.01 වැනි දින සිට යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම් හා අනවසර ඉදිකිරීම් සඳහා පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි."

(i) අයදුම්පත් ගාස්තුව රු. 500 0

(ii) පෙරසැරි ගාස්තුව :

	නේවාසික රු. ශත	*ව්‍යාපාරික රු. ශත*
(*අ*) වර්ග අඩි 1 - 750	750 0	2,000 0
(*ආ*) වර්ග අඩි 751 - 1500	2,000 0	3,500 0
(*ඇ*) වර්ග අඩි 1501 - 2500	5,000 0	8,500 0
(*ඈ*) වර්ග අඩි 2501 - 3500	5,500 0	10,000 0
(*ඉ*) වර්ග අඩි 3501 - 5000	7,500 0	20,000 0
(*ඊ*) වර්ග අඩි 5001 - 10000	9,500 0	30,000 0
(*උ*) වර්ග අඩි 10001 - 15000	11,500 0	40,000 0
(*ඌ*) වර්ග අඩි 15001 - 20000	13,500 0	50,000 0
(*එ*) වර්ග අඩි 20001 සිට ඉහළට	15,500 0	75,000 0

තව ද, ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමට පෙර ඉදිකිරීම් ආරම්භ කර ඇත්නම් පහත සඳහන් පරිදි ගාස්තුවක් අය කරනු ලැබේ :-

ඉදිකිරීමේ අදියර	*බිම් මහල (වර්ග මීටර් 01ක් හෝ කොටසක් සඳහා)*		*එක් එක් උඩුමහලට (වර්ග මීටර් 01ක් හෝ කොටසක් සඳහා)*	
	නේවාසික රු. ශත	*ව්‍යාපාරික රු. ශත*	*නේවාසික රු. ශත*	*ව්‍යාපාරික රු. ශත*
(i) අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කොට ඇති විට (කයිරු මට්ටම)	50 0	350 0	50 0	350 0
(ii) වහල මට්ටම දක්වා ඉදිකොට ඇති විට	150 0	400 0	150 0	400 0
(iii) වහලය ඇතුළුව ඉදිකොට ඇති විට	200 0	475 0	200 0	475 0
(iv) සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	300 0	600 0	300 0	600 0

11-1359/14

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කැබලි සැලසුම් අනුමත කිරීම හා ඉඩම් විකිණීම මත බදු පැනවීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂය සඳහා යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කැබලි සැලසුම් අනුමත කිරීම සහ ඉඩම් විකිණීම මත ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2019.10.18 වැනි දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:15 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ය්‍ූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ඉඩම් කැබලි අනුමත කිරීමේ දී හා ඉඩම් කැබලිකර විකිණීමේ දී ඊට අදාළව පහත සඳහන් පරිදි ගාස්තු 2020 ජනවාරි මස 01 වැනි දින සිට පනවා අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි."

(i) කැබලි සැලැසුම් අනුමත කිරීම :

- අයදුම්පත් ගාස්තුව රු. 750
- ඉඩම් කැබලි අනුමත කිරීමේ දී පහත පරීක්ෂණ ගාස්තුව සමඟ රු. 1,500 ක ස්ථාවර ගාස්තුවක් ගෙවිය යුතුය.
- ප්‍රසිද්ධ වෙන්දේසියේ ඉඩම් විකිණීමක් නොවන අවස්ථාවක, නමුත් ඉඩම් අනුබෙදුමක් සිදු වන අවස්ථාවක පහත පරීක්ෂණ ගාස්තු සමඟ රු. 2,500 ක ස්ථාවර ගාස්තුවක් ගෙවිය යුතුය.
- සම්පූර්ණ ඉඩම හෝ අනුබෙදුම් අනුමත කරවා ගැනීමේ දී අයකරනු ලබන පරීක්ෂණ ගාස්තු පහත දැක්වේ:

(i) පර්චස් 20 හෝ 20ට අඩු ඉඩම් සඳහා ස්ථාවර ගාස්තුව පමණක් වේ.
(ii) පර්චස් 20 ට වැඩි රූඩ් 2ක් හෝ රූඩ් 2කට අඩු ඉඩමක් සඳහා ස්ථාවර ගාස්තුව සමඟ රු. 2,500 ක ගාස්තුවක් ගෙවිය යුතුය.
(iii) රූඩ් 2ට වැඩි අක්කරයක් හෝ අක්කරයකට අඩු ඉඩමක් සඳහා ස්ථාවර ගාස්තුව සමඟ රු. 3,500 ක ගාස්තුවක් ගෙවිය යුතුය.
(iv) අක්කරයකට වැඩි අක්කර 2ක් හෝ අක්කර 2කට අඩු ඉඩමක් සඳහා ස්ථාවර ගාස්තුව සමඟ රු. 4,000 ක ගාස්තුවක් ගෙවිය යුතුය.
(v) අක්කර 2කට වැඩි අක්කර 5ක් හෝ අක්කර 5ට අඩු ඉඩමක් සඳහා අක්කරයකට හෝ කොටසකට ස්ථාවර ගාස්තුව සමඟ රු. 3,000 බැගින් ගාස්තුවක් ගෙවිය යුතුය.
(vi) අක්කර 5 කට වැඩි අක්කර 10ක් හෝ අක්කර 10කට අඩු ඉඩමක් සඳහා අක්කරයකට හෝ කොටසකට ස්ථාවර ගාස්තුව සමඟ රු. 4,000 බැගින් ගාස්තුවක් ගෙවිය යුතුය.
(vii) අක්කර 10 කට වැඩි සෑම අක්කරයක් හෝ කොටසක් සඳහාම අක්කරයකට හෝ කොටසකට ස්ථාවර ගාස්තුව සමඟ රු. 5,000 බැගින් ගෙවිය යුතුය.

ප්‍රසිද්ධියේ ඉඩම් කැබලි කර විකිණීමේ දී, සැලසුම තනි කැබැල්ලකට වඩා වැඩි වන අවස්ථාවේ දී එක් කැබැල්ලකට රු. 1,000ක් සමඟ රු. 10,000ක ස්ථාවර ගාස්තුවක් ගෙවිය යුතු ය.

11-1359/15

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ජල ටැංකිය ලබා දීමේ ගාස්තු අයකිරීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂය සඳහා ජල ටැංකි ලබා දීමේ දී ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2019.10.18 වැනි දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:16 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු ලීටර් 2000 ක ජල පරිමාවක් ඇති ජල ටැංකිය සඳහා 2020 ජනවාරි මස 01 වැනි දින සිට පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

1. ලීටර් 2000 ක ජල ටැංකිය, ට්‍රැක්ටරය සමග :

දිනකට	රු. ශත
ජලය නොමැතිව ටැංකිය පමණක්	1,000 0
අමතරව තබා ගන්නා එක් දිනකට	500 0
දිනකට ජලය සමග ටැංකියක්	1,500 0
අමතරව තබා ගන්නා එක් දිනකට	500 0

ප්‍රවාහන ගාස්තුව :-

	රු. ශත
1. කි.මී. 00 සිට 05 ඇතුළත ප්‍රවාහනය සඳහා	1,000 0
2. කි.මී. 06 සිට 10 ඇතුළත ප්‍රවාහනය සඳහා	1,500 0
3. කි.මී. 11 සිට 20 ඇතුළත ප්‍රවාහනය සඳහා	3,000 0

4. කි.මී. 20ට වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම රු. 70ක ගාස්තුවක් අය කරනු ලැබේ.

ඒ සඳහා නැවත නිදහස් කරනු ලබන ඇප තැන්පතු මුදල ලෙස රු. 1,000.00 ක මුදලක් අයකරනු ලැබේ.

11-1359/16

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය කුළියට දීම සඳහා ගාස්තු අයකිරීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂය සඳහා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය කුළියට දීමේ දී ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2019.10.18 වැනි දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:17 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය 2020 ජනවාරි මස 01 වැනි දින සිට කුළියට දීම සඳහා පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

1. කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය එක් දිනක් සඳහා රු. 4,700.00

2. කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය කුළියට දීමේ දී රු. 3,000ක නැවත නිදහස් කරනු ලබන තැන්පතු මුදලක් තැබිය යුතු ය.

ප්‍රවාහන ගාස්තුව : *රු. ශත*

1. කි.මී. 00 සිට 05 ඇතුළත ප්‍රවාහනය සඳහා 1,500 0
2. කි.මී. 06 සිට 10 ඇතුළත ප්‍රවාහනය සඳහා 2,000 0
3. කි.මී. 11 සිට 20 ඇතුළත ප්‍රවාහනය සඳහා 2,500 0
4. කි.මී. 20ට වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම රු. 60ක ගාස්තුවක් අයකරනු ලැබේ.

11-1359/17

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කොන්ක්‍රීට් Mould කුළියට දීම සඳහා ගාස්තු අයකිරීම

යක්කලමුල් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂය සඳහා Mould කුළියට ලබා දීමේ දී ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2019.10.18 වැනි දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:18 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු කොන්ක්‍රීට් Mould කුළියට දීම සඳහා 2020 ජනවාරි මස 01 වැනි දින සිට පහත සඳහන් පරිදි ගාස්තු අයකිරීමට ගරු සභාවට යෝජනා කරමි."

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු කොන්ක්‍රීට් Mould 14ක් කුළියට දීම සඳහා පහත පරිදි ගාස්තු අය කරනු ලැබේ:-

- දිනකට කොන්ක්‍රීට් Mould 01 ක් සඳහා රු. 1,000.00 ක මුදලක් අය කරනු ලැබේ.
- ඊට අමතරව කොන්ක්‍රීට් Mould සඳහා පහත පරිදි නැවත නිදහස් කරනු ලබන තැන්පතු මුදලක් තැබිය යුතුය.
  Mould 01 -05 දක්වා තැන්පතු මුදල රු. 2,000.00
  Mould 05 ට වඩා වැඩි වන විට තැන්පතු මුදල රු. 4,000.00

11-1359/18

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කොඩි කණු කුළියට ලබාදීම සඳහා ගාස්තු අයකිරීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂය සඳහා කොඩි කණු කුලියට දීම සඳහා ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2019.10.18 වැනි දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:19 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු කොඩි කණු කුළියට දීම සඳහා 2020 ජනවාරි මස 01 වැනි දින සිට පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි."

1. සභාව සතු කොඩි කණු කුළියට දීමේ දී දිනකට කොඩි කණුවක් සඳහා රු. 50ක ගාස්තුවක් අයකරනු ලැබේ. ඊට අමතරව කොඩි කණු සඳහා පහත පරිදි නැවත නිදහස් කරනු ලබන තැන්පතු මුදලක් තැබිය යුතු ය.

* කණු 01 සිට 05 දක්වා තැන්පතු මුදල	රු. 1,000.00
* කණු 06 සිට 10 දක්වා තැන්පතු මුදල	රු. 2,500.00
* කණු ගණන 10 ට වඩා වැඩි වන විට තැන්පතු මුදල	රු. 5,000.00

ප්‍රවාහන ගාස්තුව :

	රු. ශත
1. කි.මී. 00 සිට 05 ඇතුළත ප්‍රවාහනය සඳහා	1,000.00
2. කි.මී. 06 සිට 10 ඇතුළත ප්‍රවාහනය සඳහා	1,500.00
3. කි.මී. 11 සිට 20 ඇතුළත ප්‍රවාහනය සඳහා	2,000.00
4. කි.මී. 20 ට වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම රු. 40.00ක ගාස්තුවක් අයකරනු ලැබේ.	

11-1359/19

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ගුවන්යානා ගොඩ බැස්සවීමේ ගාස්තු අයකිරීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂය සඳහා ගුවන්යානා ගොඩ බැස්සවීමේ දී ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2019.10.18 වැනි දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 05:20 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩාංගන සඳහා 2020 ජනවාරි මස 01 වැනි දින සිට පෞද්ගලික සමාගමක් යටතේ ඇති හෙලිකොප්ටරයක් ගොඩ බැස්සවීමේ දී පහත පරිදි ගාස්තු අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි."

පෞද්ගලික සමාගමක් යටතේ ඇති හෙලිකොප්ටරයක් එක් වරකට ගොඩ බැස්සවීමේ ගාස්තුව රු. 5,000.00

11-1359/20

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා මායිම් තාප්ප හා ආරක්ෂක බැමි ඉදිකිරීම සඳහා ගාස්තු අයකිරීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂය සඳහා මායිම් තාප්ප හා ආරක්ෂක බැමි ඉදිකිරීමේ දී ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2019.10.18 වැනි දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 5:21 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව 2020 ජනවාරි මස 01 වැනි දින සිට මායිම් තාප්ප හා ආරක්ෂක බැමි ඉදිකිරීම සඳහා ගාස්තු අයකිරීමට ගරු සභාවට යෝජනා කරමි."

මායිම් තාප්ප/ආරක්ෂක බැමි	*ගොඩනැගිලි සීමාවෙන් පිටත රු. ශත*	*ගොඩනැගිලි සීමාව තුළ රු. ශත*
නේවාසික දික් මීටර් 01ක්	300 0	500 0
වාණිජ හෝ වෙනත් දික් මීටර් 01ක්	400 0	600 0

11-1359/21

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ජල බවුසරය කුළියට ලබා දීමේ ගාස්තු අයකිරීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂය සඳහා ජල බවුසරය කුළියට ලබාදීමේ දී ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2019.10.18 වැනි දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 5:22 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු ලීටර් 4000ක ජල පරිමාවක් ඇති ජල බවුසරය 2020 ජනවාරි මස 01 වැනි දින සිට පහත සඳහන් පරිදි ගාස්තු අයකිරීමට ගරු සභාවට යෝජනා කරමි"

ජලය සමග බවුසරය ලබා දීමේ දී එක් දිනකට,

* ජලය සහිතව රු. 3,000 ක් ද,
* ජලය රහිතව රු. 2,000 ක් ද අය කරනු ලැබේ.

අමතරව වැඩිවෙන එක් දිනක් සඳහා රු. 500 ක මුදලක් අය කරනු ලැබේ.
ජල බවුසරය කුලියට දීමේ දී රු. 1,500 ක නැවත නිදහස් කරනු ලබන තැන්පතු මුදලක් තැබිය යුතුය.

ප්‍රවාහන ගාස්තුව :

	රු. ශත
1. කි.මී. 00 සිට 05 ඇතුළත ප්‍රවාහනය සඳහා	1,000 0
2. කි.මී. 06 සිට 10 ඇතුළත ප්‍රවාහනය සඳහා	1,500 0
3. කි.මී. 11 සිට 20 ඇතුළත ප්‍රවාහනය සඳහා	3,000 0

4. කි.මී. 20 ට වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම රු. 70 ක ගාස්තුවක් අය කරනු ලැබේ.

11-1359/22

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ටොන් 08ක ගල් රෝල කුලියට ලබාදීම සඳහා ගාස්තු අයකිරීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ටොන් 8ක ගල් රෝල 2020 වර්ෂය සඳහා කුලියට ලබාදීමේ දී ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2019.10.18 වැනි දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 5:23 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු ටොන් 08 ක ගල් රෝල කුලියට ලබා දීම සඳහා 2020 ජනවාරි මස 01 වැනි දින සිට පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි."

* එක් දිනයක් සඳහා රු. 10,000.00 ක මුදලක් ද, සහ ඉන් අනතුරුව වැඩිවන සෑම පැය එකකටම රු. 1000.00 ක ගාස්තුවක් අය කරනු ලැබේ. (එක් දිනක් සඳහා පැය 08ක් අදාළ වේ.)
* ඒ සඳහා නැවත නිදහස් කරනු ලබන ඇප තැන්පත් මුදලක් ලෙස බල ප්‍රදේශය තුළ රු. 10,000.00 ක මුදලක් ද කිලෝ මීටර් 10 කට වැඩි දුරක් ඇති වැඩ බිමක් සඳහා රැගෙන යාමේ දී රු. 15,000.00 ක ඇප තැන්පතු මුදලක් ද අය කරනු ලැබේ.
* ගල් රෝල කාර්මික දෝෂයක් හෝ රියදුරුවරයෙකු නොමැති අවස්ථාවක හැර මුදල් ගෙවා ලබා ගන්නා දින ගණනට අමතරව වැඩ බිමෙහි රඳවා ගන්නා එක් දිනක් සඳහා රු. 2000.000ක මුදලක් අය කරනු ලැබේ.

ගල් රෝල ප්‍රවාහනය සඳහා පහත පරිදි ප්‍රවාහන ගාස්තු අය කරනු ලැබේ.

ප්‍රවාහන ගාස්තුව :

1. කි.මී. 00 සිට 05 ඇතුළත ප්‍රවාහනය සඳහා රු. 3,500,0
2. කි.මී. 05 ඇතුළත පමණක් ඉහත ගාස්තු යටතේ ප්‍රවාහනය සභාව විසින් සිදු කරනු ලබන අතර ඊට වැඩි වන අවස්ථාවලදී ප්‍රවාහන පහසුකම් තමා විසින් සපයා ගත යුතුය.

11-1359/23

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට දුරකථන කුළුණු සඳහා ගාස්තු අයකිරීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් දුරකථන කුළුණු සඳහා 2020 වර්ෂයට ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2019.10.18 වැනි දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 5:24 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"යක්කලමුල්ල බලප්‍රදේශය සභාව තුළ ස්ථාපිත දුරකථන කුළුණු සඳහා 2020.01.01 සිට වර්ෂයක රු. 3,000.00ක මුදලක් අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි."

11-1359/24

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයට ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතය සඳහා ගාස්තු අයකිරීම

යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මාර්ග භාවිතය සඳහා ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් 2019.10.18 වැනි දින පවත්වන ලද යක්කලමුල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 5:25 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

යෝජනාව

"රුපියල් මිලියන 10ක් හෝ ඊට වැඩි ව්‍යාපෘති සඳහා සභාව සතු මාර්ග භාවිතයට ගනු ලබන්නේනම්, එම ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුගත මුදලින් 1% ක මුදලක් සභාවේ තැන්පත් කළයුතු බවට ගරු සභාවට යෝජනා කරමි."

11-1359/25

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක ඉ(01)01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 07 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (01) වැනි උපවගන්තිය යටතේ පාතදුම්ර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යයි ප්‍රකාශයට පත් කර ඇත්තාවූ ප්‍රදේශ ඇතුළත පිහිටියාවූ ද, නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, වාර්ෂික වටිනාකම් 2014 වර්ෂය සඳහා වූ තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් උපලේඛන අංක 01 හි සඳහන් පරිදි වාර්ෂික වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවටත්, තවද, 2020 වර්ෂයෙහි පහත උපලේඛන අංක 02 හි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර වාර්ෂික වරිපනම් බද්ද පාතදුම්බර් ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2020 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද එකී උපලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදළ කාර්තුවේ වරිපනම් බදු මුදල පාතදුම්බර ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද, පාතදුම්බර ප්‍රාදේශීය සභාවට ලබා දිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය අංක 01

1.	හපුගස්තැන්න පාර - හපුගස්තැන්න පාරේ සිට යහංගල දක්වා මාර්ගයේ දෙපස මාර්ගයේ මැද සිට අඩි 300ක් දක්වා කිලෝමීටර් 01	3%
2.	ගලදෙනිය පාර - උඩතලවින්න ගලදෙණිය මාර්ගයේ දෙපස මාර්ගයේ මැද සිට අඩි 300ක් දක්වා (දොරගමුව මාර්ගයේ සිට ගලදෙනිය ජුම්මා පල්ලිය දක්වා)	3%
3.	කටුගස්තොට-නවයාලතැන්න පොල්ගොල්ල විශ්වවිද්‍යාලයේ ලඟ සිට නවයාලතැන්න ඔරලෝසු කණුව දක්වා පාරේ මැද සිට අඩි 300ක් දක්වා මාර්ගය	3%
4.	ජම්බුගහමඩිත්ත පාර - නාපාන ජම්බුගහමඩිත්ත මාර්ගය දෙපස මාර්ගයේ මැද සිට අඩි 300ක් දක්වා (නාපාන සැමන් ෆැක්ටරිය (නවරත්න ගරාජය) අසල සිට නාපාන සොහොන්පිටිය දක්වා මීටර් 1.4)	3%
5.	වලල හන්දියේ සිට කයිවඩන්තැන්න හන්දිය හරහා කිරිමැටිය හන්දිය දක්වා පාරේ මැද සිට අඩි 300 දෙපස	3%
6.	අලෝක මාවත - නාපාන අලෝක මාවත දෙපස මාර්ගයේ මැද සිට අඩි 300 (නාපාන පාසල අසල සිට අමුණුගම - මැණික්හින්න මාර්ගය දක්වා දුර කිලෝමීටර් 0.12)	3%
7.	යටිරාවන-බංගලාමලේ පාර - වත්තේගම පාරේ යටිරාවන ලීමෝල අසල සිට වත්තේගම පාර බංගලාමලේ හන්දිය දක්වා මාර්ගයේ මැද සිට අඩි 300 ක් දක්වා	3%
8.	කහල්ල කලුගල (වටරවුම්) පාර-කලුගලවත්ත හරහා ඉහල ගම්මැද්ද මාර්ගය දෙපස මාර්ගයේ මැද සිට අඩි 300 දක්වා (කටුගස්තොට තැපැල් කාර්යාලය අසල සිට කහල්ල පුස්තකාලය දක්වා මාර්ගය දුර කිලෝමීටර් 01)	3%

9.	බ්‍රෝමෝ ගාර්ඩන් පාර-අඹතැන්න මැග්සිටි ආයතනය අසලින් බ්‍රෝමෝ ගාර්ඩන් පාරේ මැද සිට දෙපස අඩි 300 දක්වා,	3%
10.	බොල්ලේගොඩ - මොරගස්කොටුව පාර - අඹතැන්න බොල්ලේගොඩ හරහා මොරගස්කොටුව දක්වා මාර්ගයේ දෙපස මාර්ගයේ මැද සිට අඩි 300 දක්වා (අඹතැන්න මාර්ගයේ සිට මොරගස්කොටුව හන්දිය දක්වා කිලෝමීටර් 01)	3%
11.	බොල්ලේගොඩ - මහසෙන් විද්‍යාල පාර-බොල්ලේගොඩ ප්‍රධාන මාර්ගයේ සිට වැකඩ හරහා මහසෙන් විද්‍යාලය දක්වා ඇති මාර්ගයේ දෙපස මාර්ගයේ මැද සිට අඩි 300 දක්වා (අඹතැන්න බොකලවල හන්දියේ සිට බෝගස්ගොඩ පාර වැකඩේ හරහා මහසෙන් විද්‍යාලය දක්වා කිලෝමීටර් 01)	3%
12.	වත්තේගෙදර - දුන්කොලවත්ත පාර වත්තේගෙදර හන්දියේ සිට දුන්කොලවත්ත පල්ලිය දක්වා මාර්ගයේ මැදසිට අඩි 300 දක්වා	3%
13.	කහල්ල පන්සල පාර - කහල්ල පුරාණ විහාර මාවත නාගරික සීමාව සිට ඉහළ ගම පාර දක්වා මාර්ගය දෙපස	6%
14.	කහල්ල පහළ ගම පාර - කටුගස්තොට ඉහළ ගම නාගරික ක්‍රීඩාංගනයේ සිට පහළ ගම පාරේ කහල්ල මහජන පුස්තකාලය දක්වා මාර්ගය දෙපස	6%
15.	කහල්ල ඉහළගම පාර - කටුගස්තොට ඉහළ ගම නාගරික ක්‍රීඩාංගනයේ සිට ඉහළ ගම පාරේ කහල්ල මහජන පුස්තකාලය දක්වා මාර්ගය දෙපස	6%
16.	දෙමටගොල්ල පාර - කටුගස්තොට මඩවල පාරේ දෙමටගොල්ල හන්දියේ සිට දෙමටගොල්ල පාරේ ජම්බුගහපිටිය මන්සන්ධිය දක්වා මාර්ගය දෙපස	6%
17.	ජම්බුගහපිටිය පාර - කටුගස්තොට මඩවල පාරේ නවයාලතැන්න හන්දියේ සිට පල්ලේතලවින්න ආදර්ශ විද්‍යාලය දක්වා මාර්ගය දෙපස	6%
18.	පල්ලේතලවින්න උඩතලවින්න - පල්ලේතලවින්න උඩතලවින්න අතුරු මාර්ගය දෙපස	6%
19.	බංගලාගෙදර පාර - මඩවල වත්තේගම පාරේ රේන්දපොළ හන්දියේ සිට බංගලාගෙදර හරහා මඩවල මුස්ලිම් මහ පල්ලිය දක්වා මාර්ගය දෙපස	6%
20.	පට්ටියතැන්න පාර - තෙල්දෙණිය පාරේ 8 කණුව හන්දිය සිට පට්ටියතැන්න මුදුන කඩේ හන්දිය දක්වා මාර්ගය දෙපස	6%
21.	වලල වාවින්න පාර - තෙල්දෙණිය පාරේ වලල හන්දියේ සිට වාවින්න පාරේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාව දක්වා මාර්ගය දෙපස	6%
22.	දොරගමුව පාර - පොල්ගොල්ල දොරගමුව හන්දිය සිට දොරගමුව පාරේ මීගම්මන හන්දිය දක්වා මාර්ගය දෙපස	6%
23.	සරසවි මාවත - පොල්ගොල්ල විවෘත විශ්වවිද්‍යාල අසල සිට දොරගමුව පාර හමුවන පොඩිඅම්බලම හන්දිය දක්වා මාර්ගය දෙපස	6%
24.	ගංගා මාවත - නවාලතැන්න පාතදුම්බර කාර්මික විද්‍යාලය අසලින් ආරම්භ වී දොරගමුව පාර හමුවන මන්සන්ධිය දක්වා මාර්ගය දෙපස	6%
25.	බලනගල පාර- දෙමටගොල්ල පාරේ මන්සන්ධියේ සිට මහවැලි මහා විද්‍යාලය දක්වා මාර්ගය දෙපස	6%
26.	අටමන් හන්දිය වත්තේගෙදර පාර - පොල්ගොල්ල අටමන්හන්දියේ සිට දොරගමුව පාර හමුවන වත්තේගෙදර දක්වා මාර්ගය දෙපස	6%
27.	නුවර පාර, අඹතැන්න - අඹතැන්න පූජාපිටියේ හන්දියේ සිට කටුගස්තොට පොලිසිය අසළ මහනුවර මහ නගර සීමාව දක්වා මාර්ගය දෙපස	7%
28.	මාතලේ පාර, අඹතැන්න -අඹතැන්න පූජාපිටියේ හන්දියේ සිට මාතලේ දෙසට අකුරණ ප්‍රාදේශීය සභා සීමාව දක්වා මාර්ගය දෙපස	7%
29.	පූජාපිටිය පාර - අඹතැන්න පූජාපිටියේ හන්දියේ සිට පූජාපිටිය දෙසට පූජාපිටිය ප්‍රාදේශීය සභා සීමාව දක්වා මාර්ගය දෙපස	7%

30.	නාපාන පාර - මඩවල හන්දියේ සිට තෙල්දෙණිය පාරේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාව දක්වා මාර්ගය දෙපස	7%
31.	වත්තේගම පාර - මඩවල හන්දියේ සිට වත්තේගම පාරේ පිටියේගෙදර හන්දිය දක්වා මාර්ගය දෙපස	7%
32.	කටුගස්තොට පාර - මඩවල හන්දියේ සිට වංගුව කඩේ දක්වා මාර්ගය දෙපස	7%
33.	අමුණුගම පාර - මඩවල සිරිමල්වත්ත හන්දියේ සිට අමුණුගම හන්දිය දක්වා මාර්ගය දෙපස	7%

උපලේඛනය 11

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2020.03.31 හෝ ඊට පෙර	2020.01.31
දෙවන කාර්තුව	2020.06.30 හෝ ඊට පෙර	2020.04.30
තෙවන කාර්තුව	2020.09.30 හෝ ඊට පෙර	2020.07.31
සිව්වන කාර්තුව	2020.12.31 හෝ ඊට පෙර	2020.10.31

11-1409/1

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම -2020 වර්ෂය

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක ඉ(01)05 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 07 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුම මත ම එහි II තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමට පාතදුම්බර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව* *රු. ශත*
(1) 1.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
2.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ	

	රු. ශත
බයිසිකල්කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
3. සෑම කරත්තයක් සඳහා	20 0
4. සෑම අත් කරත්තයක් සඳහා	10 0
5. සෑම රික්ෂෝවක් සඳහා	7 50
6. සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
7. සෑම ඇතෙකු සඳහා	50 0

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යයන් සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

11-1409/2

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

2020 වර්ෂයේ වෙළෙඳ බලපත්‍ර මත ගාස්තු පැනවීම

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක ඉ(01) 04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 07 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමග කිය විය යුතු 147 වන වගන්තිය යටතේ පාතදුම්බර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2020 වර්ෂයේ නිකුත්කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ 11 වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

එසේ ම තවදුරටත් එවැනි යම් ස්ථානයක් හෝටලයක ආපනශාලාවක හෝ නවාතැන්පොළක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නේ ද, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය) කර්යය සඳහා එම හෝටලය, ආපනශාලාව හෝ නවාතැන්පොළ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තාවූ ද, අනුමත කර හෝ පිළිගන්නා වූ අවස්ථාවක එකී හෝටලය, ආපනශාලාව, හෝ නවාතැන්පොළ පසුගිය වර්ෂය ලත් ලැබීම් වලින් 1% කට සමාන බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂයට පනවා අය කිරීමට යෝජනා කරමි.
”

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*		
	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	නවාතැන් පොළක්/ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	තේ සහ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	ගව මස් විකිණීම	500 0	750 0	1,000 0
10.	එළු මස් විකිණීම	500 0	750 0	1,000 0
11.	ඌරු මස් විකිණීම	500 0	750 0	1,000 0
12.	කුකුල් මස් විකිණීම	500 0	750 0	1,000 0
13.	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	බාබර් සැප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	එළු ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ඌරු ගාලක්/කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	කුකුල් කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
22.	පොහොර හෝ රසායනික පොහොර ගබඩා කිරීම	500 0	750 0	1,000 0
23.	පොහොර හෝ රසායනික පොහොර විකිණීම	500 0	750 0	1,000 0
24.	පශු ගිලන් හල්	500 0	750 0	1,000 0
25.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
26.	සම් විකිණීම	500 0	750 0	1,000 0
27.	ශීතකල මස් හෝ මාළු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
28.	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම	500 0	750 0	1,000 0
29.	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
30.	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
31.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිෂ්පාදන කිරීම	500 0	750 0	1,000 0
32.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
33.	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
34.	සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
35.	සත්ත්ව ආහාර ගබඩා කිරීම	500 0	750 0	1,000 0
36.	සත්ත්ව ආහාර විකිණීම	500 0	750 0	1,000 0
37.	පුන්නක්කු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
38.	පුන්නක්කු කිලෝග්‍රෑම් 200 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
39.	සත්ව මාංශ හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
40.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
41.	සත්ව ඇටකටු ඇඹරීම හා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
42.	ට්‍රන්ක් පෙට්ටි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
43.	අලුත් ලෝහ ගබඩා කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
44.	පරණ යකඩ මිලට ගැනීම, ගබඩා කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
45.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය මිලට ගැනීම, ගබඩා කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
46.	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
47.	වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
48.	යාන්ත්‍රික වඩුමඩු	500 0	750 0	1,000 0
49.	යාන්ත්‍රික නොවන වඩුමඩු	500 0	750 0	1,000 0
50.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
51.	රස කැවිලි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
52.	පොල් ලෙලි පෙගවීම හෝ පල් කිරීම	500 0	750 0	1,000 0
53.	බුරුසු වර්ග නිෂ්පාදනය කිරීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
54.	දත් බුරුසු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
55.	රා එකතු කිරීම, ගබඩා කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
56.	විනාකිරි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
57.	යන්ත්‍රානුසාරයෙන් නොවන දැව ඉරීම	500 0	750 0	1,000 0
58.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
59.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් ලීටර් 1000 ට වැඩියෙන් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
60 .	සෝඩා නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
61.	කෙදි සායම් කිරීම	500 0	750 0	1,000 0
62.	සම්භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
63.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
64.	මිරිස්, කහ, කුළුබඩු හා කෝපි වර්ග ඇඹරීම	500 0	750 0	1,000 0
65.	ධාන්‍ය වර්ග ඇඹරීම	500 0	750 0	1000 0
66.	බේකින් පවුඩර් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
67.	ෆෑස් මැන්ටල් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
68.	පොටි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
69.	ඉටිපන්දම් නිප්පාදනය කිරීම	500 0	750 0	1,000 0
70.	කපුරු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
71.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
72.	රෙදි සෝදන නිල් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
73.	ලාකඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
74.	සුවඳ විලවුන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
75.	පාසල් රටහුණු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
76.	ටයර් ටියුබ් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
77.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
78.	ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීම	500 0	750 0	1,000 0
79.	පාවිච්චි කල ටයර් සහ ටියුබ් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
80.	සිමෙන්ති නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
81.	සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1000 ට වැඩියෙන් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
82.	සිමෙන්ති ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
83.	ඇස්බැස්ටෝස් තහඩු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
84.	වැලි කඩදාසි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
85.	ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
86.	ගඩොල් පෝරණු	500 0	750 0	1,000 0
87.	බලවේග යන්ත්‍ර පේෂ කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
88.	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
89.	අත් වැසුම් හා කන් වැසුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
90.	වූල් ඇදුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
91.	රෙදි පිළි බතික් කිරීම	500 0	750 0	1,000 0
92.	සේවකයින් හා මැෂින් 10 ටවැඩි ඇගලුම් කර්මාන්ත ශාලා			
93.	පොහොර හුනු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
94.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
95.	ධාන්‍ය හෝ මාංශභෝග කිලෝ ග්‍රෑම් 250 ට වැඩියෙන් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
96.	බිස්කට් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
97.	කේක් වර්ග නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
98.	කිරිහල්	500 0	750 0	1,000 0
99.	සිසිල් බීම හා පළතුරු බීම විකිණීම	500 0	750 0	1,000 0
100.	කොළ කැද හා ඔසු පැන් විකිණීම	500 0	750 0	1,000 0
101.	බේකරි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
102.	රසකැවිලි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
103.	රසකැවිලි විකිණීම	500 0	750 0	1,000 0
104.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
105.	අයිස් පැකට් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
106.	බදින ලද කඩල මුරුක්කු වර්ග ඇසුරුම් කිරීම	500 0	750 0	1,000 0
107.	බදින ලද කඩල මුරුක්කු වර්ග විකිණීම	500 0	750 0	1,000 0
108.	කිරි ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
109.	කිරි ආශ්‍රිත නිෂ්පාදන විකිණීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
110.	පළතුරු ආශ්‍රිත නිෂ්පාදන විකිණීම	500 0	750 0	1,000 0
111.	පළතුරු ආශ්‍රිත නිෂ්පාදන විකිණීම	500 0	750 0	1,000 0
112.	සෝයා ආශ්‍රිත ආහාර පාන නිෂ්පාදනය කර විකිණීම	500 0	750 0	1,000 0
113.	ජෑම් කෝඩියල් චට්නි චිලි පේස්ට් වර්ග නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
114.	වියලි ආහාර වර්ග ඇසුරුම් කිරීම	500 0	750 0	1,000 0
115.	බිත්තර විකිණීම	500 0	750 0	1,000 0
116.	ශීත කල කුකුල් මස් විකිණීම	500 0	750 0	1,000 0
117.	ශීත කළ එළු මස් විකිණීම	500 0	750 0	1,000 0
118.	ශීක කල මාළු විකිණීම	500 0	750 0	1,000 0
119.	සකස් කර ඇසුරුම් කළ ශීත කළ කුකුල් මස් විකිණීම	500 0	750 0	1,000 0
120.	සකස් කර ඇසුරුම් කළ ආනයනය කරන ලද ශීත කළ මස් විකිණීම	500 0	750 0	1,000 0
121.	සකස් කර ඇසුරුම් කළ ශීත කළ මාළු විකිණීම	500 0	750 0	1,000 0
122.	කරවල, හාල් මැස්සන්, උම්බලකඩ ඇසුරුම් කිරීම	500 0	750 0	1,000 0
123.	කරවල හා හාල් මැස්සන් විකිණීම	500 0	750 0	1,000 0
124.	මිරිස් සහ හා තුනපහ කුඩු ඇසුරුම් කිරීම	500 0	750 0	1,000 0
125.	මිරිස් කහ හා තුනපහ කුඩු විකිණීම	500 0	750 0	1,000 0
126.	පිටි වර්ග හා ධාන්‍ය වර්ග ඇසුරුම් කිරීම	500 0	750 0	1,000 0
127.	දිය ලුණු ඇසුරුම් කිරීම	500 0	750 0	1,000 0
128.	තේ කුඩු කිලෝග්‍රෑම් 100 ට වැඩියෙන් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
129.	තේ කුඩු පැකට් කිරීම	500 0	750 0	1,000 0
130.	තේ කුඩු විකිණීම	500 0	750 0	1,000 0
131.	අර්තාපල් හා එෑණු කිලෝග්‍රෑම් 1000 ට වැඩියෙන් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
132.	පානීය ජලය බෝතල් කිරීම හා බෙදා හැරීම	500 0	750 0	1,000 0
133.	උත්සව සඳහා ආහාර පාන සැපයීම	500 0	750 0	1,000 0
134.	බුලත් පුවක් දුම්කොළ විකිණීම	500 0	750 0	1,000 0
135.	දුම්කොළ තොග විකිණීම	500 0	750 0	1,000 0
136.	දුමකොළ සැකසීම	500 0	750 0	1,000 0
137.	සිගරට් නිෂ්පාදනය කිරීම හා සැකසීම	500 0	750 0	1,000 0
138.	බීඩි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
139.	පාවහන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
140.	පාවහන් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
141.	සම්භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
142.	සම්භාණ්ඩ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
143.	බෑග් හා ගමන් මලු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
144.	බෑග් හා ගමන් මලු අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
145.	ඇසුරුම් මලු වර්ග නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
146.	මුද්‍රණාල	500 0	750 0	1,000 0
147.	භාණ්ඩවල මුද්‍රණ කටයුතු කිරීම	500 0	750 0	1,000 0
148.	මනාලියන් හැඩගැන්වීම හා රූපලාවන්‍ය කටයුතු කිරීම	500 0	750 0	1,000 0
149.	විසිතුරු පක්ෂීන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
150.	කළුගල් කැනීම හා කැඩීම	500 0	750 0	1,000 0
151.	සිසිල් බීම නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
152.	අයිස් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
153.	එළවළු තෙල් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
154.	පොල්තෙල් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
155.	පොල්තෙල් ලීටර 100 ට වැඩියෙන් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
156.	පොල්තෙල් විකිණීම	500 0	750 0	1,000 0
157.	ගිනි පෙට්ටි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
158.	මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
159.	තේ පෙට්ටි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
160.	එළවලු පෙට්ටි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
161.	කොහු හෝ වෙනත් කෙදි වර්ග නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
162.	කොහු හෝ වෙනත් කෙදි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
163.	පිදුරු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
164.	පාවිච්චි කළ ඇදුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
165.	රන් භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
166.	රිදී භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
167.	රන් හා රිදී භාණ්ඩ ඇලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
168.	යන්ත්‍රානුසාරයෙන් දැව ඉරීම	500 0	750 0	1,000 0
169.	හුණු ගල් කැනීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
170.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල්	500 0	750 0	1,000 0
171.	කම්මල්	500 0	750 0	1,000 0
172.	පරණ බෝතල් හිස් ගෝනි මිලයට ගැනීම හා විකිණීම	500 0	750 0	1,000 0
173.	පාපැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
174.	මෝටර් වාහන විසිරී (ස්ප්‍රේ පේන්ට්) පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
175.	ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ යන්ත්‍රෝපකරණ උපකරණ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
176.	පිත්තල භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
177.	පිත්තල භාන්ඩ පොලිෂ් කිරීම	500 0	750 0	1,000 0
178.	වීදුරු ගබඩා කිරීම විකිණීම	500 0	750 0	1,000 0
179.	කෘෂි රසායනික ද්‍රව්‍ය ගබඩා කර විකිණීම	500 0	750 0	1,000 0
180.	අම්ලකර වායුව සහිත සිලින්ඩර ගබඩා කර විකිණීම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
181.	එල් පී වායුව සහිත සිලින්ඩර ගබඩා කර විකිණීම	500 0	750 0	1,000 0
182.	තලාතු මිනිරන් සුද්ද කිරීම	500 0	750 0	1,000 0
183.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් සකස් කිරීම	500 0	750 0	1,000 0
184.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
185.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
186.	රෙදි පිළි බතික් කිරීම	500 0	750 0	1,000 0
187.	විද්‍යුත් ලෝහ ආලේප කිරීම (යාන්ත්‍රික)	500 0	750 0	1,000 0
188.	විද්‍යුත් ලෝහ අලෝප කිරීම (යාන්ත්‍රික නොවන)	500 0	750 0	1,000 0
189.	තෙල් හෝ සත්ත්ව මේද පැසවීම	500 0	750 0	1,000 0
190.	හුණුගල් පිලිස්සීම	500 0	750 0	1,000 0
191.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු නිෂ්පාදනය කිරීම හා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
192.	ගිණිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤු විකිණීම	500 0	750 0	1,000 0
193.	මෝරතෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0
194.	රථ වාහන බැටරි අලුත්වැඩියා කිරීම හා විද්‍යුත් ආරෝපන කිරීම	500 0	750 0	1,000 0
195.	ලෝහ පෑස්සීම	500 0	750 0	1,000 0
196.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
197.	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
198.	ඩීසල් පොම්ප අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
199.	ත්‍රිරෝද රථ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
200.	යතුරු පැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
201.	පාපැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
202.	ත්‍රී රෝද රථ සේවා කිරීම	500 0	750 0	1,000 0
203.	යතුරු පැදි සේවා කිරීම	500 0	750 0	1,000 0
204.	දුනු වැඩපල	500 0	750 0	1,000 0
205.	සයිලන්සර් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
206.	මෝටර් වාහන ටිංකර් කිරීම	500 0	750 0	1,000 0
207.	වාත්තු වැඩ	500 0	750 0	1,000 0
208.	බෙලෙක් වැඩපල	500 0	750 0	1,000 0
209.	ලොරි බොඩි ගැසීම හෝ ලොරි බොඩි තැබීම	500 0	750 0	1,000 0
210.	විෂබීජ නාශක හා පිරිසිදු කාරක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
211.	මදුරු දගර නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
212.	දැව ආරක්ෂක නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
213.	ගල්තාර හෝ බිටුන්මය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
214.	වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
215.	වීදුරු කැඩපත් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
216.	යකඩ තහඩු ගැල්වනයිස් කිරීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
217.	පාස්සන ඊයම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
218.	ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
219.	කටුකම්බි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
220.	කම්බි ඇණ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
221.	කාබන් කඩදාසි හෝ කාබන් ලියන පටි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
222.	බෙලෙක් බඳුන් වානේ පීප්ප නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
223.	ජී අයි බාල්දි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
224.	ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
225.	ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
226.	ක්ලච් ප්ලේට් හා බ්රේක් ලයිනර් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
227.	ක්ලච් ප්ලේට් හා බ්රේක් ලයිනර් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
228.	යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
229.	විදුලි භාණ්ඩ	500 0	750 0	1,000 0
230.	රබර් මිශ්‍ර කෙඳි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
231.	සංචායන බැටරි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
232.	මෝටර්වාහන එකලස් කිරීම	500 0	750 0	1,000 0
233.	ට්‍රැක්ටර් රථ එකලස් කිරීම	500 0	750 0	1,000 0
234.	රේඩියේටර් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
235.	රේඩියේටර් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
236.	ඉලෙක්ට්‍රෝනික් උපකරණ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
237.	ඉලෙක්ට්‍රෝනික් උපකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
238.	වියළි කෝෂ බැටරි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
239.	අම්ල (ඇසිඩ්) වර්ග නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
240.	අම්ල (ඇසිඩ්) වර්ග ගබඩා කර විකිණීම	500 0	750 0	1,000 0
241.	අත්වැල් හා රෝල දොරවල් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
242.	ඛනිජ තෙල් ගබඩා කර විකිණීම	500 0	750 0	1,000 0
243.	ලිහිසි තෙල් විකිණීම	500 0	750 0	1,000 0
244.	රථ වාහන ඇතුළත පිරිසිදු කිරීම හා වාහන කාපට් පිරිසිදු කිරීම	500 0	750 0	1,000 0
245.	ෆයිබර් වැඩපල	500 0	750 0	1,000 0
246.	ලෝහ ලියවන පට්ටල	500 0	750 0	1,000 0
247.	විදුලි කාර්මික වැඩපල	500 0	750 0	1,000 0
248.	ගෘහ විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
249.	රූපවාහිනී හා ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
250.	විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සංචාරක වෙළෙඳාම කිරීම සම්බන්ධ බලපත්‍ර ගාස්තු පැනවීම

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක ඉ(01)22 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 07 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2019.08.27 දින පැවති පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මාසික මහ සභා රැස්වීමේ යෝජනා අංක ඉ (01) 5 යටතේ සභා සම්මත කර පිළිගන්නා ලද මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කර 2016.02.23 වැනි දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළාත් පාලන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකර ප්‍රසිද්ධ කරනු ලැබූ ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල සංචාරක වෙළෙඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවෙහි 7 වන වගන්තිය යටතේ පහත උපලේඛනයේ සඳහන් පරිදි සංචාරක වෙළඳාම සම්බන්ධයෙන් බලපත්‍ර තුළ ගාස්තුවක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය		*ගාස්තුව රුපියල්*
01.	අත් කරත්තයකින් හෝ කරත්තයක් මගින් වෙළඳාම් කිරීම් කිරීම	500 0
02.	බයිසිකලයකින් හෝ ට්‍රයිසිකලයක් මගින් වෙළඳාම් කිරීම	500 0
03.	ත්‍රීරෝද රථයක් මගින් වෙළඳාම් කිරීම	750 0
04.	වෑන් රථයක් මගින් වෙළඳාම් කිරීම	1,000 0
05.	ලොරි රථයක් මගින් වෙළඳාම් කිරීම	1,000 0

11-1409/4

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් සඳහා ප්‍රචාරණ ගාස්තු පැනවීම - 2020 වර්ෂය

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන සභා රැස්වීමේදී තීරණ අංක ඉ(01)08 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2020 වර්ෂය සඳහා පනවන ලද පහත උපලේඛනයේ දැක්වෙන ප්‍රචාරක දැන්වීම් ගාස්තු පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවා අවසර ලබාගත යුතු බව මෙයින් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 07 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2019.08.27 වැනි දින පැවති පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මාසික මහ සභා රැස්වීමේ යෝජනා අංක ඉ (01) 5 යටතේ සභා සම්මත කරන පිළිගන්නා ලද මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කර 2016.02.23 වැනි දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළාත් පාලන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකර ප්‍රසිද්ධ කරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවල 35 -ඒ වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ II උපලේඛනයේ සඳහන් පරිදි පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වීථියකට, පාරකට, ඇලකට වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂය සඳහා අය කිරීමට පාතදුම්බර ප්‍රාදේශීය සභාව යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*මාස 03ට අඩු*	*මාස 03 හෝ 06 අතර*	*වසරක් සඳහා*
			රු.	රු.	රු.
01	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3ට අඩු	250.00	350.00	500.00
		3ට වැඩි	3 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500.00	750.00	1000.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.300.00 බැගින්		
04	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
05	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	150.00	150.00	200.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
06	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	750.00	850.00	1,000.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		

පාතදුම්බර ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමක හෝ පරිශ්‍රයක රජයේ රක්ෂිත ඉඩමක දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කරන විට ඉහත ගාස්තුවලට අමතරව මාසිකව බිම් කුලිය වශයෙන් රු. 250 ක් ද ගෙවිය යුතුය.

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

සාතක මඩු ගාස්තු පැනවීම - 2020 වර්ෂය

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී තීරණ අංක ඉ(01)10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 07 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2019.08.27 වැනි දින පැවති පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මාසික රැස්වීමේ තීරණ අංක ඉ (01) 04 යටතේ යෝජනාවකින් සභා සම්මත කර පිළිගන්නා ලද පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කර 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV කොටසේ පළ කරන ප්‍රසිද්ධ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල සාතක මඩු පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 15 වන වගන්තිය ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් අවසර පත්‍ර ගාස්තු 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

අනු අංකය	*විස්තරය*	*ගාස්තුව රුපියල්*
1.	ගවයෙකු සඳහා සාතන අවසර පත්‍ර ගාස්තුව හා ප්‍රදර්ශනය මඩු ගාස්තුව	500 0
2.	ගවයෙකු සඳහා හදිසි සාතන අවසර පත්‍රය	1,500 0
3.	ගවයෙකු සඳහා සාතන අවසර පත්‍රය - ආගමික උත්සව සඳහා	750 0
4.	එළුවෙකු සඳහා සාතන හා ප්‍රදර්ශන මඩු ගාස්තුව	500 0
5.	ගව මස් ප්‍රවාහනය කිරීමේ ගාස්තුව - කිලෝ ග්‍රෑම් 01 ක් සඳහා (බල ප්‍රදේශය තුළ)	20 0
6.	ගව මස් ප්‍රවාහනය කිරීමේ ගාස්තුව - කිලෝ ග්‍රෑම් 01ක් සඳහා (බල ප්‍රදේශයෙන් පිටත)	25 0
6.	එළු මස් ප්‍රවාහනය කිරීමේ ගාස්තුව කිලෝ ග්‍රෑම් 01ක් සඳහා (බල ප්‍රදේශය තුළ)	25 0
7.	එළු මස් ප්‍රවාහනය කිරීමේ ගාස්තුව - කිලෝ ග්‍රෑම් 01ක් සඳහා (බල ප්‍රදේශයෙන් පිටත)	30 0

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඉ(01) 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කීර්ති බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 07 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පාතදුම්බර ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ පළමු තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ දෙවන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	වාහන කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	මැටි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
3.	සී.ඩී., වී.සී.ඩී. වීඩියෝ කැසට් ගීත පටිගත කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
4.	ඔරලෝසු අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
5.	රංගායතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	බෝට්ටු/ඔරු සේවාවන් පවත්වාගෙන යාම (තොටුපළක්)	500 0	750 0	1,000 0
7.	පැල තවානක් පවත්වාගෙන යාම			
8.	මැණික් ඔපදැමීම	500 0	750 0	1,000 0
9.	ඇඳුම් මැසීම	500 0	750 0	1,000 0
31.	වෙස් මුහුණු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඉ(01) 03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඒ. කීර්ති බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2019 නොවැම්බර් මස 07 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පාතදුම්බර ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පහත 1 වන උපලේඛනයේ සඳහන් එක් එක් ව්‍යාපාරය වෙනුවෙන් II වන උපලේඛනයේ I වන තීරුවේ සඳහන් පරිදි 2019 වර්ෂයේ ව්‍යාපාරයේ ආදායම මත II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2020 වර්ෂයට පනවා අය කිරීමට යෝජනා කරමි. තවද, ඒ ව්‍යාපාරය ක්‍රියාත්මක වන පළමුවන අවුරුද්ද 2020 වර්ෂය වන අවස්ථාවක ඒ බද්ද III වන උපලේඛනයේ සඳහන් පරිදි ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව තීරණය කර අය කරනු ලැබිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය II

1. වෙන්දේසි ව්‍යාපාර
2. බ්‍රෝකර් ව්‍යාපාර
3. මුදල් ආයෝජකයින් (මෙරට).
4. මුදල් දීමේ ව්‍යාපාර.
5. මුදල් ණයට දීමේ ව්‍යාපාර
6. මුදල් ආයෝජන ව්‍යාපාර (අපනයන ව්‍යාපාරිකයින්)
7. බඩු උකස් ගැනීමේ ව්‍යාපාර
8. කොන්ත්‍රාත් ව්‍යාපාර
9. සැපයුම් කටයුතු කිරීමේ ව්‍යාපාර (ගොඩනැගිලි, නිමි ඇඟළුම්, ලිපිද්‍රව්‍ය, සුඛෝපභෝගී භාණ්ඩ සහ වෙනත්).
10. රියැදුරු පුහුණු කිරීමේ ව්‍යාපාර
11. විදේශ සංචාර සංවිධානය කිරීමේ ව්‍යාපාර
12. දේශීය සංචාර සංවිධානය කිරීමේ ව්‍යාපාර
13. විදේශ රැකියා නියෝජිත ව්‍යාපාර
14. ලොතරැයි අලෙවි නියෝජිත ව්‍යාපාර
15. රේස් ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාර
16. රක්ෂණ ව්‍යාපාර
17. රක්ෂණ නියෝජිත විකිණීමේ ව්‍යාපාර
18. මෝටර් රථ වාහන විකිණීමේ ව්‍යාපාර
19. ඒජන්සි තැපැල්හල්/ඒජන්සි වෙළඳසැල්
20. රන් ආභරණ විකිණීමේ ව්‍යාපාර
21. කළු ගල්විකිණීමේ ව්‍යාපාර

22. සුඛෝපභෝගී ගොඩනැගිලි උපකරණ ආනයනය කිරීමේ ව්‍යාපාර
23. සුඛෝපභෝගී ගොඩනැගිලි උපකරණ විකිණීමේ ව්‍යාපාර
24. ශාලා කුළියට දීමේ ව්‍යාපාර (උත්සව ශාලා)
25. රා/රට බීම/අරක්කු/ (තැබෑරුම්) විකිණීමේ ව්‍යාපාර
26. රා/රටබීම/ අරක්කු ආදි මධ්‍යසාර ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ ව්‍යාපාර
27. දුරකතන සේවා මධ්‍යස්ථාන (කොමියුනිකේෂන්)
28. යන්ත්‍රෝපකරණ අලෙවි කිරීමේ ව්‍යාපාර
29. අලෙවි නියෝජිත ව්‍යාපාර
30. බටහිර වෛද්‍ය මධ්‍යස්ථාන
31. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන
32. දන්ත ශල්‍යාගාර හා දත් බැඳීමේ මධ්‍යස්ථාන
33. වෛද්‍ය රසායනාගාර (ලේ හා මුත්‍රා පරීක්ෂා කිරීම) ව්‍යාපාර
34. බටහිර ඖෂධ අලෙවි කිරීමේ ව්‍යාපාර
35. ආයුර්වේද ඖෂධ අලෙවි කිරීමේ ව්‍යාපාර
36. ඇස්කණ්නාඩි අලෙවි කිරීමේ ව්‍යාපාර
37. දැව ගබඩා කිරීමේ හා වෙළඳාම් කිරීමේ ව්‍යාපාර
38. උළු, ගල් වැලි ගඩොල් සැපයීමේ හා විකිණීමේ ව්‍යාපාර
39. රථවාහන විකිණීමේ ව්‍යාපාර
40. සැලසුම් ශිල්පි ආයතන
41. විදුලි හා ගෘහ උපකරණ විකිණීමේ ව්‍යාපාර
42. සුළු අපනයන භෝග එකතු කිරීමේ ව්‍යාපාර
43. විදේශ චෙක්පත් හා මුදල් මාරු විකිණීමේ ව්‍යාපාර
44. මුදල් හුවමාරු විකිණීමේ ව්‍යාපාර
45. හෙද සේවා හෝ රෝගි සත්කාර සේවා සපයන ව්‍යාපාර
46. අන්තර් ජාල පහසුකම් සැපයීමේ ව්‍යාපාර
47. පෞද්ගලික හෝ රජයේ බැංකු ව්‍යාපාර
48. පොත් ප්‍රකාශන ව්‍යාපාර
49. සංචාරක සේවා සැපයීමේ ව්‍යාපාර
50. ප්‍රවාහන සේවා සැපයීමේ (කැබ් සර්විස්) ව්‍යාපාර
51. පෞද්ගලික ආරක්ෂක සේවා සැපයීමේ ව්‍යාපාර
52. සාප්පු බඩු අලෙවි කිරීමේ ව්‍යාපාර
53. වැඩසටහන් නිෂ්පාදනය සහ ප්‍රචාරණය කටයුතු කිරීමේ ව්‍යාපාර
54. ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු ගබඩා කර විකිණීමේ ව්‍යාපාර
55. විසිතුරු මසුන් අලෙවි කිරීමේ ව්‍යාපාර
56. රෙදි කැබලි ගබඩා කර විකිණීමේ ව්‍යාපාර
57. විදුලි රැහැන් ඇදීමේ ව්‍යාපාර
58. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ ව්‍යාපාර
59. පරිගණක හා උපාංග විකිණීමේ ව්‍යාපාර
60. රථවාහන අමතර කොටස් අලෙවි කිරීමේ ව්‍යාපාර
61. අටපිරිකර පූජා භාණ්ඩ අලෙවි කිරීමේ ව්‍යාපාර
62. මදුරු දැල් විකිණීමේ ව්‍යාපාර
63. පාවහන් විකිණීමේ ව්‍යාපාර
64. උත්සව භාණ්ඩ සැපයීමේ ව්‍යාපාර
65. උද්‍යාන සැලසුම් කිරීමේ ව්‍යාපාර
66. ලෝහ අත්කම් භාණ්ඩ අලෙවි කිරීමේ ව්‍යාපාර
67. පොල් අලෙවි කිරීමේ ව්‍යාපාර
68. සනීපාරක්ෂක භාණ්ඩ අලෙවි කිරීමේ ව්‍යාපාර
69. වාහන බැටරි අලෙවි කිරීමේ ව්‍යාපාර
70. ජ්‍යොතිෂ්‍ය කටයුතු කිරීමේ ව්‍යාපාර
71. ආයුර්වේද අමාත්‍යාංශයේ ලියාපදිංචි සම්භාහනය කිරීමේ ව්‍යාපාර

72. සෙලියුලර් දුරකතන හා දුරකතන අමතර කොටස් විකිණීමේ ව්‍යාපාර
73. ඒජන්සි වෙළඳසැල් ව්‍යාපාර
74. සත්ත්ව ආහාර අලෙවි කිරීමේ ව්‍යාපාර
75. ළදරු සනීපාරක්ෂක භාණ්ඩ අලෙවි කිරීමේ ව්‍යාපාර
76. පාසල් උපකරණ පොත්පත් හා ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යපාර
77. සිල්ලර බඩු අලෙවි කිරීමේ ව්‍යාපාර
78. ඇසුරම් කරන ලද බඩු (ග්‍රොසරි බඩු) අලෙවි කිරීමේ වෙළඳසැල් ව්‍යාපාර
79. සුපිරි වෙළඳසැල් ව්‍යාපාර
80. සහල් තොග හෝ සිල්ලරට විකිණීමේ ව්‍යාපාර
81. බුලත්, පුවක් විකිණීමේ ව්‍යාපාර
82. කොහු ඉදල් තොග විකිණීමේ ව්‍යාපාර
83. දැව ආනයනය කිරීමේ හා සැපයීමේ ව්‍යාපාර
84. අන්තර්ජාලය මගින් වෙළඳාම් කිරීමේ ව්‍යාපාර
85. ඡායාපිටපත් කිරීමේ රෝනියෝ කිරීමේ, ලැමිනේටින් කිරීමේ හා යතුරුලියනය කිරීමේ ව්‍යාපාර
86. සෙල්ලම් බඩු ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ව්‍යාපාර
87. රූපවාහිනී සම්ප්‍රේෂණ කුළුණු විදුලි සංදේශ සංඥා සම්ප්‍රේෂණ කුළුණු පවත්වාගෙන යාම
88. ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ සම්භාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

උපලේඛනය II

I වැනි තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
01. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක ගෙවිය යුතු බද්ද	නැත
02. රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
03. රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
04. රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
05. රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
06. රු. 1,50,000 වැඩි වන විට ගාස්තුව	3,000 0

උපලේඛනය III

I වැනි තීරුව *ස්ථානයේ වාර්ෂික වටිනාකම*	*II වැනි තීරුව*
1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වගන්තියෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (ii) යටතේ අක්කර බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි උප වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ස්ථීර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ හෙක්ටයාර එකක් හෝ ඊට වැඩි ඉඩම් වලින් පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අනු ප්‍රමාණයන්ගෙන් යුත් අක්කර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා 2020 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන කාර්තු 04 න් අය කර ගැනීමටත් එකී පනතේ 134 (7) වැනි වගන්තිය ප්‍රකාර වාර්ෂික බදු මුදල් 2020 ජනවාරි 31 වැනි දිනට පෙර ගෙවන්නේ නම් එකී මුදල සඳහා සියයට දහයක (10%) වට්ටමක් ද බදු මුදල් කාර්තු වශයෙන් ගෙවන විට එක් එක් කාර්තුවේ පළමු මාසය තුළ ගෙවනු ලැබුවහොත් ගෙවනු ලබන මුදලින් (5%) වට්ටමක් ද ගෙවනු ලැබීම සුදුසු බව යෝජනා කරමි.

උපලේඛනය

ඉඩමේ ප්‍රමාණය	*බදු ප්‍රමාණය වර්ෂයකට*
	රු. ශත
හෙක්ටයාර 05කට අඩු නමුත් හෙක්ටයාර එකකට නොඅඩු අවස්ථාවක	50.00
හෙක්ටයාර 05 ක් හෝ ඊට වැඩිවන සෑම හෙක්ටයාර් එකක් සඳහාම	10.00

11-1272/1

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1) වගන්තියෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (iii) යටතේ සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර දැරණියගල බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමෙන් හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීම සුදුසු වන හෝ සාධාරණ යැයි සැලකෙන වියදමකින් ඒ ඉඩම් යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන අවස්ථාවක සහ එවැනි යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදි කර නොමැති නම්; හෝ

(ආ) ඒ ඉඩම් විධිමත් හෝ නීත්‍ය ලෙස වගා කිරීමට යටත් නොමැති විටක; හෝ

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටත් වී ඇති බිම් ප්‍රමාණය; සහ

ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණයට නියමිත සමානුපාතයට වඩා අඩු සමානුපාතයක් වේ නම් එකී ඉඩම් සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීම සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් ලෙස සැලකෙන ඉඩම් මත 2020 ප්‍රාග්ධන අගයෙන් සියයට එකක් (1%) ක් වාර්ෂික බද්දක් පැනවීමටත් එකී සංවර්ධනය නොකල ඉඩම් මත බදු මුදල 2020 වර්ෂයේ අප්‍රේල් මාසයේ 30 වැනි දිනට දැරණියගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධානය කිරීම සුදුසු බව යෝජනා කරමි.

11-1272/2

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ පළවෙනි උප වගන්තිය අනුව දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (iv) යටතේ විනෝද බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ පළවෙනි උප වගන්තිය ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පැවැත්වෙන විනෝද බදු ආඥාපනතේ විස්තර කර ඇති විනෝද කටයුතු සඳහා ගෙවනු ලබන ඇතුළත් වීමේ ගාස්තුවෙන් 10% ක විනෝද බද්දක් 2020 වර්ෂයට පනවා අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

11-1272/3

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තියෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (v) යටතේ වරිපනම් බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියේ දැරණියගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභාව මගින් දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශ වල පිහිටි සෑම නිශ්චිත දේපළක වාර්ෂික වටිනාකම වශයෙන් 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2020 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියෙන් (1) වැනි උප වගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාර (1) වැනි උපලේඛනයේ සඳහන් දියුණු කළ ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චිත දේපළක වටිනාකමෙන් 8% ක වාර්ෂික වරිපනම් බද්දක් 2020 වර්ෂයේ පනවා අය කිරීමටත්, එකී පනතේ 134 වගන්තියේ (1) වැනි උප වගන්තියේ විධි විධාන යටතේ අංක (ii) උපලේඛනයේ සඳහන් එක් එක් කාර්තුවක් වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද සමාන වාරික හතරකින් දැරණියගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් එසේම වරිපනම් බද්ද 2020 වර්ෂයේ ජනවාරි 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද එකී උපලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල දැරණියගල ප්‍රාදේශීය සභාවට ගෙවන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් සියයට පහක (5%) ක වට්ටමක්ද ලබා දීමට සුදුසු බව යෝජනා කරමි.

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාර, කෑගල්ල ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක සී/4 හා 1968.07.01 දිනැති ලිපියෙන් අනුමත කළ පහත සඳහන් දියුණු ප්‍රදේශ
1. දැරණියගල නගර ප්‍රදේශ දෙහිඕවිට නූරි පාරේ සැ. 8/9 බෝක්කුවේ සිට 10/3 බෝක්කුව දක්වා පාරේ මැද සිට දෙපසට දම්වැල් 3 බැගින් වූ ප්‍රදේශ
2. විදුහල් ප්‍රදේශ දෙහිඕවිට දැරණියගල ප්‍රසිද්ධ පාරේ විදුහල් හන්දියෙන් කි. මී. 14/1 දරන බෝක්කුව අසල සිට දැරණියගල ලිහිණියගල පාරේ 10 වැනි විදුලි කණුව දක්වා වූ දම්වැල් 38 දිග අඩි 16ක් වූ දුරට එකී පාරේ මැද සිට දෙපසට දම්වැල් 3 බැගින් වූ ප්‍රදේශය තුළ.
3. බෝතොට පාර ප්‍රදේශය දෙහිඕවිට ප්‍රසිද්ධ පාරේ කි. මී. 14/3 හා 14/4 දරන බෝක්කුව අතරින් ආරම්භ බෝතොට පොදු සුසාන භූමිය දක්වා වූ පාරේ දම්වැල් 9යි අඩි 30ක් දුරට හා එම පාරේ මැද සිට දෙපසට දම්වැල් 3 බැගින් වූ ප්‍රදේශය තුළ
4. මියනවිට පාර දැරණියගල මියනවිට පාර ආරම්භයේ සිට 1/2 බෝක්කුව දක්වා (දේවාල අසල පාලම) මැද සිට දම්වැල් 03 බැගින්
05. සිරිවර්ධන මාවත දැරණියගල සිරිවර්ධන මාවතේ ආරම්භයේ සිට එම පාරේ මැද සිට දෙපසට දම්වැල් 03 බැගින් වූ ප්‍රදේශය තුළ

උපලේඛනය ii

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු කාර්තුව	2020 මාර්තු 31 හෝ ඊට පෙර	ජනවාරි 31
දෙවන කාර්තුව	2020 ජුනි 30 හෝ ඊට පෙර	අප්‍රේල් 30
තෙවන කාර්තුව	2020 සැප්තැම්බර් 30 හෝ ඊට පෙර	ජූලි 31
හතරවන කාර්තුව	2020 දෙසැම්බර් 31 හෝ ඊට පෙර	ඔක්තෝබර් 31

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තියෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (vi) යටතේ ඉඩම් විකිණීම මත බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තිය යටතේ දැරණියගල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු යෝජකයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1%කට සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ තැරැව්කරු හෝ අනුයෝජකයා වෙතින් දැරණියගල ප්‍රාදේශීය සභාවට අයකර ගැනීම සුදුසු බව යෝජනා කරමි.

11-1272/5

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වාහන හා සත්ව බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තියේ විධිවිධාන මගින් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (vii) යටතේ වාහන හා සත්ත්ව බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දැරණියගල බල ප්‍රදේශය තුළ පහත උපලේඛන I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙක්ම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අයකිරීමට සුදුසු බව යෝජනා කරමි.

උපලේඛනය

I තීරුව	*II තීරුව*
	රු. ශත
01. මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා ගාස්තුව	25 0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්, කාරය හෝ කරත්තයක් සඳහා	
(අ) වෙළෙඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළෙඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	4 0

ii. පෝරම ගාස්තු :

	රු. ශත
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත්කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
සෑම ඇතකු සඳහා	50 0

02. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

11-1272/6

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා වාහන නැවතුම් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව සම්පාදනය කරන ලද 2010.01.22 දින අංක 1635 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කොට ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (viii) යටතේ වාහන නැවතුම් ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 හා 126 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව සම්පාදනය කරන ලද 2010.01.22 දින අංක 1635 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කොට ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කොට ඇති රථ වාහන නවතා තැබීම්, පාලනය කිරීම හා විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තු දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශය තුළ අනුමත නැවතුම්පලවල රථවාහන නතර කිරීම වෙනුවෙන් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමට සුදුසු බව යෝජනා කරමි.

වාහන වර්ගය	*අය කරනු ලබන ගාස්තුව රු. ශත*
සභාවේ අනුමත ත්‍රීවීල් රථ ගාල්වල නවත්වනු ලබන ත්‍රීවීල් සඳහා වාර්ෂික ගාස්තුව	250 0
මාසික අවසර පත්‍ර ගාස්තුව	200 0
සභාවේ අනුමැතිය ලත් ත්‍රීවීල් හැර අනෙකුත් වාහනවලින් අය කරනු ලබන ගාස්තුව වෑන්, කාර්, ජීප් රථ, කැබ් රථ, ත්‍රිරෝද රථ	30 0
බස්රථ (ලංගම හැර), ලොරි, ටිපර් රථ, ට්‍රේලර් සහිත ට්‍රැක්ටර්, ට්‍රේලර් සහිත වෙනත් වාහන	40 0
වෙනත් මෝටර් රථ	50 0
යතුරු පැදි	20 0

11-1272/7

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් 2001.07.27 දින 1195 අංක දරන ගැසට් නිවේදනයෙන් වැළඳගෙන ඇති 1988.08.23 දින අංක 520/7 දරන පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ විධිවිධාන යටතේ 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (ix) යටතේ ප්‍රචාරක දැන්වීම් ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව දැරණියගල ප්‍රාදේශීය සභාවවිසින් 2001.07.27 දින 1195 අංක දරන ගැසට් නිවේදනයෙන් වැළඳගෙන ඇති 1988.08.23 දින අංක 520/7 දරන පළාත් පාලන නිවාස හා ඉදි කිරීම් ගරු ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ විධිවිධාන ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් වීදියකට, පාරකට , ඇළකට හෝ ඉහළින් පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

උපලේඛනය

විස්තරය	*වර්ග අඩියකට (රුපියල්)*
බැනරයක් මගින් ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය	40 0 (මාසිකව)
ස්ථිර පුවරුවක ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම	50 0 (වර්ෂයක් සඳහා)

11-1272/8

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු 149 වගන්තියෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (x) යටතේ බලපත්‍ර ගාස්තුවක් පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ.බී.ඩබ්.එල්.රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වන දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

යෝජනාව

දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් 2001.07.27 දින 1195 අංක දරන ගැසට් නිවේදනයෙන් වැළඳගෙන ඇති 1988.08.23 දින අංක 520/7 දරන පළාත් පාලන නිවාස හා ඉදි කිරීම් ගරු ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂයේ නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වගන්තිය ප්‍රකාර පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කාර්යය සඳහා යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

අන්තරාදායක ව්‍යාපාර :

උපලේඛනය I

I වැනි තීරුව		*II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
	කර්මාන්තය හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	හෝජනාගාර/හෝටල්	500 0	750 0	1,000 0
02.	තේ කඩ හා කෝපි කඩ	500 0	750 0	1,000 0
03.	ලැගුම්හල්/නවාතැන්පළ	500 0	750 0	1,000 0
04.	බාබර් සාප්පු	500 0	750 0	1,000 0
05.	මස් හෝ මාළු විකිණීම	500 0	750 0	1,000 0
06.	එළවළු විකිණීම	500 0	750 0	1,000 0
07.	පළතුරු විකිණීම	500 0	750 0	1,000 0
08.	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ලොතරැයි අලෙවි කුටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	රෙදි වෙළඳාම	500 0	750 0	1,000 0
12.	මල් පැළ/ආහාර බෝග/ඖෂධ භෝග නිෂ්පාදන හා විකිණීම	500 0	750 0	1,000 0
13.	පොල්තෙල් විකිණීම	500 0	750 0	1,000 0
14.	සංචාරක වෙළඳාම	500 0	750 0	1,000 0
15.	මැෂින් අලෙවිය	500 0	750 0	1,000 0
16.	ආයුර්වේද ඖෂධ අලෙවිය	500 0	750 0	1,000 0
17.	බටහිර ඖෂධ අලෙවිය	500 0	750 0	1,000 0
18.	සිල්ලර වෙළඳාම	500 0	750 0	1,000 0
19.	වඩු මඩුවක්/කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	විද්‍යුත් හෝ ඉලෙක්ට්‍රොනික් උපකරණ අලෙවිය හා අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
21.	සාප්පු බඩු විකිණීම	500 0	750 0	1,000 0
22.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	රස කැවිලි නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
24.	පොල් වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	විසිතුරු භාණ්ඩ වෙළඳාම	500 0	750 0	1,000 0
26.	කඩල, රටකජු, කුළුබඩු පැකට් කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
27.	බුලත් විට තැඹිලි වෙළඳාම	500 0	750 0	1,000 0
28.	ඡායා පිටපත්/දුරකථන සේවා	500 0	750 0	1,000 0
29.	පාවහන් වෙළඳාම	500 0	750 0	1,000 0
30.	පොත්පත් හා ලිපිද්‍රව්‍ය වෙළඳාම	500 0	750 0	1,000 0
31.	බයිසිකල් වෙළඳාම	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
කර්මාන්තය හෝ ව්‍යාපාරයේ ස්වභාවය		*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
32.	උත්සව භාණ්ඩ කුළියට දීම	500 0	750 0	1,000 0
33.	ප්ලාස්ටික් බඩු හා සෙල්ලම් බඩු වෙළඳාම	500 0	750 0	1,000 0
34.	ඔරලෝසු වෙළඳාම හා අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
35.	ලී වෙළඳසැලක්	500 0	750 0	1,000 0
36.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	තොග වෙළඳාම	500 0	750 0	1,000 0
38.	යකඩ බඩු වෙළඳාම	500 0	750 0	1,000 0
39.	ඇස් කණ්ණාඩි වෙළඳාම	500 0	750 0	1,000 0
40.	ඇඳුම් මහන ස්ථානයක්	500 0	750 0	1,000 0
41.	නිමි ඇඳුම් වෙළඳාම	500 0	750 0	1,000 0
42.	වීඩියෝ පට කුළියට දෙන ස්ථානයක්	500 0	750 0	1,000 0
43.	පිඟන් භාණ්ඩ අලෙවිය	500 0	750 0	1,000 0
44.	සහල් වෙළඳාම	500 0	750 0	1,000 0
45.	ඒජන්සි තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අප්‍රසන්නදායක ව්‍යාපාර :

උපලේඛනය I

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
බලය දෙනු ලබන කාර්යය		*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	සුරුට්ටු හා බීඩි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
02.	අවමංගල්‍ය භාණ්ඩ අලෙවිය	500 0	750 0	1,000 0
03.	සත්ව ගොවිපළක් පවත්වාගෙන යාම හා සත්ව ආහාර අලෙවිය	500 0	750 0	1,000 0
04.	රටබීම හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	තීන්ත හා වාර්නිෂ් වර්ග වෙළඳාම	500 0	750 0	1,000 0
06.	ග්‍රෝස් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
07.	රසායනික පොහොර අලෙවිය	500 0	750 0	1,000 0
08.	කරවල වෙළඳාම	500 0	750 0	1,000 0
09.	මස් මාළු වෙළඳාම	500 0	750 0	1,000 0
10.	ශීත කළ මස් මාළු වෙළඳාම	500 0	750 0	1,000 0
11.	බුලත් දුන්කොළ වෙළඳාම	500 0	750 0	1,000 0
12.	බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
13.	රබර් මිලට ගැනීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	පුවක් වේලා සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	මඩ පුවක් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	කපු නූල් සායම් පෙවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :

උපලේඛනය I

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	මෝටර් වාහන සර්විස් කිරීමේ හා අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	රබර් ටුම් ගැස්සවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	පරණ යකඩ බඩු ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	කොන්ක්‍රීට් හා සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
08.	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ආනයනය කරන ලද දැව අලෙවිය	500 0	750 0	1,000 0
10.	හුණු පිළිස්සීම හා රෑස් කිරීම	500 0	750 0	1,000 0
11.	මෝටර් වාහන බෝඩි ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	පොල්තෙල් හා වෙනත් ආහාර සඳහා ද්‍රව්‍ය තෙල් ගබඩා කරන ස්ථාන හා අලෙවි කිරීම	500 0	750 0	1,000 0
13.	ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ඇඹරුම්හලවල්/වී මෝල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

11-1272/9

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (1) වගන්තියෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා, මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (xi) යටතේ කර්මාන්ත බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (i) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරනු ලබන පහත උපලේඛනයේ i තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ ii වන තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට

අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත් එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2020 වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර දැරණියගල ප්‍රාදේශීය සභාවට ගෙවීමට සුදුසු බවට යෝජනා කරමි.

උපලේඛනය I

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
	කර්මාන්තය හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ඉදල් කොහු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
02.	මැටි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
03.	සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
04.	පින්තූර රාමු කිරීම හෝ වීදුරු කැපීම	500 0	750 0	1,000 0
05.	විදුලි උපකරණ අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
06.	හුණුගල් පිළිස්සීම	500 0	750 0	1,000 0
07.	මෝටර් රථ අළුත්වැඩියාව හෝ බෝඩි සෑදීම	500 0	750 0	1,000 0
08.	මෝටර් රථ ටින්කර් වැඩ කිරීම පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
09.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ලී කැටයම් කිරීම	500 0	750 0	1,000 0
11.	කුෂන් වැඩ කිරීම	500 0	750 0	1,000 0
12.	කොහු භාණ්ඩ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
13.	ගඩොල් හා උළු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
14.	තෙල් සිදින ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	කළුගල් කැඩීම හෝ කැබලි කිරීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
16.	අයිස්ක්‍රීම් නිපදවීම	500 0	750 0	1,000 0
17.	ත්‍රීරෝද රථ හා යතුරු පැදි අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
18.	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
19.	දැන්වීම් පුවරු සකස් කිරීම	500 0	750 0	1,000 0
20.	ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	පාපැදි අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
22.	යතුරු පැදි අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
23.	ටයර් ටියුබ් අළුත්වැඩියාව හා වොල්කනයිස් කිරීම	500 0	750 0	1,000 0
24.	පොල් ලී විකිණීම හා පොල් ලී වලින් නිෂ්පාදන කටයුතු	500 0	750 0	1,000 0
25.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
26.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	පරණ පත්තර හා යකඩ එකතු කරන ස්ථානයක්	500 0	750 0	1,000 0
28.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	තේ කොළ නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
30.	රූපලාවන්‍යාගාර පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	හකුරු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	ලෑලි පෙට්ටි හෝ තේ පෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
33.	ෆොටෝ කොපි/ලැමිනේටින්/බයින්ඩින්/දුරකථන ඇමතුම් සාදවන සේවා ස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (1) වගන්තියෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (xii) යටතේ ව්‍යාපාර බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි:

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ 1 වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ 2019 වර්ෂයේ ලැබීම් මත මෙහි පහත උපලේඛනයේ i තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි ii වන තීරුවේ අනුරූප සටහනේ හි නිරූපිත තැනැත්තෙකු එහි ව්‍යාපාර බද්ද 2020 වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර දැරණියගල ප්‍රාදේශීය සභාවට ගෙවීම සුදුසු බව යෝජනා කරමි.

උපලේඛනය

1 වැනි තීරුව	*11 වැනි තීරුව*
2019 වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ආදායම	*ගෙවිය යුතු බද්ද රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	300 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

මෙම ව්‍යාපාර බදු අදාළ වන ව්‍යාපාර :-

01. වෙන්දේසිකරුවන්
02. කොන්ත්‍රාත්කරුවන්
03. උකස් බඩු ගන්නන්
04. රියදුරු පුහුණු ආයතන
05. ප්‍රවාහන නියෝජිතයන්
06. දේශීය/ විදේශීය රැකියා ඒජන්සි පවත්තන්නන්
07. නීතිඥයින්/ නොතාරිස්වරුන්
08. ගණන් පරීක්ෂකවරුන්
09. මිනින්දෝරු කාර්යාල (පුද්ගලික)
10. මූල්‍ය ආයතන හා බැංකු
11. ගෘහ නිර්මාණ ශිල්පීන්
12. රක්ෂණ නියෝජිතයින්

13. වාණිජ හා ග්‍රාමීය බැංකු
14. ස්වර්ණාභරණ වෙළඳාම
15. සම්ප්‍රේෂණ කුළුණු
16. ඉන්ධන පිරවුම්හල්
17. සාත්තු නිවාසයක්, විශේෂඥ වෛද්‍ය සේවා ස්ථානයක්,ශල්‍යාගාරයක්,පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම
18. ආයුර්වේද/ බටහිර වෛද්‍ය ක්‍රමයේ බෙහෙත් ශාලාවක්
19. පෞද්ගලික වෙළඳපළක් හෝ සති පොළක් පවත්වාගෙන යාම
20. මත්පැන් විකිණීම, වයින් ස්ටෝර්ස් එකක් පවත්වාගෙන යාම
21. ඇඟලුම් කම්හලක් පවත්වාගෙන යාම
22. ලී මෝලක් හෝ දැව ගබඩාවක් පවත්වාගෙන යාම
23. යන්ත්‍රානුසාරයෙන් කළු ගල් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
24. ත්‍රිරෝද රථ, යතුරු පැදි,මෝටර් වාහන අළුතින් ගෙන්වා විකිණීම
25. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
26. බැකෝ ලෝඩර් යන්ත්‍ර, බැකෝ යන්ත්‍ර,ඩෝසර් හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර,මාර්ග තලන හා පස් තලන යන්ත්‍ර, ට්‍රැක්ටර් හා ටිපර්, කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
27. වාහන සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
28. වාහන දුම් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
29. පාවිච්චි කරන ලද පා පැදි,යතුරු පැදි,මෝටර් වාහන,විදුලි භාණ්ඩ, හෝ ඒවායේ අමතර කොටස් ගෙන්වා විකිණීම
30. සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම
31. දේපළ වෙළඳාම් ආයතන පවත්වාගෙන යාම
32. උත්සව ශාලා පවත්වාගෙන යාම
33. කුඩා ප්‍රමාණයේ ජල විදුලි බලාගාරය පවත්වාගෙන යාම
34. ලිපි ද්‍රව්‍ය අලෙවිය පවත්වාගෙන යාම
35. ඇස් කණ්ණාඩි වෙළඳාම

11-1272/11

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩාපිටි වෙන් කිරීමේ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (xiii) යටතේ ක්‍රීඩා පිටි වෙන් කිරීමේ ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි:

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වන දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2020 වර්ෂය සඳහා දැරණියගල ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩා පිටි ප්‍රදර්ශන, අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා පෞද්ගලික කාර්යයන් සඳහා වෙන් කරවා ගැනීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු 2020 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

උපලේඛනය 01

දැරණියගල ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා පිටි එක් දිනක් සඳහා වෙන් කිරීම	*දිනකට* *රු. ශ.*
වර්ග අඩි 50 ට අඩු ප්‍රමාණයක් නම් දිනකට	200 0
වර්ග අඩි 50 ට වැඩි ප්‍රමාණයක් නම් වර්ග අඩියකට	3 0
ප්‍රාදේශීය සභාව පිටුපස ඇති ක්‍රීඩා පිටිය	5,000 0

රජයේ අවශ්‍යතා සඳහා නොමිළයේ දෙනු ලබන අතර එසේ කරනු ලබන්නේ අධ්‍යාපන අධ්‍යක්ෂ/දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්/පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් යන අයගේ නිර්දේශය මත පමණි.

11-1272/12

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා බහු කාර්ය ගොඩනැගිල්ලෙහි උත්සව ශාලාව කුලියට ලබාදීම සඳහා ගාස්තු පැනවීම

1987 අංක15 දරන ප්‍රාදේශීය සභා පනතේ දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (xiv) යටතේ බහු කාර්ය උත්සව ශාලාව වෙන් කරවා ගැනීමේ ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව .

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

යෝජනාව

2020 වර්ෂය සඳහා දැරණියගල ප්‍රාදේශීය සභාව සතු බහුකාර්ය ගොඩනැගිල්ලෙහි උත්සව ශාලාව වෙන් කරවා ගැනීම වෙනුවෙන් පහත උප ලේඛනයේ සඳහන් පරිදි ගාස්තු 2020 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

උපලේඛනය 01

ප්‍රමාණය ගාස්තුව

විස්තරය		*ප්‍රමාණය*	*ගාස්තුව*
	විවාහ මංගල උත්සවය හෝ වෙනත් උත්සව කටයුතු සඳහා		
01.	කවර සහිත පුටු	200	
02.	කවර රහිත පුටු	200	
03.	කවර සහිත මේස	20	
04.	බුෆේ මේසය	01	
05.	බුෆේ සෙට් එක සහ ඒ සඳහා අවශ්‍ය සියළුම හැඳි		
06.	අයිස් ක්‍රීම් කප් සහ තේ හැඳි	100	

විස්තරය		*ප්‍රමාණය*	*ගාස්තුව*
07.	කෑම පිඟන්	200	රු.25,000.00
08.	සැලඩ් තහිම්	100	
09.	අළු බඳුන්	20	
10.	32 වීදුරු	100	
11.	34 වීදුරු	100	
12.	37 වීදුරු	100	
උත්සව ශාලාව පිරිසිදු කිරීමේ හා භාණ්ඩ සඳහා සිදු වන අලාභ අයකර ගැනීම වෙනුවෙන් තැන්පත් වශයෙන් ගෙවීම			රු.7,000.00
අනෙකුත් රැස්වීම් සහ උත්සව කටයුතු සඳහා		පැය 04 ක් හෝ ඊට අඩු කාලයක් සඳහා ඊට වැඩිවන සෑම අතිරේක පැයක් සඳහා	රු. 5,200.00 රු.1,000.00 බැගින්

සැ.යු. :

01. රාත්‍රී කාලයේ ශාලාව කුළියට දෙනු ලබන්නේ එය සිදු කිරීමට යෝජිත කරුණ පිළිබඳව සභාපතිතුමා සැහීමකට පත් වන්නේ නම් පමණි.

02. රජයේ අවශ්‍යතා සඳහා නොමිලයේ ශාලාව දෙනු ලබන අතර එසේ කරනු ලබන්නේ අධ්‍යාපන අධ්‍යක්ෂ/දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්/පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් යන අයගේ නිර්දේශය මත පමණි.

11-1272/13

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා ගාස්තු පැනවීම

1987 අංක15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (xv) යටතේ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි:

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව 1523/16 දරන වර්ෂ 2008 වූ ජනවාරි 25 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* ඇ කොටසේ නියමිත ව්‍යාපෘති ලෙස ප්‍රකාශිත පහත සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මෙහි 2 වන උප ලේඛනයේ සඳහන් කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු බවට ඒ සඳහා 1 වෙනි උප ලේඛනයේ සඳහන් පරිදි 2020 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ගාස්තු අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

උපලේඛනය - 1

පරීක්ෂණ ගාස්තුව (වර්ෂ තුනටම අදාළව) අයදුම් පත් ගාස්තු :

මූලික ආයෝජන මුදල	*අය කරන ගාස්තුව* *රු. ශ.*
රු. 250,000 හෝ ඊට අඩු	3,000 0
රු. 250,001 හෝ රු. 5,00,000 දක්වා	3,750 0
රු. 500,001 හෝ රු. 10,00,000 දක්වා	5,000 0
රු. 10,00,001 හෝ ඊට වැඩි	10,000 0
පරිසර බලපත්‍ර ගාස්තු (වසර 03 සඳහා)	4,000.00
පරිසර අයදුම්පත්‍ර ගාස්තුව (නව කර්මාන්ත සඳහා)	100.00
(බලපත්‍ර අළුත් කිරීම සඳහා)	50.00

උපලේඛනය - 2

පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු ක්‍රියාකාරකම් :

1. සියලුම වාහන ඉන්ධන පිරවුම්හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු)
2. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදිත කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යෙදෙන පොල්තෙල් සිඳින කර්මාන්ත
4. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යෙදෙන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදන කිරීමේ කර්මාන්ත
5. වියළි ක්‍රියාවලි සහිත වී මෝල්
6. මාසික නිෂ්පාදිත ධාරිතාව ක්‍රි. ග්‍රෑ. 1000 කට අඩු වන ඇඹරුම්හල්
7. දුම්කොළ වේලීමේ කර්මාන්තය
8. ෂල්ෆර් දුම්ගැසීම සහිත එක් ක්‍රියාවලියකදී නිෂ්පාදන ධාරිතාව ග්‍රෑ. 500 හෝ එයට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
9. කෑමට ගන්නා ලුණු ඇහිරීමේ හා සැකසීමේ කර්මාන්ත
10. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
11. කොන්ක්‍රීට් පෙර සවි කර්මාන්ත
12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදන කිරීමේ කර්මාන්තය
13. දිනකට මෙට්‍රික් ටොන් 20 ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත හුණු පෝරණු
14. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය හෝ සේවකයින් 25 ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
15. සියළු බෙලි කටු ඇඹරීමේ කර්මාන්ත
16. උළු සහ ගඩොල් කර්මාන්ත
17. එක් වරකට එක් බෝර වලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 600 නිෂ්පාදන ධාරිතවයකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරන ද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරනු ලබන කැණීම්
18. දිනකට ඝන මීටර් 50 ට අඩු දැව ඉරුම් ධාරිතාවයක් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්තය හෝ දැව පදම් කිරීම් කර්මාන්ත
19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 05 ට වැඩි 25 ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත
20. නේවාසික කාමර 05 ක් හෝ ඊට වැඩි සහ 20 ට අඩු හෝටල් ආගන්තුක නිවාස හෝ තානායම්
21. වාහනවල වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ නඩත්තු කිරීමේ හා පෙරසවි කිරීමේ කටයුතු සිදු කරන ස්ථාන
22. ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ නඩත්තු කිරීමේ හා සවි කිරීමේ කටයුතු සිදු කරන ස්ථාන
23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලූ පර්යන්ත
24. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථාන
25. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (xvi) යටතේ අයදුම්පත් හා වෙනත් ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව දැරණියගල ප්‍රාදේශිය සභාව විසින් සපයනු ලබන සේවාවන් හෝ පහසුකම් වෙනුවෙන් මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි 2020 වර්ෂය සඳහා ගාස්තු අය කිරීම සුදුසුබව යෝජනා කරමි.

	විස්තරය	*රු. ශත*
01.	ගොඩනැගිලි අයදුම්පත	750 0
02.	ගොඩනැගිලි අනුකූලතා සහතික	1,000 0
03.	ජාතික ගොඩනැගිලි, පර්යේෂණ ආයතනයේ ඉල්ලුම්පත ගාස්තුව	25 0
04.	වීථි රේඛා අයදුම්පත් ගාස්තුව	150 0
05.	වීථි රේඛා සහතික පත් ගාස්තුව	1,000 0
06.	අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා පෝරම ගාස්තු - කොස් ගස් සඳහා	350 0
	කොස් නොවන වෙනත් ගස් සඳහා	250 0
07.	ජල ගිවිසුම් පත්‍ර ගාස්තුව	25 0
08.	දේපළ අයිතිය ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ගාස්තුව	500 0
09.	වෙළඳ බලපත්‍ර/වරිපනම් උධෘත නිකුත් කිරීම (එක් වසරකට)	25 0
10.	ඡායා පිටපත් කිරීමේ ගාස්තු - තනිපිට	5 0
	- දෙපිට	7 0
11.	ජල අයදුම්පත් ගාස්තුව - ගෘහස්ත	150 0
	- වෙළෙඳ	250 0
12.	මිහිදන් කිරීමේ ගාස්තු	100 0
13.	ගොඩනැගිලි අයදුම්පත් කාලය දීර්ඝ කිරීමේ ගාස්තුව (එක් වසරක් සඳහා)	200 0
14.	පිඹුරුපත් අයදුම්පත් ගාස්තු	50 0
15.	පුස්තකාල සාමාජික ගාස්තු - වැඩිහිටි	100.00
	- ළමා	50.00
16.	පුස්තකාල අයදුම්පත්ගාස්තු	25.00
17.	පුස්තකාල සමාජිකත්වය අලුත් කිරීම - වැඩිහිටි	50.00
	- ළමා	25.00
18.	පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු දිනකට - වැඩිහිටි	2.00
	- ළමා	1.00

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ගොඩනැගිලි අයදුම්පත් පරීක්ෂණ ගාස්තු අය කිරීම

1987 අංක15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් 122,126 (vi) හා 126 (viii) වගන්ති යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (xvii) යටතේ ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් 122,126 (vi) හා 126 (viii) වගන්ති යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥාපනතෙහි විධිවිධාන අදාළ වන බල ප්‍රදේශයන්හි ඉඩම් කොටසක ගොඩනැගිලි ඉදිකිරීම්, සැලසුම් පරීක්ෂා කිරීම් ඒ සඳහා ගාස්තු නියම කිරීම ඊට අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම සඳහා දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව, පහත සඳහන් උප ලේඛනය පරිදි 2020 වර්ෂය සඳහා ගාස්තු පනවා අය කිරීමට සුදුසුබව යෝජනා කරමි.

උපලේඛනය

ගෙබිම විශාලත්වය චර්ග මීටර්	*නිවාස සඳහා රු. ශත*	*ව්‍යාපාර සඳහා රු. ශත*
45 ට අඩු	500.00	1,000.00
45 - 90	1,500.00	2,000.00
91-180	2,500.00	3,000.00
181 - 270	3,500.00	4,000.00
271 - 450	4,500.00	6,000.00
451 - 675	5,500.00	8,000.00
676 - 900	6,500.00	10,000.00
901 - 1225	7,500.00	12,000.00
1225 ට වැඩි	7,500.00	12,000.00
	ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම වර්ග මීටර් 90 ක් සඳහාම රු 1,000.00 බැගින්	ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම වර්ග මීටර් 90 ක් සඳහාම රු 1,250.00 බැගින්

2020 වර්ෂයට පිඹුරුපත් අනුමත කිරීමේ ගාස්තු :

පිඹුරුපත් අනුමත කිරීමේ ගාස්තු පර්චස් 06 සිට 20 දක්වා	500.00
පර්චස් 21 සිට 30 දක්වා	700.00
පර්චස් 31 සිට 50 දක්වා	1,000.00
පර්චස් 50 ට වැඩි ඉඩම් සඳහා	1,500.00

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා යන්ත්‍ර සූත්‍ර කුළියට ලබාදීම සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී තීරණ අංක 01 (xviii) යටතේ යන්ත්‍ර සූත්‍ර කුළියට ලබා දීම සඳහා ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, අය කරනු ලබන යන්ත්‍ර සූත්‍ර කුළියට ලබා දීම සඳහා ගාස්තු මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි 2020 වර්ෂයේ සිට පනවා අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

උපලේඛනය

වාහනය/යන්ත්‍රය	*මිළ ගණන රු. ශත*	*කාලය*	*ඉන්ධන*
ලෙලන තලනය	4,500.00	පෙ.ව 8.00 සිට ප.ව 05.00 දක්වා වැඩ කරන සෑම දිනකම	රහිතයි
බැක්හෝ ලෝඩරය -ජේසීබී	2,500.00	මීටර් පැයකට (යාමට ගතවන කාලය සමග)	සහිතයි
කම්පන තලනය	2,500.00	පෙ.ව 8.00 සිට ප.ව.05.00 දක්වා වැඩ කරන සෑම දිනකම	රහිතව
ට්‍රැක්ටර් ජල බවුසරය	2,500.00	එක් වරකට	සහිතයි
ලොරි බවුසරය	5,000.00	එක් වරකට	සහිතයි
ටිපර් රථය කියුබ් 2 .5	10,000.00	පෙ.ව 8.00 සිට ප.ව.05.00 දක්වා වැඩ කරන සෑම දිනකම	සහිතයි
ගලි බවුසරය බල ප්‍රදේශය තුළ බල ප්‍රදේශයෙන් පිටත	 5,000.00 7,000.00	පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා වැඩ කරන සෑම දිනකම	සහිතයි
ඝ.අ.75 ට්‍රෙලරය සමග ට්‍රැක්ටරය ඝ.අ.90 ට්‍රෙලරය සමග ට්‍රැක්ටරය	6,000.00 6,000.00	පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා වැඩ කරන සෑම දිනකම	සහිතයි
ෆ්ලෝ කටර් යන්ත්‍රය	15,000.00	මෙම ගාස්තුව යන්ත්‍රය, සේවකයන් දෙදෙනෙකු සහ ප්‍රවාහනය සමග වන අතර මීට අමතරව HSR හි සඳහන් ගාස්තුවක් සිදුරෙහි විෂ්කම්භය අනුව අමතර ගත යුතුවේ	ජෙනරේටරය රහිත

හට් පුටු හා කොඩි කණු ලබා දීම	*රු. ශත*
රෙදි හට් එකක් සඳහා දිනකට ගාස්තුව	1,000 0
10 x 10 ටකරන් හට් එකක් සඳහා	750 0
කොඩි කණුවක් සඳහා (එල් හැඩැති සහ ජී. අයි)	20 0
ප්ලාස්ටික් පුටුවක් සඳහා	05 0

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා සංවර්ධන අවසර පත්‍ර නිකුත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණ අංක 01 (xix) යටතේ සංවර්ධන අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vi) වගන්ති යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥාපනතෙහි විධි විධාන අදාළ වන බල ප්‍රදේශයන්හි ඉඩම් අනු බෙදීම් කිරීම, අනු බෙදීම් කරන ලද ඉඩම් සංවර්ධනය කිරීම, පවත්වාගෙන යාම විධිමත් කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම ඊට අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම සඳහා දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව, පහත සඳහන් පරිදි ගාස්තු 2020 වර්ෂයට පනවා අය කිරීමට සුදුසුබව යෝජනා කරමි.

I. ඉඩම් අනු කොටස්වලට බෙදීමේ දී පෙරසැරි ගාස්තු අය කිරීම :

බිම් කට්ටි ප්‍රමාණය	*එක් බිම් කට්ටියකට අය කළ යුතු මුදල (මාර්ග කාණු හා පොදු බිම් කොටස් හැර)*
ව. මී. 150 - 300 අතර	රු. 500 0
ව. මී. 301-600 අතර	රු. 400 0
ව. මී. 601-900 අතර	රු. 300 0
ව. මී. 900 ට වැඩි	රු. 200 0

II. මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය සඳහා පෙරසැරි ගාස්තු අය කිරීම :

ඉඩම් අනු බෙදුම් සඳහා :

බිම් ප්‍රමාණය	*අය කළ යුතු මුදල*
වර්ග මීටර 1000 ට අඩු ඉඩම් සඳහා	රු. 2,000 0
වර්ග මීටර 1001-5000 දක්වා	රු. 5,000 0
වර්ග මීටර 5001-10,000 දක්වා	රු. 10,000 0
ව. මී. 10000 සිට වැඩි වන සෑම ව.මී. 1000 කටම	රු. 1,000 0 බැගින්

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥා පනත අනුව ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ දී තීරණ අංක 01 (xx) යටතේ ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත අනුව ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වන වගන්තිය ප්‍රකාරව, 2020 වර්ෂයට දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පැවැත්වෙන විනෝද කටයුතු සඳහා පහත උප ලේඛනයේ සඳහන් පරිදි බලපත්‍ර ගාස්තු 2020 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

උපලේඛනය

විස්තරය	*බලපත්‍ර ගාස්තුව රු.ශත*
තාවකාලික චිත්‍රපටි දර්ශන, මැජික් දර්ශන, සර්කස් දර්ශන, නාට්‍ය දර්ශන සඳහා එක් දිනකට	100.00
ඊට වැඩි සෑම දිනකටම	25.00
සංගීත සංදර්ශනයකට එක් දිනකට	200.00
වාර්ෂික බලපත්‍ර ගාස්තුව	750.00

11-1272/19

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ජල ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1979.05.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසේ අනුමත කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ අංක 27 හි පනවා ඇති ජල අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව, 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණ අංක 01 (xxi) යටතේ ජල ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 1979.05.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසේ අනුමත කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ අංක 27 හි පනවා ඇති ජල අතුරුව්‍යවස්ථාව අනුව 2020 වර්ෂයට අදාළ ජල ගාස්තු පනවා අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

උපලේඛනය

ඒකක ප්‍රමාණය	*ගෘහස්ථ*	*ඒකක ප්‍රමාණය*	*වෙළෙඳ*
01-10	රු. 2.00	01-10	රු. 10 0
11-20	රු. 5.00	11-30	රු. 15.00
21 ට වැඩි	රු. 10.00	31 ට වැඩි	රු. 20.00

01. නව ජල සැපයුම් ලබා දීමේදී ඇස්තමේන්තු මුදල සහ ඇප තැන්පත් මුදල අය කෙරේ.

* ගෘහ කටයුතු සඳහා ඇප තැන්පත් මුදල රු. 500.00
* වාණිජ කටයුතු සඳහා ඇප තැන්පත් මුදල රු. 750.00

02. ජල ගාස්තු නොගෙවීම හෝ අතුරු ව්‍යවස්ථාව කඩ කිරීමක් මත විසන්ධි කරනු ලබන ජල සේවාවන් නැවත ලබා දීම සඳහා රු. 500.00 කි.

03. අනවසරයෙන් ජලය පරිහරණය කරනු ලබන බවට හෙළිවුවහොත් මාස 12ක් ඇතුළත මනු ගතව තිබූ උපරිම ඒකක ගණන මෙන් දස ගුණයක් වූ ඒකක සඳහා වන ගාස්තුව දඩ ගාස්තුවක් ලෙසද ඊට අමතර රු. 2,500 ක අතිරේක ගාස්තුවක්ද අය කෙරේ.

04. පාරිභෝගිකයාගේ ඉල්ලීම මත විසන්ධි කරනු ලබන සේවාවන් නැවත ලබා දීම සඳහා රු. 500 ක් අය කෙරේ.

05. සෑම බිල්පතක් සඳහාම ස්ථාවර ගාස්තු ලෙස රු. 70.00 ක් ද, මීටර් බද්ද ලෙස රු. 30.00 ක් ද අය කෙරේ.

06. රජයේ පාසල් හා ආගමික ස්ථාන ජල ගාස්තු වලින් නිදහස් වේ.

11-1272/20

දැරණියගල ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ආදාහනාගාරය පාවිච්චි කිරීමේදී අය කරන ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 01 (xxiii) යටතේ ආදාහනාගාරය පාවිච්චි කිරීමේ දී ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි

ඒ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව .

2019 ඔක්තෝබර් මස 29 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2020 වර්ෂය සඳහා දැරණියගල ප්‍රාදේශීය සභාව සතු ආදාහනාගාරයේ ආදාහනය කිරීමේ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් පරිදි අය කිරීම සුදුසු බව යෝජනා කරමි:

උපලේඛනය

විස්තරය	*ගාස්තුව*
දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පදිංචිව සිටි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා	රු. 6,500.00
බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා	රු. 7,500.00
කුඹුරුගම ගමෙහි ස්ථිර පදිංචිය ඇති අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා	රු. 3,000.00

11-1272/21